
# දෙසතිය

පුවත් සඟරාව

2024 ඔක්තෝබර්



## බල පෙරළියෙන්

## ජන පෙරළියට

# අභ්‍යවකාශ ආගන්තුකයා

කුඩා ග්‍රහකයක් තාවකාලික ව 'කුඩා සඳක්' බවට පත් වීමට නියමිත බව විදෙස් මාධ්‍ය වාර්තා කර තිබුණා. තාරකා විද්‍යාඥ ආචාර්ය ජෙනිෆර් මිලාඩ් පවසා ඇත්තේ මේ ග්‍රහකය 2024 සැප්තැම්බර් 29 දින කක්ෂයට ඇතුළු වන බවත් පසුව නොවැම්බර් 25 දින ඉන් ඉවතට යනු ඇති බවට පුරෝකථනය කළ බවත්.

2024 PT5 ලෙස විද්‍යාඥයන් හඳුන්වන මේ ග්‍රහකය ප්‍රථම වරට NASAහි Asteroid Terrestrial-Impact Last Alert System úiska සොයා ගෙන ඇත්තේ 2024 අගෝස්තු මස 07 දින. මෙය ආසන්න වශයෙන් මීටර් 10ක දිගින් යුත්, කිලෝමීටර් 3, 474ක විෂ්කම්භයක් ඇති ඉතා කුඩා ග්‍රහකයක්.

"කුඩා හා අඳුරු පාෂාණවලින් සෑදී ඇති නිසා වෘත්තීය මට්ටමේ දුරේක්ෂයකින් එය දැක ගන්න පුළුවන්. ඒ නිසා ඔබට විශාල වේගයකින් තාරකා පසු කර යන, කුඩා තිතක් වගේ දෙයක අපූරු ඡායාරූප අන්තර්ජාලයෙන් බලා ගන්න පුළුවන් වේවි," ආචාර්ය මිලාඩ් පවසන්නේ එවැන්නක්.

2024 PT5 වසර 2055දී නැවත පෘථිවි කක්ෂයට පැමිණෙනු ඇති බවට විද්‍යාඥයන් අනාවැකි පළ කරනවා.

(අන්තර්ජාලය ඇසුරෙන්)

**චන්දන මාරසිංහ**



# දෙසතිය

පුවත් සඟරාව

වෙළුම 46, කලාපය 10,
2024 ඔක්තෝබර්

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2514150

උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

බෙදාහැරීම් සම්බන්ධීකරණය
**ඉරේෂා අබේනායක**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**හිතවත් පාඨකයිනි,**

46 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.


## කවරයේ කතාව





18



14
**ජාත්‍යන්තර දේශපාලනයේ උණුසුම් සටන**



03
**සංඥාවෙන් දෙඩුම**



35
**කියවීම සහ කියවීම**



05
**අලි පරපුරක වතගොත**



40
**දෛවයේ අභියෝගය**

# දෙසතිය
පුවත් සඟරාව

**ඔබ ළඟට ම ගෙන්වා ගන්න. පහත කූපනය පුරවා අප වෙත එවන්න.**

**දෙසතිය**

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..............................

Address ..............................

..............................

ID Number .............................. Tel / Mobile ..............................

Signature .............................. Date ..............................

**දෙසතිය** සඟරා දායකත්වය

දෙසතිය සඟරා දායකත්වය වාර්ෂික / අර්ධ වාර්ෂික ලබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා රු. 3,000.00/ රු. 1,500.00 වටිනාකමකින් යුත් අංකය.............................. හා .............................. දින දරන චෙක්පත / මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් "ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්" නමට ලියා, තැපැල් කාර්යාලය, කම්කරු මග ලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස සඳහන් කර කූපනයද පුරවා මෙම ලිපිනයට එවන්න.

දෙසතිය, මෙහෙයුම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 163, පොල්හේන්ගොඩ, කොළඹ 05

## සත්‍ය වෙනසක අභියෝගය අභියස

නොබෝද (සැප්තැම්බර් 21) ශ්‍රී ලංකා දේශපාලන වංශ කතාවේ නව පිටුවක් පෙරළුණේ මෙරට නව වැනි විධායක ජනාධිපතිවරයා ලෙස ජාතික ජන බලවේගයේ ජනාධිපති ධුර අපේක්ෂක අනුර කුමාර දිසානායක තේරී පත් වීමත් සමග. ඒ, ජනතා ඡන්ද 5,634,915ක් (සමස්ත ප්‍රකාශිත ඡන්දවලින් සියයට 42.31) ලබා ගනිමින්. එය සුවිශේෂ කඩඉමක් ලෙස රටේ බහුතර ජනතාව අර්ථ ගන්වා ඇත්තේ දේශපාලන විශ්ලේෂකයන් ද පෙන්වා දෙන පරිදි 'ප්‍රභූ පැළැන්තියේ දේශපාලනයේ' සිට 'නිර්ප්‍රභූ පැළැන්තියේ දේශපාලනය' වෙත බලය හුවමාරු වී ඇති බවට අදහස් පළ වන හෙයින්. ජාත්‍යන්තරයේ ද නව ජනාධිපතිවරයාට උණුසුම් පිළිගැනීමක් ඇති බව පෙනී යන්නේ ලෝක නායකයන් වෙතින් තවමත් ලැබෙමින් පවතින පැසසුම් හේතුවෙන්.

2024 ජනාධිපතිවරණය සැබවින් ම ලංකා සමාජයේ පමණක් නොව ජාත්‍යන්තරයේ ද උණුසුම් කතාබහක්, සංවාදයක් ගොඩ නගමින් පැවතියේ මැතිවරණ දිනය ප්‍රකාශයට පත් කිරීමටත් පෙර සිට ම. එයට බලපෑ සමාජ, ආර්ථික හා දේශපාලන කාරණා රැසක් ම පැවති බව සැමට නොරහසක්.

උද්ගත වූ අර්ථික ආර්බුදය හමුවේ එයට අසීරුවෙන් හෝ මුහුණදුන් ජනතාව විශ්වාස කළ කාරණා කිහිපයක් තිබුණා. ඒ, මෙවැනි ඉරණමකට රට ගොදුරු වූයේ දුර්වල ආර්ථික කළමනාකරණයත් ජනතා අපේක්ෂා අභිභවා දේශපාලන අරමුණු ඉස්මතු වීමත් නිසා ය යන්න. මෙවැනි පසුබිමක ජනතාව අපේක්ෂා කළේ රටේ දේශපාලන බල හුවමාරුවේ වෙනසක්. එළඹි ජනාධිපතිවරණය එයට මග පෑදුවා ය යන්න සැඟවිය නොහැකි කරුණක්. ඒ අනුව පත් වූ නව ජනාධිපතිවරයා කෙරෙහි පවතින ජනතා විශ්වාසය කඩනොකර රට පාලනය කිරීමේ භාරදූර වගකීමක් ඔහු වෙත පැවරී තිබෙනවා.

ඇති වූ මේ නව දේශපාලන පරිවර්තනීය වෙනස හමුවේ රටේ ආර්ථික ස්ථාවරත්වය හා දේශපාලන ස්ථාවරත්වය ළඟා කර ගන්නා අතරතුර ජනතාවට යහපත් සමාජයක උසස් ජීවන රටාවක් උරුම කර දීම දක්වා ජනාධිපතිවරයා හමුවේ පවතින අභියෝගය ප්‍රසාරණය වනවා. කෙටි කලකින් එය සපුරාලිය යුතු බවට ඇතැම් දේශපාලන හා සිවිල් ජන කණ්ඩායම් බල කරන සෙයක් ද දක්නට ලැබෙනවා. එහෙත් එම අරමුණු වෙත යාම කාලයත් සමග යා යුතු දිගු ගමනක් බව ඔවුන් නොදන්නවා විය නොහැකියි. එහිදී පෙනී යන්නේ රටක් ලෙස ඉදිරියට යා යුතු ගමන, දේශපාලන අරමුණු මත පාට, පක්ෂවලට බෙදී පසුපසට හරවන්නට දරන වෑයමක්.

මේ නිසා 'ශ්‍රී ලංකාව' ලෝකයේ සංවර්ධිත රටක් ලෙස ඔසවා තබන්නටනම් රටේ සියලු දෙනා එක්සත් ව එක්සිත් ව සාමූහික මාවතක ගමන් කිරීමයි කළ යුත්තේ. ඊට තරාතිරමකින් තොර ව කැප කිරීම් කළ යුතු වනවා. එවිට සාමූහික අරමුණු එළ ගැන්වීමෙන් රටේ එක් එක් පුරවැසියාගේ ජීවිත සුබිත මුදිත වීම අනවරතයෙන් ම සිදු වනු ඇති.

- සංස්කාරක -

# සංඥාවෙන් දෙඩුම



**රංගිකා අබේසේකර**

මෙවර ජාත්‍යන්තර සංඥා භාෂා දිනය යෙදී තිබුණේ සැප්තැම්බර් 23 දිනට. බිහිරි පුද්ගලයන්ගේ මානව හිමිකම් පූර්ණ ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා සංඥා භාෂාවේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමට 1958 වසරේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය එම දිනය ප්‍රකාශයට පත් කර තිබෙනවා. මුලදී 'බිහිරි දිනය' ලෙස නම් කළ එම දිනය 2018 වසරේදීයි 'ජාත්‍යන්තර සංඥා භාෂා දිනය' ලෙස නම් කරන්නේ. 'සංඥා භාෂා අයිතීන් සඳහා පෙළගැසෙමු' යන්න 2024 වසරේ තේමාව වුණා.

ලෝක ජනගහනයෙන් 5%කට එනම් මිලියන 430ක ජනතාවකට ඔවුන්ගේ ශ්‍රවණාබාධ (ළමයින් මිලියන 34ක් ඇතුළුව) හේතුවෙන් සන්නිවේදන ගැටලු ඇති වී තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය අනුමාන කරන්නේ 2050 වසර වන විට සෑම පුද්ගලයන් 10 දෙනකුගෙන් එක් අයකුට ශ්‍රවණාබාධ ඇති විය හැකි බවට.

2012 වසරේ ජන හා නිවාස සංගණනයට අනුව එවකට මෙරට සිටි බවට තහවුරු වී ඇති ශ්‍රවණාබාධිත පුද්ගලයන් ගණන 388,000ක්. ශ්‍රී ලංකා බිහිරිවූවන්ගේ සංගමයේ දළ විශ්ලේෂණ අනුව වර්තමානයේ මෙරට 500,000කට අධික කථන සහ ශ්‍රවණාබාධිත ප්‍රජාවක් වාසය කරනවා.

ශ්‍රවණ සහ කථන ආබාධ සහිත ප්‍රජාව ඔවුන්ගේ අදහස් හුවමාරු කරගන්නේ සංඥා භාෂාව භාවිතයෙන්. ලෝක බිහිරිවූවන්ගේ සම්මේලනයට අනුව ලෝකයේ වෙසෙන බිහිරි පුද්ගලයන් ගණන මිලියන 70ක්. ඔවුන්ගෙන් 80%කට ආසන්න ව ජීවත් වන්නේ අඩු සහ මධ්‍යම ආදායම් ලබන රටවල. ඒ අනුව එම ජනතාව විවිධ වූ සංඥා භාෂා 300කට වඩා භාවිත කරනවා. ශ්‍රී ලංකාවේ භාවිත කරන්නේ බ්‍රිතාන්‍ය සංඥා අක්ෂර මාලාව මත පදනම් වූ ශ්‍රී ලාංකා සංඥා භාෂා ක්‍රමයක්.

ශ්‍රවණාබාධ සහිත පුද්ගලයන් සාමාන්‍ය කථන භාෂාවෙන් සන්නිවේදනය කරන අතර ඔවුන්ට ශ්‍රවණාධාර, කර්ණශේරුකා බද්ධ කිරීම් සහ වෙනත් ආධාරක උපාංග භාවිතයෙන් සන්නිවේදනය පහසු කරවීමට පුළුවන්. එහෙත් බිහිරි පුද්ගලයන්ට ගැඹුරු ශ්‍රවණාබාධ ඇති නිසා සන්නිවේදනය සඳහා භාවිත කරන්නේ සංඥා භාෂාව.

ශ්‍රී ලංකාවේ ශ්‍රවණාබාධිත ප්‍රජාව වෙනුවෙන් ඇති එක ම ජාතික සංවිධානය වන්නේ ශ්‍රී ලංකා බිහිරිවූවන්ගේ මධ්‍යම සම්මේලනය. ජේ.බී ප්‍රැන්සිස්ගේ මූලිකත්වයෙන් 1984 වසරේදී ආරම්භ කළ මේ සංවිධානය වර්තමානය වන විට බිහිරි ප්‍රජාවගේ දිස්ත්‍රික් සංවිධාන 20ක්, බිහිරි කාන්තා සංවිධානයක්, බිහිරි තරුණ සංවිධානයක් සහ බිහිරි ක්‍රිකට් සංවිධානයකින් සමන්විත වනවා. සංවිධානයේ මූලික කාර්යභාරය වන්නේ බිහිරි හා ශ්‍රවණාබාධිත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රජාවගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය. ඒ අනුව ඔවුන්ගේ දැක්ම වන්නේ 'සමෘද්ධිමත් ශ්‍රවණාබාධිත ප්‍රජාවක්' යන්න. සංඥා භාෂාව පුහුණු කිරීමේ වැඩසටහන්, ශ්‍රවණාබාධිත ප්‍රජාවට සංඥා භාෂා පරිවර්තන ලබාදීම, ශ්‍රවණාබාධිත ප්‍රජාව වෙනුවෙන් රජයට බලපෑම් කිරීම, ශ්‍රවණාබාධිත ප්‍රජාවට පැන නැගෙන ඕනෑ ම ගැටලුවක් සඳහා පෙනී සිටීම සහ මැදිහත්වීම ඔවුන්ගේ අනෙකුත් කාර්යභාර අතරට අයත්.

අදහස් දක්වන ශ්‍රී ලංකා බිහිරිවූවන්ගේ මධ්‍යම සම්මේලනයේ ප්‍රධාන ලේකම් ඩී. අනිල් ජයවර්ධන, "ලෝකයේ රටවල පවතින්නේ එකිනෙකට වෙනස් වූ සංඥා භාෂා. උදාහරණ ලෙස ශ්‍රී ලංකා සංඥා භාෂාව, ඉන්දියානු සංඥා භාෂාව ලෙස. විශේෂයෙන් බොහෝ අය ජාත්‍යන්තර මුණගැසීම්වලදී ජාත්‍යන්තර සංඥා භාවිත කරනවා. එහිදී වැඩි වශයෙන් භාවිත කරන්නේ ඇමරිකානු සංඥා. බිහිරි හෝ ශ්‍රවණාබාධිත හෝ අයකුට ඕනෑ ම රටකට ගොස් යම්තාක්දුරකට සන්නිවේදනය කිරීමට විශේෂිත හැකියාවක් තිබෙනවා. විශේෂයෙන් සංඥා භාෂාව සැකසී ඇත්තේ රූපරාමු මත පදනම් ව නිසා ඇතැම් සංඥාවල තිබෙන්නේ සමානකම්".

මෙරට විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන්ට ස්ථාපිත කර ඇති පාසල් ගණන 26ක්. සංඥා භාෂාව භාවිත කළ මුල් අවධියට වඩා වර්තමානය වන විට පාසල්වල එම භාෂාව භාවිතයේ වර්ධනයක් දක්නට ලැබෙන බවත් එය සුබවාදී තත්ත්වයක් බවත් ඩී. අනිල් ජයවර්ධන සඳහන් කරන කරුණක්.

ශ්‍රී ලංකා බිහිරිවූවන්ගේ මධ්‍යම සම්මේලනය සංඥා භාෂා කෝෂ වෙළුම 1, 2, 3 ලෙස නිකුත් කර තිබෙනවා. විශේෂයෙන් බිහිරි හා ශ්‍රවණාබාධිත ප්‍රජාව සහ භාෂා පරිවර්තකයන් ඇතුළු පිරිස භාවිත

කරන්නේ මේ සංඥා භාෂා කෝෂය. මැතිවරණ කොමිෂන් සභාව සමග සම්බන්ධ වෙමින් මැතිවරණය හා සම්බන්ධ වචන, සංඥා භාෂාවෙන් භාවිත කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාදීම පිණිස සංඥා භාෂා කෝෂයක් ද නිකුත් කළා. 2024 ජනාධිපතිවරණයේදී එය භාවිත කළ බවත් ආසියාවේ ප්‍රථමවරට සිදු කළ කාර්යයක් නිසා එය විශාල ජයග්‍රහණයක් බවත් ශ්‍රී ලංකා බිහිරිවූවන්ගේ මධ්‍යම සම්මේලනයේ ප්‍රධාන ලේකම් සඳහන් කරනවා.

ශ්‍රවණාබාධිත ප්‍රජාව සමාජයේ සාමාන්‍ය ප්‍රජාව සමග ගැටෙන අවස්ථාවල ඔවුන්ට පුරවැසියන් ලෙස සමාන අයිතිවාසිකම් ලැබෙනවාද යන්න ගැටලුවක්. අනෙකුත් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් හඳුනාගැනීමට හැකියාව ලැබුණත් බිහිරි හා ශ්‍රවණාබාධිත පුද්ගලයන් බැලූ බැල්මට හඳුනාගැනීම අපහසු කාර්යයක්. සාමාන්‍ය පුරවැසියන් ලෙසයි ඔවුන්ගේ බාහිර ස්වරූපය. ඔවුන්ගේ මූලික ම ගැටලුව වන්නේ සාමාන්‍ය ප්‍රජාව සමග සන්නිවේදනය කිරීම. ඕනෑ ම ආයතනයකට ගොස් එහි සේවාව නිසියාකාර ව ලබා ගැනීමට ඔවුන්ට ඇත්තේ අපහසුතාවක්.

මේ ප්‍රජාවට ම අනන්‍ය වූ අධ්‍යාපන රටාවක් නොමැතිකම හේතුවෙන් ගොඩනැගෙන ගැටලු නිසා බිහිරි හා ශ්‍රවණාබාධිත ප්‍රජාවගෙන් 10%ක පිරිසකටයි සාක්ෂරතාව හිමි ව ඇත්තේ. ඒ අනුව උසස් මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමේ අපහසුතාව තිබෙනවා. වඩා වැදගත් වන්නේ ඔවුන්ගේ මුල්කාලීන එනම් 1912 වසරේ ස්ථාපිත වූ අධ්‍යාපන රටාව වර්තමානයට උචිත ලෙස වෙනස් කිරීම. විශේෂයෙන් මේ ප්‍රජාවේ පුද්ගලයකුට අසාධාරණයක් සිදු වූ අවස්ථාවල සන්නිවේදන ගැටලුව ප්‍රබල ව දැනෙනවා. පුහුණු සංඥා භාෂා පරිවර්තකයන් ඇත්තේ 15ක් වැනි අවම පිරිසක්. මෙරට සංඥා භාෂා පරිවර්තකයන් බිහිකිරීමේ විධිමත් ක්‍රමවේදයක් ද දක්නට නොමැති බවයි ශ්‍රී ලංකා බිහිරිවූවන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම්වරයා සඳහන් කරන්නේ.

ශ්‍රී ලංකා බිහිරිවූවන්ගේ මධ්‍යම සම්මේලනයේ සභාපති කේ. කේ බ්‍රයන් සුසන්ත සඳහන් කරන්නේ මාර්ගගත ක්‍රමය ඔස්සේ සංඥා භාෂාව පුහුණු කිරීමේ වැඩසටහන් සිදුකිරීමත් රාජ්‍ය ආයතන නිලධාරීන්ට සංඥා භාෂාව පුහුණු වැඩමුළු පැවැත්වීමත් අවශ්‍යතාව ඇති ඕනෑ ම අයකුට ජාතික අධ්‍යාපන ආයතනයේ සංඥා භාෂා ඩිප්ලෝමාවක් හැදෑරීමට අවස්ථාව සලසා ඇති බවත්. ශ්‍රී ලංකා බිහිරි වූවන්ගේ මධ්‍යම සම්මේලනයේ විසි වසරක උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස වයස අවුරුදු 50ට අඩු



සභාපති
**කේ.කේ. බ්‍රයන් සුසන්ත**



ප්‍රධාන ලේකම්
**ඩී අනිල් ජයවර්ධන**



සංඥා භාෂා පරිවර්තක
**කේ. ජනක රණසිංහ**

> මේ ප්‍රජාවට ම අනන්‍ය වූ අධ්‍යාපන රටාවක් නොමැතිකම හේතුවෙන් ගොඩනැගෙන ගැටලු නිසා බිහිරි හා ශ්‍රවණාබාධිත ප්‍රජාවගෙන් 10%ක පිරිසකටයි සාක්ෂරතාව හිමි ව ඇත්තේ. ඒ අනුව උසස් මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමේ අපහසුතාව තිබෙනවා. වඩා වැදගත් වන්නේ ඔවුන්ගේ මුල්කාලීන එනම් 1912 වසරේ ස්ථාපිත වූ අධ්‍යාපන රටාව වර්තමානයට උචිත ලෙස වෙනස් කිරීම. විශේෂයෙන් මේ ප්‍රජාවේ පුද්ගලයකුට අසාධාරණයක් සිදු වූ අවස්ථාවල සන්නිවේදන ගැටලුව ප්‍රබල ව දැනෙනවා.

ශ්‍රවණාබාධිත ප්‍රජාව වෙනුවෙන් සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර ලබා ගැනීමට හැකියාව ලැබුණු බව ඩී. අනිල් ජයවර්ධන සඳහන් කරනවා. මෙවර ජනාධිපතිවරණයේදී මැතිවරණ තොරතුරු හා ඡන්ද ප්‍රතිඵල සංඥා භාෂාවෙන් ලබා දීම ද තවත් විශේෂිත කාරණයක්.

ඩී. අනිල් ජයවර්ධන පවසන්නේ බිහිරි හා ශ්‍රවණාබාධිත ප්‍රජාව මුල් කාලයේ ස්කයිප් තාක්ෂණය ඔස්සේ සන්නිවේදනය සිදු කළ බවත් ඉන්පසුව imo ජංගම යෙදවුම සහ වර්තමානය වන විට දේශීය සහ අන්තර්ජාතික වශයෙන් සන්නිවේදන කාර්යය ඉටු කර ගැනීමට whatsapp යෙදවුමේ වීඩියෝ ඇමතුම් තාක්ෂණය භාවිත කරන බවත්. මෙහිදී සංඥා භාෂාව භාවිත වන්නේ රූප මාධ්‍යයෙන් වන නිසා සන්නිවේදන කාර්යය ඉතා පහසු කරවන්නක්. මේ තාක්ෂණය සංඥා භාෂාව ඉගෙන ගැනීමට සහ ඉගැන්වීමට යොදා ගන්නා අතර විශේෂයෙන් ඇතැම් රටවල සංඥා වචන මාලාව අධ්‍යයනය කිරීමට ජංගම යෙදවුම් (App) සකසා තිබෙන බවත් මාතර දිස්ත්‍රික් බිහිරිවූවන්ගේ සංවිධානය ශ්‍රී ලංකාවේත් එවැනි යෙදවුමක් නිර්මාණය කර තිබෙන බවත් ඔහු සඳහන් කරනවා.

බිහිරි හා ශ්‍රවණාබාධිත ප්‍රජාව වෙනුවෙන් 2008 වසරේදී ශ්‍රී ලංකා බිහිරිවූවන්ගේ මධ්‍යම සම්මේලනයේ මැදිහත්වීමෙන් සංඥා භාෂා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳ අදහස් දක්වන ඩී. අනිල් ජයවර්ධන; "2008 වසරේදී අප සංඥා භාෂා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. එහි අන්තර්ගත ව ඇත්තේ බිහිරි හා ශ්‍රවණාබාධිත ප්‍රජාවගේ අධ්‍යාපන අවශ්‍යතාව, රැකියා අවශ්‍යතාව, සන්නිවේදන ගැටලු, සමාජමය කාරණා සහ අයිතිවාසිකම් සහිත පිළිගැනීමට ලක් වන, යමක් කළ හැකි පිරිසක් ලෙස සමාජගත කිරීමට අවස්ථාව සලසා ගැනීම ආදිය පිළිබඳ ව. 2010 වසරේදීත් ඊට පසු අවස්ථා දෙකකදීත් ඒ සඳහා කැබිනට් අනුමැතිය හිමි වුවත් එය පාර්ලිමේන්තුවෙන් සම්මත නොවීම නිසා භාෂා කෙටුම්පත පනතක් බවට පත් කිරීමට අපට හැකියාවක් ලැබුණේ නැහැ. මේ නිසා ඊට කඩිනම් පියවර ගන්නා ලෙස අප රජයෙන් ඉල්ලා සිටිනවා."

මේ අනුව බිහිරි හා ශ්‍රවණාබාධිත ප්‍රජාවටත් සමානාත්මතාව සහිත ව ස්වෝත්සාහයෙන් ක්‍රියා කළ හැකි සාමාජීය පරිසරයක් නිර්මාණය කර දීම සහ ඔවුන්ට සහයක් වීමයි සාමාන්‍ය ප්‍රජාවගේ සහ රජයේ වැයම විය යුත්තේ

(විශේෂ ස්තුතිය; සංඥා භාෂා පරිවර්තක කේ. ජනක රණසිංහ මහතාට)

# අලි පරපුරක වතගොත

**රංගිකා අබේසේකර**


> ශ්‍රී ලංකාවේ වනඅලි ගහනයේ සංයුතිය පිළිබඳ ව එනම් පැතිරීම, අලි සහ දළ ඇතුන් අතර අනුපාතය, ගැහැනු හා පිරිමි සතුන්ගේ අනුපාතය, පැටවුන් මෙන් ම වැඩිහිටි හා මහලු සතුන්ගේ අනුපාතය, නිරෝගී හා රෝගී හෝ තුවාල හෝ සහිත සතුන් කොපමණ සිටිනවාද යන්න පිළිබඳ විධිමත් වාර්තාවක් සකස් කිරීමට අවශ්‍ය දත්ත එක්රැස් කිරීම මේ සමීක්ෂණයේ අරමුණක්. මෙහිදී පුද්ගලික භාරකාරත්වය සහිත ලියාපදිංචි කර ඇති අලි ඇතුන් ඇතුළත් වන්නේ නැහැ.


වනජීවීන් සංරක්ෂණයේදී හා කළමනාකරණයේදී ඒ ඒ සතුන්ගේ ගහනය පිළිබඳ නිවැරදි අවබෝධයක් තිබීම වැදගත්. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව දෙවැනි වරටත් දීප ව්‍යාප්ත ව වනඅලි සමීක්ෂණයක් සිදු කළේ එම අරමුණින්. ඒ, 2024 අගෝස්තු මස 17 සිට 19 දින දක්වා දෙදිනකදී මධ්‍යස්ථාන 3150ක් ආශ්‍රයෙන් හා නිලධාරීන් 7000ක් නිරීක්ෂණ කාර්යයෙහි යොදවමින්. මීට පෙර දීප ව්‍යාප්ත වනඅලි සමීක්ෂණයක් 2011 වසරේදී සිදු කර තිබෙනවා.

මෙහිදී සංගණන කාර්යයක් සිදු වන්නේ නැහැ. සංගණනයකදී සිදුවන්නේ සංඛ්‍යාත්මක ගණනය කිරීමක්. එහෙත් සමීක්ෂණයේදී ඊට ඔබ්බට ගිය කරුණු රැස් කිරීමක් සිදුවනවා. මේ පිළිබඳ අදහස් දක්වන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (රක්ෂිත ප්‍රදේශ කළමනාකරණ) මංජුල අමරරත්න; ''2011 සහ 2024 වර්ෂ දෙකේදී ම වනඅලි සමීක්ෂණයට යොදාගත්තේ වියළි කාලයේදී ජල ප්‍රභව ආශ්‍රිත ව ඍජු ව නිරීක්ෂණය කළ හැකි වනඅලි නිරීක්ෂණ ක්‍රමය (Water Hole Count). විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත ජල මූලාශ්‍ර 3500ක ස්ථානගත වෙමින් එම ජලමූලාශ්‍ර වෙත පැමිණෙන අලි ඇතුන් දළ වශයෙන් ගණනය කිරීමයි මේ ක්‍රියාවලියේදී සිදු කෙරෙන්නේ. වනාන්තරවල වෙසෙන සියලු ම වනඅලි මේ ගණනය කිරීම්වල නැහැ. එහෙත් වැඩි සංඛ්‍යාවක් මේ සමීක්ෂණයට ඇතුළත් වනවා.''

වනඅලි සමීක්ෂණයක් සිදු කිරීම ආරම්භ කරන්නේ මාස කිහිපයකට පෙර සිට. ඒ අනුව වනඅලි ගැවසෙන ප්‍රදේශවල ඔවුන් ජල ප්‍රභව භාවිත කරන්නේ කෙසේද යන්න මෙහිදී නිරීක්ෂණය කෙරෙනවා. අධ්‍යක්ෂ මංජුල අමරරත්න සඳහන් කරන්නේ ශ්‍රී ලංකාවට වර්ෂාව අවම වශයෙන් ලැබෙන කාලසීමාව මේ සඳහා යොදාගන්නා බවත් විශේෂයෙන් අගෝස්තු සහ සැප්තැම්බර් මස මුල්භාගය ඊට සුදුසු ම කාලය බවත්.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ සමීක්ෂණ කාර්යය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පරිසර සංවිධාන, විශ්වවිද්‍යාල වැනි රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා සංවිධානවල සහය ලබාගෙන තිබෙනවා. විශේෂයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අලි සමීක්ෂණය සඳහා සම්බන්ධ වීම ඔවුන්ගේ අධ්‍යයන කාර්යයේ කොටසක් ලෙස සලකන බවයි මංජුල අමරරත්න සඳහන් කරන්නේ. වනඅලින්ගේ වැව් ආශ්‍රිත හැසිරීම පිළිබඳ නිවැරදි තොරතුරු ඇත්තේ ගම්වාසීන් සතු ව නිසා ගම්වාසීන්ගේ සහයෝගය මේ කාර්යයට ඉතා වැදගත් වී තිබෙනවා.

අදහස් දක්වන අධ්‍යක්ෂ මංජුල අමරරත්න; ''ශ්‍රී ලංකාවේ වනඅලි ගහනයේ සංයුතිය පිළිබඳ ව එනම් පැතිරීම, අලි සහ දළ ඇතුන් අතර අනුපාතය, ගැහැනු හා පිරිමි සතුන්ගේ අනුපාතය, පැටවුන් මෙන් ම වැඩිහිටි හා මහලු සතුන්ගේ අනුපාතය, නිරෝගී හා රෝගී හෝ තුවාල හෝ සහිත සතුන් කොපමණ සිටිනවාද යන්න පිළිබඳ විධිමත් වාර්තාවක් සකස් කිරීමට අවශ්‍ය දත්ත එක්රැස් කිරීම මේ සමීක්ෂණයේ අරමුණක්. මෙහිදී පුද්ගලික භාරකාරත්වය සහිත ලියාපදිංචි කර ඇති අලි ඇතුන් ඇතුළත් වන්නේ නැහැ.''





1993 වසරේදීත් වනඅලි සමීක්ෂණයක් පවත්වා තිබෙනවා. එහෙත් මේ සමීක්ෂණය සඳහා උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ ඇතුළත් ව නැහැ. එම කාලසීමාවේ පැවැති යුදමය වාතාවරණය එයට හේතු වී තිබෙනවා. 1993 වසරට සාපේක්ෂ ව මෙවර නිරීක්ෂණ මධ්‍යස්ථාන සංඛ්‍යාවේ ද අඩුවක් පෙන්නුම් කරන බවයි අධ්‍යක්ෂ මංජුල අමරරත්න පෙන්වා දෙන්නේ. 1993 සමීක්ෂණයට අමතර ව 2004 වර්ෂයේදී පුත්තලම, අනුරාධපුරය, කුරුණෑගල, වවුනියාව හා මන්නාරම යන ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් සහ 2008 වසරේදී පොළොන්නරුව හා ත්‍රිකුණාමලය ප්‍රදේශවල සමීක්ෂණ සිදු කර තිබෙනවා. 2011 වසරේදී ප්‍රථමවරට දීප ව්‍යාප්ත ව පැවැත් වූ වනඅලි සමීක්ෂණයේදී නිරීක්ෂණයට ලක් වූ අලි ඇතුන් ගණන 5879ක්.

2024 වනඅලි සමීක්ෂණය ද ඇතුළත් ව මේ සියලු සමීක්ෂණ සඳහා යොදා ගත් විද්‍යාත්මක ක්‍රමවේදය වන්නේ ජල මූලාශ්‍ර ආශ්‍රිත සමීක්ෂණ ක්‍රමය (Water Hole Count). තාක්ෂණයේ දියුණුවත් සමග ප්‍රාථමික සමීක්ෂණ ක්‍රමවේදය වෙනුවට නවීන ක්‍රමවේද රැසක් ලෝකයේ භාවිත වනවා. ශ්‍රී ලංකා තරුණ සත්ත්වවේදීන්ගේ සංගමයේ සභාපති ශෝසිත ලියනගේ පවසන්නේ ලෝකයේ විශාලතම අලි ගහනය වාර්තා වන අප්‍රිකානු වනාන්තරවල අලි සමීක්ෂණ සඳහා ප්‍රධාන වශයෙන් Aerial Survey යොදාගන්නා බව. මේ ක්‍රමවේදයේදී ගුවන්යානා, ඩ්‍රෝනයානා සහ චන්ද්‍රිකා තාක්ෂණය ප්‍රධාන වශයෙන් භාවිත කරනවා. ඊට අමතර ව Acoustic Survey (ධ්වනි සමීක්ෂණය) සහ Dung Transects වැනි ක්‍රමවේද ඔස්සේ ද විවිධ රටවල සමීක්ෂණ සිදු කරන අතර ඔහු අවධාරණය කරන්නේ ලෝකයේ සෑම පරිසර පද්ධතියකට ම එම ක්‍රමවේද යොදාගැනීමේ හැකියාවක් නොමැති බව. ඒවායෙහි නිරවද්‍යතාව හා කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ගැටලු පැවතීමයි එයට හේතුව. නවීන තාක්ෂණය මුසු වූ මේ නවීන ක්‍රමවේද ශ්‍රී ලංකාවේ භාවිත කිරීම අසීරු කරුණක්. මෙරට විවෘත වනාන්තර නොතිබීම නිසා ඉහළින් නිරීක්ෂණ කාර්යය සිදුකිරීමට බාධා පැමිණීම ඊට හේතුව වන බවයි අධ්‍යක්ෂ මංජුල අමරරත්න ප්‍රකාශ කරන්නේ.

2024 දීප ව්‍යාප්ත වනඅලි සමීක්ෂණයේ කාර්යභාරය පිළිබඳ අදහස් දක්වන ඔහු; "ශ්‍රී ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 2/3ක ම වනඅලි ජීවත් වනවා. මෙහිදී වල්අලි සංඛ්‍යාව වැදගත් වන්නේ නැහැ. ඒ, මෙය සංගණනයක් නොවන නිසා. ඉපදීමේදී සතුන්ගේ ස්ත්‍රී පුරුෂ අනුපාතය 1:1ක්. එය ඉතා වැදගත් සාධකයක්. වනඅලි-මිනිස් ගැටුම හේතුවෙන් ඇතැම් පිරිමි සතුන් විශාල ලෙස මිය යනවා. මේ සමීක්ෂණයේදී සොයා බලන තවත් වැදගත් කරුණක් වන්නේ වනඅලින්ගේ ගහන සංයුතිය. විශේෂයෙන් සමීක්ෂණයේදී තරුණ සතුන් හා වැඩිහිටි සතුන් කොපමණ ද?, පැටවුන් සහ ළදරු පැටවුන් කොපමණ ද? යන්නත් සොයා බැලෙනවා. තරුණ සතුන් වැඩි වශයෙන් සිටී නම් අනාගත වනඅලි ගහනය පිළිබඳ කරුණු අනාවරණය කිරීමේ අවස්ථාව ලැබෙනවා. ඒ අනුව අනාගතයේදී වැඩිහිටි සතුන් මිය ගියත් පැටවුන් සහ තරුණ සතුන්ගේ පැවැත්මත් සමග නිශ්චිත කාලයකදී වනඅලි ගහනය අනතුරට ලක් නොවනු ඇති බවටත් ශ්‍රී ලංකාවේ වනඅලි ගහනය වර්ධනය වී තිබෙනවා ද? අඩු වී තිබෙනවා ද? නිශ්චිත මට්ටමකට පවතී ද? යන්නත් ඉන් අනාවරණය කර ගැනීමට හැකි වනු ඇති."

මේ සමීක්ෂණය සිදුකිරීමේදී විවිධ ගැටලුවලට මුහුණපා තිබෙනවා. වලසුන්ගෙන් සිදුවුණු බාධා එහිදී කැපී පෙනෙන්නක්. එහෙත් සමීක්ෂණය සාර්ථක ව අවසන් කිරීමට ඔවුන්ට හැකි වී තිබෙනවා. මේ අනුව වනඅලි සමීක්ෂණය මෙරට තර්ජනයට ලක්වී ඇති වනඅලි සම්පත ආරක්ෂා කිරීමට ලැබුණු මහගු අවස්ථාවක් ලෙස හඳුන්වන්න පුළුවන්.

තරුණ සතුන් වැඩි වශයෙන් සිටී නම් අනාගත වනඅලි ගහනය පිළිබඳ කරුණු අනාවරණය කිරීමේ අවස්ථාව ලැබෙනවා. ඒ අනුව අනාගතයේදී වැඩිහිටි සතුන් මිය ගියත් පැටවුන් සහ තරුණ සතුන්ගේ පැවැත්මත් සමග නිශ්චිත කාලයකදී වනඅලි ගහනය අනතුරට ලක් නොවනු ඇති බවටත් ශ්‍රී ලංකාවේ වනඅලි ගහනය වර්ධනය වී තිබෙනවා ද? අඩු වී තිබෙනවා ද? නිශ්චිත මට්ටමකට පවතී ද? යන්නත් ඉන් අනාවරණය කර ගැනීමට හැකි වනු ඇති.

# Mපොක්ස් වෛරසය



බිනූ දිලාරා ගමගේ

Mපොක්ස් වෛරසය මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය නම් කළේ රෝගයේ තීව්‍රතාවේ වැඩිවීමක් සහ මරණ අනුපාතිකය වැඩිවීමට ඇති අවදානම පිළිබඳ සැලකිලිමත් වෙමින්. රෝගීන් කල් ඇති ව හඳුනා ගැනීම, හඳුනා ගැනීමෙන් පසුව රෝගීන් වෙන් කර අවශ්‍ය ප්‍රතිකාර ලබා දීම සහ රෝගය තහවුරු කිරීම යන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ගෝලීය මට්ටමින් ඔවුන් (WHO) ලබා දෙනවා.

කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය ඇතුළු මධ්‍යම හා බටහිර අප්‍රිකානු කලාපයේ ශීඝ්‍රයෙන් පැතිරී යන නව Mපොක්ස් වෛරසය (MPXV) ජාත්‍යන්තර අවධානය ලක් කළ යුතු මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් බවට 2024 අගෝස්තු 14 දින දෙවැනි වරටත් ප්‍රකාශයට පත් කරනු ලැබුවා. ඒ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජෙනරාල් වෛද්‍ය Tedros Adhanom Ghebreyesus විසින්. මේ පිළිබඳ සැලකිලිමත් වෙමින් Mපොක්ස් වෛරසය මෙරට ව්‍යාප්ත වීම වැළැක්වීමට පූර්ව සූදානම සඳහා ඊට අදාළ ව විධිමත් සැලැස්මක් සහිත චක්‍රලේඛයක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අගෝස්තු මස 20 දින සෞඛ්‍ය සේවා ආයතනවලට නිකුත් කරනු ලැබුවා.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් අනුව රටවල් අතර භාණ්ඩ හුවමාරුව හා සංක්‍රමණ සීමා නොකර ගුවන් තොටුපොළෙන් මෙරටට ඇතුළු විය හැකි Mපොක්ස් ආසාදිත රෝගීන් හඳුනා ගැනීමට අවශ්‍ය ආවේක්ෂණ පද්ධතිය (Surveillance) ශක්තිමත් කිරීමටත් අවශ්‍යතාව පරිදි PCR පරීක්ෂණ සිදු කිරීමටත් එහිදී පියවර ගෙන තිබෙනවා. Mපොක්ස් රෝගීන් වාර්තා වීමක් සිදු වුවහොත් ඊට පහසුකම් සහිත කොළඹ බෝවන රෝග විද්‍යායතනය (IDH) ප්‍රතිකාර සඳහා වෙන්කර තිබෙන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය පාලිත මහීපාල සඳහන් කරනවා.

අදහස් දක්වන විශේෂඥ වෛද්‍ය පාලිත මහීපාල; "Mපොක්ස් වෛරසය මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය නම් කළේ රෝගයේ තීව්‍රතාවේ වැඩිවීමක් සහ මරණ අනුපාතිකය වැඩිවීමට ඇති අවදානම පිළිබඳ සැලකිලිමත් වෙමින්. රෝගීන් කල් ඇති ව හඳුනා ගැනීම, හඳුනා ගැනීමෙන් පසුව රෝගීන් වෙන් කර අවශ්‍ය ප්‍රතිකාර ලබා දීම සහ රෝගය තහවුරු කිරීම යන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ගෝලීය මට්ටමින් ඔවුන් (WHO) ලබා දෙනවා. නමුත් අනෙකුත් කලාපවලට සාපේක්ෂ ව ආසියාතික කලාපයෙන් මේ රෝගය වාර්තා වීම ඉතාමත් සුළු වශයෙන් පවතින නිසා රෝගය පිළිබඳ අනියත බියක් ඇති කර ගත යුතු නැහැ. Mපොක්ස් රෝගයට හේතුවන Mපොක්ස් වෛරසය ආසාදිත පුද්ගලයකුගේ දේහ තරල හෝ තුවාල ස්පර්ශ වීමෙන් හෝ දිගු කාලයක් ශ්වසන බිඳිතිවලට නිරාවරණය වීමෙන් පමණක් තවත් පුද්ගලයකුට වැළඳීමට හැකියාව පවතින නිසා රෝගය පැතිරීමේ අවදානම පවතින්නේ අඩු මට්ටමක."

සතුන්ගෙන් මිනිසුන්ට සම්ප්‍රේෂණය වී පසුව මිනිසුන් අතර බෝවීමේ හැකියාවක් Poxviridae කුලයේ Orthopoxvirus ප්‍රභේදයට අයත් වසූරිය (smallpox හෙවත් variola), cowpox, horsepox, camel-pox, vaccinia (එන්නත් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා) වෛරස පවුලේ Mපොක්ස් වෛරසය සතු ව පවතිනවා. වෛරසය ආසාදිත වඳුරන්, මීයන් සහ ලේනුන් වැනි ක්ෂීරපායී සතුන් සපාකෑමෙන්, සීරීම් හෝ තුවාල සිදු කිරීමෙන්, සුරතල් කිරීමෙන්, දඩයම් කිරීමෙන්, ආහාරයට ගැනීමෙන්, මළකුණු ස්පර්ශ වීමෙන් මේ රෝගය සතුන්ගෙන් මිනිසුන්ට සම්ප්‍රේෂණය වෙනවා. දැනට මේ වෛරසයට අයත් ප්‍රධාන ප්‍රභේද දෙකක් Clade I සහ Clade II යනුවෙන්

හඳුනා ගන්නට පුළුවන්. කැනඩාවේ විනිපෙග්හි මැනිටෝබා විශ්වවිද්‍යාලයේ වෛරස් විද්‍යාඥයකු වන ජේසන් කින්ඩ්‍රචුක් පවසන්නේ දශක ගණනාවක් තිස්සේ කොංගෝ වනාන්තර ප්‍රදේශ ආශ්‍රිත ග්‍රාමීය ප්‍රදේශවල Clade I වෛරසය දකින්නට ලැබෙන අතර එය Clade Ib ප්‍රභේදය හඳුනා ගැනීමෙන් පසුව Clade Ia යනුවෙන් නම් කරන ලද බව. සත්ත්වයන් පිළිබඳ සිදු කරන ලද අධ්‍යයනවලින් පෙන්නුම් කරන පරිදි Clade II ප්‍රභේදයට වඩා Clade I ප්‍රභේදය වැඩි අවදානමක් සහිත වන අතර මේ වනවිට අප්‍රිකානු කලාපයේ බොහෝ රටවලට ආසාදනය වී ඇත්තේ වැඩි අවදානමක් සහිත Clade Ib නව ප්‍රභේදය.

1958 වසරේදී පර්යේෂණ සඳහා යොදාගත් වඳුරන්ගෙන් Mපොක්ස් වෛරසය පළමු වරට ඩෙන්මාර්කයේදී සොයා ගැනුණා. මිනිසකුට ආසාදනය වීමක් පළමුවෙන් වාර්තා වූයේ 1970 වසරේදී කොංගෝ රාජ්‍යයේදී. ඒ, මාස 09ක් වයසැති පිරිමි ළමයකුට. 1980 වසරේදී වසූරිය තුරන් කිරීමෙන් පසුව මධ්‍යම සහ නැගෙනහිර අප්‍රිකාවේ (Clade I) සහ බටහිර අප්‍රිකාවේ (Clade II) Mපොක්ස් වෛරසය වරින් වර වාර්තා වී තිබෙනවා. 2003 වසරේදී ආනයනය කරන ලද සතුන් මාර්ගයෙන් Clade II Mපොක්ස් වෛරස ආසාදනය වීමක් ඇමරිකා එක්සත් ජනපදයෙන් හඳුනා ගන්නා අතර 2005 වසරේ සිට කොංගෝ රාජ්‍යයේ වසරකට දහස් ගණනින් වෛරසය ආසාදනය වෙනවා. 2022-2023 වසරවලදී වෛරසයේ Clade IIb ප්‍රභේදය නිසා ගෝලීය වසංගත තත්ත්වයක් දක්වා එය වර්ධනය වූ අතර එක්සත් රාජධානිය, ඇමරිකාව, බ්‍රසීලය, ප්‍රංශය, කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, මෙක්සිකෝව, කොලොම්බියාව ඇතුළු රටවල් 121කින් ආසාදිතයන් වාර්තා වුණා. 2024 වසරේදී නැවතත් Mපොක්ස් වෛරසය නිසා අප්‍රිකානු රටවල් කිහිපයකට එල්ල වී තිබෙන්නේ දැඩි බලපෑමක්. අප්‍රිකානු කලාපයෙන් පිටත ස්වීඩනයෙන් හා තායිලන්තයෙන් ආසාදිතයන් දෙදෙනකු පළමු වරට වාර්තා වීමත් සමග එහි ගෝලීය අවදානම තවදුරටත් උත්සන්න වුණා. ලෝක සෞඛ්‍ය සංවිධානය තහවුරු කරන්නේ Mපොක්ස් වෛරසය හේතුවෙන් 2024 ජනවාරි 01 සිට සැප්තැම්බර් 01 දක්වා රටවල් 14කින් ආසාදිත රෝගීන් 3751ක් සහ මරණ 32ක් වාර්තා වී ඇති බව.

1958 වසරේදී පර්යේෂණ සඳහා යොදාගත් වඳුරන්ගෙන් Mපොක්ස් වෛරසය පළමු වරට ඩෙන්මාර්කයේදී සොයා ගැනුණා. මිනිසකුට ආසාදනය වීමක් පළමුවෙන් වාර්තා වූයේ 1970 වසරේදී කොංගෝ රාජ්‍යයේදී. ඒ, මාස 09ක් වයසැති පිරිමි ළමයකුට. 1980 වසරේදී වසූරිය තුරන් කිරීමෙන් පසුව මධ්‍යම සහ නැගෙනහිර අප්‍රිකාවේ (Clade I) සහ බටහිර අප්‍රිකාවේ (Clade II) Mපොක්ස් වෛරසය වරින් වර වාර්තා වී තිබෙනවා. 2003 වසරේදී ආනයනය කරන ලද සතුන් මාර්ගයෙන් Clade II Mපොක්ස් වෛරස ආසාදනය වීමක් ඇමරිකා එක්සත් ජනපදයෙන් හඳුනා ගන්නා අතර 2005 වසරේ සිට කොංගෝ රාජ්‍යයේ වසරකට දහස් ගණනින් වෛරසය ආසාදනය වෙනවා.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව Mපොක්ස් වෛරසයේ මූලික රෝග ලක්ෂණ වන්නේ උණ, හිසරදය, වසා ගැටිති ඉදිමීම, කොන්ද වේදනාව, ශරීර ශක්තිය පිරිහීම, උගුර වණ වීම, මාංශ පේශි කැක්කුම, සම මතුපිට බිබිලි සහ කුෂ්ඨ හට ගැනීම. පුද්ගලයාගෙන් පුද්ගලයාට රෝගය ආසාදනය වුවත් මේ රෝග ලක්ෂණ මතුවීම එකිනෙකට වෙනස්වීමට හැකියාව තිබෙනවා. වෛරසයට නිරාවරණය වී දින 01-21 කාලයේ පූර්ව ලක්ෂණ මතුවන අතර ආසන්න වශයෙන් දින 14 සිට 21 දක්වා ආසාදනය ශරීරයේ පවතින්නට පුළුවන්. වෛරසය ආසාදිත පුද්ගලයන් සමග සමීප සම්බන්ධතා පැවැත්වීමෙන් හෝ වෛරසයට නිරාවරණය වූ ඇඳ ඇතිරිලි, ඇඳුම් පැළඳුම්, තුවා වැනි දේ ස්පර්ශ වීමෙන් හෝ ගර්භණී සමයේදී මවගෙන් කලලයට හෝ අලුත උපන් බිළිඳාට Mපොක්ස් වෛරසය සම්ප්‍රේෂණය වන්නට පුළුවන්. ප්‍රතිශක්තිකරණ පද්ධතිය දුර්වල හෝ පෝෂණ ඌනතා සහිත හෝ නිදන්ගත හෝ බෝනොවන රෝගවලින් පෙළෙන පුද්ගලයන්ට, ගැබිණි කාන්තාවන්ට සහ කුඩා දරුවන්ට මේ රෝගයට ගොදුරු වීමේ සැලකිය යුතු අවදානමක් පවතින බව ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙනවා. වෛරසය ආසාදිත පුද්ගලයන් සමග සමීප සම්බන්ධතා පැවැත්වීමෙන් වැළකීම, පිරිසිදු ව සිටීමට අවශ්‍ය සෞඛ්‍ය ආරක්ෂිත පුරුදු අනුගමනය කිරීමෙන් හා වෛරසය නිසා ඇති වන තුවාල සම්පූර්ණයෙන් සුව වන තුරු අන්‍යයගෙන් හුදෙකලාව සිටීමෙන් මේ තත්ත්වය බොහෝදුරට මඟහරවා ගත හැකි බව ද ඔවුන් අවධාරණය කරනවා.

Mපොක්ස් වෛරසයත් සමග ලෝක සෞඛ්‍ය සංවිධානය පවා අවධානය යොමු කළ කාරණාවක් වශයෙන් පුද්ගල සමාජභාවය හා සමානාත්මතාව පෙන්වා දෙන්නට පුළුවන්. 2022 වසරේදී Mපොක්ස් වෛරසය වැඩි වශයෙන් සමරිසි පුද්ගලයන් අතර සම්ප්‍රේෂණය වීම හේතුවෙන් ප්‍රජාවක් මුල් කරගෙන වෙනස්කොට සැලකීම සිදු නොකළ යුතු බවටත් ඔවුන් කියා සිටිනවා. 2022 වසරෙන් පසුව එතෙක් මේ වෛරසය හඳුන්වන ලද 'Monkeypox' යන්න කිසිදු සත්ත්වයකු ඉස්මතු නොකෙරෙන පරිදි 'Mpox' යනුවෙන් හැඳින්වීමටත් ලෝක සෞඛ්‍ය සංවිධානය පියවර ගෙන තිබෙනවා.

# සමබල ආහාර වේලක් ගෙනෙයි සුවබර දිවියක්



ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය වැඩිවෙමින් පවතින්නේද යන්න සොයා බැලීමටත් එසේ නම් ඒ සඳහා ගත යුතු කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බැලීමටත් හඳුනාගත් ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාවට නැංවීම පිළිබඳ අධීක්ෂණය කිරීම සඳහාත් 2023 ජනවාරි මස පත් කෙරුණු පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාව නොබෝදා (සැප්තැම්බර් 04) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණා. ශ්‍රී ලංකාවේ ළමා මන්දෝෂණ තත්ත්වය වැඩිවෙමින් පවතින බවට එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) දෙවැනි වරටත් දන්වා තිබූ බැවින් සහ මෙරට මන්දපෝෂණ තත්ත්වය පිළිබඳ විවිධ මත සහ සංඛ්‍යාලේඛන ඉදිරිපත් වන බැවින් මෙන් ම දීර්ඝකාලීන මන්දපෝෂණය නිසා අනාගත දරු පරපුරෙහි සෞඛ්‍ය අධ්‍යාපනය සහ සමාජ සංවර්ධනය කෙරෙහි ඇතිවන බලපෑම කෙරෙහි සංවේදී වෙමින් ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය කරමින් යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහායි මේ කමිටුව පත් කෙරුණේ. යුනිසෙෆ් ආයතනය, ලෝක සෞඛ්‍ය සංවිධානය සහ මෙරට සෞඛ්‍ය, අධ්‍යාපන, කාන්තා හා ළමා කටයුතු, මුදල් යනාදී ක්ෂේත්‍ර නියෝජනය කරන ආයතනවල සමාජිකයන්ගෙන් එම කමිටුව සමන්විත වී තිබීම විශේෂත්වයක්. මේ ලිපිය සැකසෙන්නේ එම විශේෂ කාරක සභා කමිටු වාර්තාව ඇසුරින්.

**නිරෝෂි දොඹගහගේ**

මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන් වෙත ලියාපදිංචි වී සිටින සියලු ම දරුවන් සමීක්ෂණයට භාජනය කරන ලද 2023 වර්ෂයේ පෝෂණ මස දත්ත අනුව මෙරට අවුරුදු 05ට අඩු සියලු ම දරුවන්ගෙන් 1.2%ක් උග්‍ර මන්ද පෝෂණයෙන් පීඩාවට පත් ව සිටිනවා. දරුවන් 16,000කට ආසන්න සංඛ්‍යාවක් ඊට අයත්.

මන්දපෝෂණය යනු පුද්ගලයකුගේ ශක්තිය සහ හෝ පෝෂණ පදාර්ථ ලබා ගැනීමේ ඌනතාව, අතිරික්තය හෝ අසමතුලිතතාව හේතුවෙන් උද්ගත වන තත්ත්වයක්. මන්දපෝෂණයට ඌනපෝෂණය, අධිපෝෂණය සහ තරබාරුකම, දියවැඩියාව, පිළිකාව වැනි ආහාර ආශ්‍රිත බෝවන සහ නොවන රෝග ඇතුළත් වන බවයි ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන්නේ. ඒ අනුව අවිධිමත් හා ප්‍රමාණාත්මක නොවන ආහාර රටාවක් නිසා ඇතිවන තත්ත්වයක් ලෙසින් ද 'මන්දපෝෂණය' විග්‍රහ කෙරෙනවා. මෙරට මන්දපෝෂණයට බලපාන ප්‍රධාන හේතුව ලෙස සෑම අයකුට ම නිසි සමබල ආහාර වේලක් නොලැබීම හඳුනාගත හැකි අතර ඒ සඳහා බලපාන්නේ දිළිඳුකම, නිසි අධ්‍යාපනයක්, දැනුවත්භාවයක් නොමැති වීම මෙන් ම නොගැළපෙන ආහාර පුරුදු.

මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් නිරන්තර ආසාදන හා දිගුකාලීන ලෙස වර්ධනය ප්‍රමාද වීමට ලක් වනවා. මිටිභාවය (වයස අනුව තිබිය යුතු දිග/උස අඩු වීම), කෘෂභාවය (දිග/උස සඳහා අඩු බර හෝ වයස සඳහා අඩු BMI අගය), අඩු බර (වයස අනුව තිබිය යුතු බර අඩුවීම) සහ ක්ෂුද්‍ර පෝෂක ඌණතා (වැදගත් විටමින් සහ ඛනිජ ලවණ ප්‍රමාණවත් නොවීම) යනාදී ලෙසින් ළමා මන්දපෝෂණය ආකාර හතරකින් හඳුනාගන්න පුළුවන්. මේ මන්දපෝෂණ තත්ත්ව මෙරට දරුවන් අතර වාර්තා වන ආකාරය පිළිබඳ නවතම සංඛ්‍යා දත්ත රැසක් පාර්ලිමේන්තු විශේෂ කාරක සභා වාර්තාවෙන් හෙළිදරව් කර තිබෙනවා.

ඒ අනුව 2023 වර්ෂයේ ජූනි මස පෝෂණ මාස තක්සේරුවෙන් පසුව දිවයිනේ මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවරුන් වෙත ලියාපදිංචි වී ඇති වයස අවුරුදු 05ට අඩු ළමයින්ගෙන් 96.5%ක පිරිසක් ඇගයීමට ලක් කිරීමෙන් පසු අඩු බර 17.1%ක්, කෘෂ වීම 10%ක් සහ මිටි වීම 10.3%ක් ලෙස හඳුනාගෙන තිබෙනවා.

2022 වසරේ දත්ත හා සසඳන විට ළදරුවන් හා වයස අවුරුදු 02 දක්වා දරුවන් අතර මෙන් ම වයස අවුරුදු 02-05 අතර ළමයින්ගේ අඩුබර සහ මිටිභාවය වර්ධනය වීමක් දැක ගන්න පුළුවන්. ඒ අනුව වයස අවුරුදු 05ට අඩු ළමයින් අතර මිටි බව 10.3%ක වර්ධනයක් දක්නට ලැබෙන අතර එය පෙර වසරට වඩා 9.2% ක වැඩි වීමක්. මෙසේ දරුවන් මිටිභාවයට පත්වීමේ ඉහළ ම අනුපාතය වාර්තා වී ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන්.

ආහාර අනාරක්ෂිත බව, දිගුකාලීන ව පවතින දරුණු රෝග වැනි බොහෝ හේතු නිසා කෘෂභාවය ඇති වන්නට පුළුවන්. 2023 ජූනි මාසයේ දත්ත අනුව කෘෂභාවයට ලක් වූ දරුවන්ගේ අනුපාතය 10%ක්. එය 2022 වර්ෂයේ පැවැතියේ 10.1%ක් ලෙස. කෙසේ වෙතත් වයස අවුරුදු 05ට අඩු ළමයින් 135,768ක් මෙලෙස කෘෂභාවයට ලක්වී තිබෙනවා. මේ තත්ත්වයට අදාළ ඉහළ ම වර්ධනය (2%) වාර්තා වන්නේ කිලිනොච්චිය දිස්ත්‍රික්කයෙන්.

වයස අවුරුදු 05ට අඩු ළමයින්ගේ අඩු බර තත්ත්වය සම්බන්ධයෙන් 2022 වසරේ දත්ත හා 2023 වසරේ ජූනි මස වාර්තා අනුව වවුනියාව හැර අනෙකුත් සියලු දිස්ත්‍රික්කවල අඩු බර අනුපාතය ඉහළ ගොස් තිබෙනවා. වඩාත් ම තැති ගන්වන සුළු ඉහළ ම අඩුබර අනුපාතය වන 24.6%ක් නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එම දිස්ත්‍රික්කයේ සෑම දරුවන් හතර දෙනකුගෙන් එක් අයකු මධ්‍යස්ථ හෝ දැඩි ලෙස අඩු බර ඇතිවීමේ තත්ත්වයට මුහුණපා තිබෙනවා. බදුල්ල, අම්පාර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල සෑම දරුවන් පස් දෙනකුගෙන් එක් අයකු මධ්‍යස්ථ හෝ දැඩි ලෙස අඩු බරින් යුක්ත වෙනවා.

ක්ෂුද්‍ර පෝෂක ඌනතාව ලෙස හඳුන්වන මන්දපෝෂණ තත්ත්වය උද්ගත වන්නේ විටමින් සහ ඛනිජ ලවණ ප්‍රමාණවත් ලෙස නොලැබීම හේතුවෙන්. මේ තත්ත්වය නිසාත් නිරන්තර ආසාදනවලට ගොදුරු වීම, දුර්වල කායික හා මානසික ක්‍රියාකාරීත්වය යනාදී සංකූලතාවලට

වෛද්‍ය පර්යේෂණ ආයතනය 2023 වර්ෂයේදී සිදු කර ඇති ජාතික පෝෂණ හා ක්ෂුද්‍ර පෝෂක සමීක්ෂණයේ මෙතෙක් ප්‍රකාශයට පත් නොකළ වාර්තාව අනුව 2022 වර්ෂය දක්වා දශකයක මෙරට සිදුකරන ලද පෝෂණ මැදිහත්වීම් හේතුවෙන් වයස අවුරුදු 05ට අඩු ළමයින් අතර ක්ෂුද්‍ර පෝෂක ඌනතා සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් නිරීක්ෂණය කළ හැකියි.

මුහුණපෑමට දරුවන්ට සිදුවනවා. ගෝලීය වශයෙන් ද පෙර පාසල් දරුවන්ගෙන් අඩකට වඩා (56%) අවම වශයෙන් යකඩ, සින්ක් සහ විටමින් 'ඒ' යන ක්ෂුද්‍ර පෝෂක ඌනතා තුනෙන් එකකට හෝ ගොදුරු වී තිබෙනවා.

වෛද්‍ය පර්යේෂණ ආයතනය 2023 වර්ෂයේදී සිදු කර ඇති ජාතික පෝෂණ හා ක්ෂුද්‍ර පෝෂක සමීක්ෂණයේ මෙතෙක් ප්‍රකාශයට පත් නොකළ වාර්තාව අනුව 2022 වර්ෂය දක්වා දශකයක මෙරට සිදුකරන ලද පෝෂණ මැදිහත්වීම් හේතුවෙන් වයස අවුරුදු 05ට අඩු ළමයින් අතර ක්ෂුද්‍ර පෝෂක ඌනතා සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් නිරීක්ෂණය කළ හැකියි. ඒ අනුව යකඩ ඌනතාවෙහි 84%ක අඩුවීමක් ද යකඩ ඌනතාව ඇති කරන රක්තහීනතාවෙහි 76%ක අඩුවීමක් ද වාර්තා කර තිබීම සාධනීය තත්ත්වයක්. එහෙත් මාස 06-59 අතර ළමයින්ගේ විටමින් ඩී ඌනතාව සහ සින්ක් ඌනතාව පිළිවෙළින් 26.2%ක් සහ 15.3%ක්.

දරුවන්ගේ පෝෂණ තත්ත්ව පිළිබඳ සලකා බැලීමේදී වයස අවුරුදු 05 සිට 18 දක්වා දරුවන් කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත්. 2022 වර්ෂයේ සිදුකරන ලද ජාතික පෝෂණ හා ක්ෂුද්‍ර පෝෂක සමීක්ෂණයේ හෙළිදරව් කිරීම් අනුව මේ වයස් කාණ්ඩයට අයත් මෙරට ළමයින්ගෙන් 1/3ක් මිටිභාවය, කෘෂභාවය, අධික බර හෝ තරබාරුකම හෝ ඒවායින් එකකට වඩා වැඩි දුර්වල පෝෂණ තත්ත්වයකට ගොදුරු වී සිටිනවා.

මන්දපෝෂණය මෙන් ම තරබාරුකම ද පෝෂණ ගැටලු අතර මගහැර යා නොහැක්කක්. නිවසෙහි සකසන ලද ආහාර වෙනුවට සීනි අඩංගු පැණි බීම අධික ලෙස පරිභෝජනය, සැකසූ ආහාර අනුභවය, පලතුරු සහ එළවළු අනුභවය ප්‍රමාණවත් නොවීම මෙන් ම රූපවාහිනිය නැරඹීම වැනි එක් ස්ථානයක සිටිමින් සිදුකරන කාර්ය සඳහා ගත කරන කාලය වැඩිවීම, ශරීරය වෙහෙස නොකිරීම ඇතුළු අසමබර ජීවන රටාවෙහි ප්‍රතිඵලයක් ලෙස දරුවන් අතර අධික බර හා තරබාරුකම වයසත් සමඟ වැඩි වී තිබෙනවා. 2023



වර්ෂයේදී යුනිසෙෆ් සංවිධානය හෙළිදරව් කරන ලද පරිදි මේ තත්ත්ව හේතුවෙන් සරදමට ලක්වීම, ආත්ම අභිමානය අඩුවීම සහ කාන්සාව වැනි තත්ත්ව දරුවන් අතර උද්ගත වන්නට පුළුවන්. එසේ ම බෝ නොවන රෝග වැළඳීමේ අවදානම ද ඉහළ යා හැකියි.

මෙලෙස මන්දපෝෂණ තත්ත්ව ඇතිවීමට ගෘහස්ථ මට්ටමින් ආහාර සුරක්ෂිතතාව නිසි පරිදි නොපැවතීම ද බලපා තිබෙනවා. 2022 වර්ෂයේ ආර්ථික අර්බුදය හේතුවෙන් සමස්ත ජනගහනයෙන් 98%ක් ආහාර මිල ඉහළ යාම නිසා පීඩාවට පත් ව

ඇති අතර ඒ හේතුවෙන් එම වර්ෂයේ අවසාන මාස 06දී අධ්‍යයනය කරන ලද කුටුම්බවලින් 74%කට ආහාර හෝ දෛනික අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීමට හැකියාව ලැබී නැහැ. ආහාර අනාරක්ෂිත කුටුම්බ සංඛ්‍යාව 2023 මාර්තු මාසයේ පැවති 17%ට සාපේක්ෂ ව 2023 වර්ෂයේ තුන් වැනි කාර්තුවේදී 24%ක් දක්වා ඉහළ ගොස් තිබෙනවා. සමස්ත පවුල්වලින් 1/3ක් ආහාර පිසීමේ වාර ගණන අඩු කර හෝ ඔවුන්ගේ පරිභෝජනය සීමා කර ඇති අතර 1/4ක් අසල්වැසියන්ගෙන් ලැබෙන අහාර මත ජීවත් වන බවට ද කරුණු හෙළි වී තිබෙනවා.

කමිටු වාර්තාව නිර්දේශ කර තිබෙන්නේ මේ ගැටලුවට අදාළ ව ක්ෂණික පෝෂණ ක්‍රියාමාර්ග, මධ්‍යකාලීන මැදිහත්වීම් සහ දිගුකාලීන මැදිහත්වීම්. ක්ෂණික පෝෂණ ක්‍රියාමාර්ග යටතේ අවුරුදු 05ට අඩු දරුවන් සහිත ආර්ථික වශයෙන් අවදානමට



ලක්විය හැකි පවුල්වල අනාරක්ෂිතභාවය සම්බන්ධයෙන් සමාජ ආරක්ෂණ වැඩසටහන් සිතියම්ගත කිරීමට යෝජනා කර තිබෙනවා. එවැනි පවුල් සඳහා අවශ්‍ය සෞඛ්‍යසම්පන්න ආහාර ද්‍රව්‍ය සහිත ආහාර මලු, වවුචර් පත්‍ර ලබාදීමට නිර්දේශ කර ඇති අතර අවදානමට ලක්විය හැකි ග්‍රාම නිලධාරී බල ප්‍රදේශවල පෙර පාසල් දරුවන් සඳහා ආහාර ලබාදීම වෙනුවෙන් දැනට වැය කරන රුපියල් 100ක මුදල් ප්‍රවාහය අඛණ්ඩ ව ලබාදීමට යෝජනා කර තිබෙනවා. ගැබිණි මව්වරුන්ට සහ මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්ට බාධාවකින් තොර ව පෝෂණ අතිරේක සැපයීම, සියලු ම පෙර පාසල්, පාසල් සහ නව යොවුන් දරුවන් ආවරණය වන පරිදි ශක්තිජනක සහල් සපයමින් පාසල් ආහාර වැඩසටහන පුළුල් කිරීම, සීනි සහ මේද අධික ආහාර මත බදු අය කිරීම, ළමයින්ගේ ආහාර පිළිබඳ වෙළෙඳ දැන්වීම් තහනම් කරන ආරක්ෂිත ආහාර නීති රීති ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍යසම්පන්න ආහාර පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, ක්ෂේත්‍ර සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල සේවය නගා සිටුවීමට අවශ්‍ය පියවර ගැනීම යනාදී ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම ද එහි අවධාරණය කර තිබෙනවා.

විටමින් ඩී ඌණතාව වැළැක්වීමට පාසල් දරුවන් අවම වශයෙන් විනාඩි 30ක හිරු එළියට නිරාවරණය කරන ශාරීරික ක්‍රියාකාරකම්වල යෙදවීම ඉතා වැදගත්. සෞඛ්‍යසම්පන්න ආහාර දැරිය හැකි මිලකට ලබා ගැනීම සඳහා පෝෂණ සංවේදී කෘෂිකර්මාන්ත ඇති කිරීම, පෙර පාසල් සහ පාසල් ආහාර වැඩසටහන සහ ආපනශාලා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම හා ඒවා අධීක්ෂණය කිරීම, ත්‍රිපෝෂ නිෂ්පාදන යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග යෝජනා කර ඇත්තේ මධ්‍යකාලීන මැදිහත්වීම් ලෙස.



පෝෂණ ක්‍රියාකාරකම් සඳහා වෙන් කෙරෙන මුදල් සඳහා වටිනාකම සහතික කරමින් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම, ඵලදායී පෝෂණ ක්‍රියාමාර්ග සඳහා විවිධ අංශ සම්බන්ධීකරණය කර සහයෝගිතාව ලබා ගැනීම, ආහාර නීති පද්ධති විධිමත් කිරීම සහ තක්සේරුව සඳහා විශ්ලේෂණ ධාරිතාව ශක්තිමත් කිරීම යන යෝජනා මේ ගැටලුවට අදාළ දිගුකාලීන මැදිහත්වීම් ලෙසයි ඉදිරිපත් කර තිබෙන්නේ.



# යුද ගැටුම් පැටව් ගහන පලස්තීන ගැටලුව

මොහාන් සමරනායක

යුද්ධය විෂය කොටගත් අරුත්බර කියමන් රැසක් මානව සාහිත්‍යයේ දක්නට පුළුවන්. "යුද්ධය මිනිසාගේ පැරණිතම අත්දැකීමයි" යන්න එක් කියමනක්. එයින් අදහස් වන්නේ මිනිසා පෘථිවිය මත පහළ වූ දා සිට යුද්ධ කළ බව. මේ කියමන සත්‍යයක්. මනුෂ්‍යයා වනාන්තරයේ ජීවත් වන විටත් ඉන් එළියට පැමිණි විටත් එකිනෙකා සමග, ජාතීන් සමග සටන් කළා. යුද්ධ කළා. ක්‍රිස්තු පූර්ව 04 වැනි සියවසේ ග්‍රීසියේ විසූ ප්ලේටෝ නමැති විශිෂ්ට දාර්ශනිකයා වරක් සඳහන් කළා යුද්ධයේ අවසානය දැක ඇත්තේ මළ මිනිසා පමණකැයි කියා. ඉන් අදහස් වන්නේ ජීවත් වන සියලු දෙනාට නැවත නැවතත් යුද්ධය දකින්නට සිදු වන බව. මේ කියමනත් සනාතන සත්‍යයක් පවතින මේ සමාජ සන්දර්භය ඇතුළත. නිදසුනක් ලෙස නිරවි යුද්ධය පැවැති සමයේ ලෝකයේ බොහෝ දෙනා විශ්වාස කළා බල කඳවුරු අතර තරගය අවසන් වූ විට ලෝකයෙන් යුද්ධ තුරන් වනු ඇතැයි කියා. 1991 වසරේදී සෝවියට් දේශය බිඳ වැටීමෙන් නිරවි යුද්ධය අවසානයකට පැමිණියා. නමුත් යුද්ධ නතර වුණේ නැහැ. 21 වැනි සියවසේත් අප කතා කරන මොහොතේ මනුෂ්‍ය වර්ගයාට ඉතා ම බියකරු ප්‍රතිවිපාක ඇතිවිය හැකි යුද්ධ දෙකක් සිදු වෙමින් තිබෙනවා. එක් යුද්ධයක් වන්නේ 2022 පෙබරවාරි මාසයේ ආරම්භ වූ රුසියාව සහ යුක්රේනය අතර යුද්ධය. එය කවදා නිම වේවිදැයි කියන්නට සාක්ෂි තව ම නැහැ. අනෙක දැන් සිදුවෙමින් තිබෙන ලෙබනනය සහ ඊශ්‍රායලය අතර යුද්ධය.

නොබෝද (ඔක්තෝබර් 01) ඉරානය ඊශ්‍රායලයට කළ බැලස්ටික් මිසයිල ප්‍රහාරයේදී බැලස්ටික් මිසයිල 180ක් හෝ ඊට මඳක් වැඩි සංඛ්‍යාවක් භාවිත කළ බවට වාර්තා තිබෙනවා. ඊශ්‍රායලය පවසන්නේ එම මිසයිලවලින් වැඩි සංඛ්‍යාවක් තමන් ගුවනේදී ම විනාශ කළ බව. එකක් දෙකක් පමණක් ඉලක්ක කරා ළඟා වුණා. ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ජෝ බයිඩන් කියා සිටියා මේ ඉරාන ප්‍රහාරයෙන් සිදු වී ඇති හානියක් දක්නට නැති බව.

දැන් බිය පළ ව තිබෙනවා ඊශ්‍රායලය ඉරාන ප්‍රහාරයට ප්‍රතිප්‍රහාර දෙනු ඇතැයි කියා. මෙවර ඊශ්‍රායලයේ ප්‍රතිප්‍රහාරය ඉතා ම විනාශකාරී එකක් වන බවයි බොහෝ විචාරකයන්ගේ අදහස. මා කිව යුතුයි මා මේ කියන දේ ඊළඟ මොහොතේ අසත්‍ය වන්නට පිළිවන්. ඊශ්‍රායලය බොහෝ විට ඉරානයේ න්‍යෂ්ටික පහසුකම් සහිත ප්‍රදේශවලට, ඉරානයේ තෙල් කර්මාන්තය කේන්ද්‍රගත ව ඇති ප්‍රදේශවලට දැවැන්ත ප්‍රහාරයක් දීමට ඉඩ තිබෙනවා. එවැන්නක් සිදු වුවහොත් එහි ප්‍රතිඵලය සටන් වදින අයට පමණක් නොවෙයි අප සියලු දෙනාට ම, මුළු ලෝකයට ම අතිශය අනර්ථකාරී වේවි.

ඉරානය ඊශ්‍රායලයට එල්ල කළ ප්‍රහාරයට කලින්, පසුගිය දවස් කිහිපයේ ඊශ්‍රායලය ලෙබනන් අගනුවර බේරූට් නුවර දහියා නමැති ස්ථානයකට කළ මහා පරිමාණ ප්‍රහාරය නිසා ලෙබනනයේ සිට ක්‍රියාත්මක වන හිස්බුල්ලා නමැති සටන්කාමී සංවිධානයේ නායක (ඔහු ප්‍රකට චරිතයක්) හසන් නස්රල්ලා ඝාතනය වුණා තවත් අය සමග. මෙය මැදපෙරදිග කලාපයේ විශාල කම්පනයක් ඇති කළා පමණක් නොව ලෝකයේත් කම්පනයක් ඇති කළා. ඊශ්‍රායලය, නස්රල්ලා ඝාතනය හැඳින්වූයේ දශක ගණනකදී අත්කරගත් තීරණාත්මක ජයග්‍රහණයක් ලෙස. නැත්නම් මැදපෙරදිග භූ දේශපාලන සිතියම නැවත නිර්මාණය කිරීමේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස. නමුත් අනෙක් පාර්ශ්වය මේ පිළිබඳ ව බලවත් කෝපයට පත් ව තිබෙනවා. ඒ ප්‍රහාරයත් සමග ම ඉරානය ප්‍රකාශ කළා මේ පහරදීමට පළිනොගෙන යන්නට ඉඩ නොතබන බව. දැන් එය සිද්ධ වී තිබෙනවා. යුද්ධය දිගින් දිගට ම ඇදී යමින් තිබෙනවා. ඉරානය කියන්නේ තමන් ප්‍රහාරය එල්ල කළේ හිස්බුල්ලා නායක නස්රල්ලා ඝාතනය, ඊට කලින් පලස්තීනයේ හමාස් සංවිධානයේ නායක ඉස්මයිල් හනියේ ටෙහෙරාන් නුවර මන්දිරයක සිටියදී ඝාතනය කිරීම වැනි සාධක මුල්කරගෙන බව. ඊට අමතර ව පසුගිය දවස්වල හිස්බුල්ලා නායකයා ඝාතනය කිරීමට පෙර දවස් දෙකක් අඟහරුවාදා සහ බදාදා ලෙබනනයේ හිස්බුල්ලා සාමාජිකයන් සහ තවත් අය භාවිත කරන පේජර් සහ වෝකිටෝකි යන සන්නිවේදන උපකරණ දහස් ගණනක් පුපුරා ගියා. මෙය සැලසුම්සහගත ව කළ යුද ප්‍රහාරයක් ලෙසයි පිළිගැනෙන්නේ. ඇතැම් අයගේ මතය එය අන්තර්ජාතික යුද අපරාධයක් බව. මන්ද මේ කවර හෝ පෙජර් හෝ වෝකිටෝකි යන්ත්‍රයක් භාවිත කරන්නේ එය ආරක්ෂා සහිත එකක් බව සිතාගෙන. නමුත් ඊශ්‍රායලය දක්ෂ ලෙස එය යුද අරමුණක් සඳහා

ප්‍රයෝජනයට ගෙන තිබෙනවා. මේ දක්නට තිබෙන්නේ මිනිසුන් ඝාතනය කිරීමට තිබෙන ඊශ්‍රායලයේ හැකියාව සහ උපායමාර්ගය. මේ විදිහට මෙය අතරක් නැති ව වරක් උඩට එමින්, උච්ච අවස්ථාවකට යමින්, වරක් යටපත් වී, නැවත මතුවන ගැටුමක්. මෙය තව කොපමණ කලක් ඇදී යනු ඇත්ද කියා මේ මොහොතේ කිසිවකුටත් නිශ්චය කරන්නට පිළිවන්කමක් නැහැ. මීට පෙර 2006 වසරේදී ලෙබනනයේ හිස්බුල්ලාවරුන් සහ ඊශ්‍රායලය අතර බරපතල සටන් ඇති වුණා. අවසානයේදී ඊශ්‍රායලයට ඉමහත් පාඩු සිද්ධ වුණා. හිස්බුල්ලාවරුන්ටත් එහෙමයි. එතැනින් නතර වුණා. ඊට කලින් 1982 වසරේදී ලෙබනනය ආක්‍රමණය කරනු ලැබුවා ඊශ්‍රායලය විසින්. 1975 සිට 1990 වසර දක්වා ලෙබනනයේ ඉතාම විනාශකාරී භයානක අභ්‍යන්තර සිවිල් යුද්ධයක් ඇදී ගියා වසර 15ක් තිස්සේ. මේ අතරක් නැති ගැටුම් ඉරානයට හෝ ඊශ්‍රායලයට සහ ලෙබනනයට සීමා වන්නේ නැහැ. මේ ගැටුමේ පාර්ශ්ව කිහිපයක් ම තිබෙනවා. එකක් ඊශ්‍රායලය සහ ලෙබනනයේ හිස්බුල්ලාවරුන් අතර. අනෙක ඊශ්‍රායලය සහ පලස්තීනය හා ගාසා තීරයේ හමාස් සටන්කරුවන් අතර. ඊළඟට ඊශ්‍රායලයේ සහ යේමනයේ හූති සටන්කරුවන් අතර. ඊළඟට ඊශ්‍රායලයේ සහ ඉරාකයේ ක්‍රියාත්මක වන ඉස්ලාමීය සටන් කණ්ඩායම් අතර. අවසාන වශයෙන් ඊශ්‍රායලය සහ ඉරානය අතර.

මෙසේ ඇදෙමින් තිබෙන මේ යුද්ධය පිළිබඳ තොරතුරු ජනමාධ්‍ය ඔස්සේ අපට අසන්නට පිළිවන්. කියවන්නට පිළිවන්. රූපරාමු බලන්නට පිළිවන්. නමුත් මා දකිනවා මේ යුද්ධයට හේතුව කුමක් ද? යුද්ධය මේ විදිහට කෙළවරක් නැති ව සිදු වන්නේ මන්ද? එය නතර කළ හැක්කේ කෙසේද? යන්න ගැන තිබෙන අවධානය බෙහෙවින් අඩු බව. ඇතැම් විට ප්‍රධාන ධාරාවේ මාධ්‍ය අයිති වන්නේ ලෝකය පාලනය කරන බලවතුන්ට නිසා, ධන හිමි පන්තිවලට නිසා ඔවුන් මේ පිටුපස තිබෙන කටුක සත්‍යය, යථාර්ථය වසන් කරන්නට උත්සාහ කරන බව පැහැදිලි ව දකින්න පිළිවන්. මේ අතරක් නැති යුද්ධයට ප්‍රධාන හේතුව වන්නේ 'මැදපෙරදිග අර්බුදය' නමින් අප කාලයක් තිස්සේ හඳුන්වන සාධකය. මැදපෙරදිග අර්බුදයේ මදය, න්‍යෂ්ටිය නිර්මාණය කරන්නේ පලස්තීන ජනතාවට තමන්ගේ රාජ්‍යය අහිමි වීම. මෙය බොහෝ සෙයින් කතා වී තිබෙන මාතෘකාවක් නිසා ඉතාම කෙටියෙන් සඳහන් කළහොත් පලස්තීනය නමින් හඳුන්වන කුඩා භූමි ප්‍රදේශයේ 1948 වසරේ මැයි මස 14 දින ඊශ්‍රායලය නමින් රාජ්‍යයක් ස්ථාපනය කෙරෙනවා, එහි කලක් තිස්සේ ඇති වූ ගැටුම්වලට විසඳුමක් ලෙස එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සම්මත කළ යෝජනාවක් අනුව. ඊශ්‍රායල් රාජ්‍යය ස්ථාපනය කළ දිනට පසු දවසේ ම ප්‍රථම ආරාබි-ඊශ්‍රායල් යුද්ධය ආරම්භ වනවා. ඉන් පස්සේ 1956දී, 1967දී, 1973දී ආදී වශයෙන් මේ යුද්ධය අතරක් නැති ව ඇදී යනවා. මේ යුද්ධයේ මූලික නිධානය පලස්තීන ජනයාට තමන්ගේ දේශය අහිමි වීම.

ප්‍රශ්නයට තිබෙන විසඳුම දැනට ලෝක ප්‍රජාව යෝජනා කර තිබෙන, බොහෝ රටවල් පිළිග න්නා අන්දමට පලස්තීනයේ රාජ්‍ය දෙකක් ස්ථාපනය කිරීම. දැනටමත් එක් රාජ්‍යයක්, එනම් යුදෙව් රාජ්‍යය පවතිනවා. පලස්තීන ජනයාටත් තමන්ට පිළිගත හැකි කොන්දේසි යටතේ තමන්ගේ අභිමානය, අයිතිවාසිකම් ආරක්ෂා වන රාජ්‍යයක් නිර්මාණය කළ යුතුයි. එසේ නොකරනතාක් කල් අපට නැවත නැවත මේ ප්‍රශ්නය ගැන කතා කරන්නට ලැබේවි.

1948දී ඊශ්‍රායලය බිහිවන කාල පරාසයේදී පලස්තීන ජනයා ලක්ෂ ගණනින් වෙන රටවලට පලා ගියා. මන්ද ඔවුන් ඝාතනයට, මර්දනයට, පීඩනයට ලක්වූ නිසා. එදා පලා ගිය සංඛ්‍යාව 750,000ක් පමණ. අද එම සංඛ්‍යාව මිලියන 04 ඉක්මවා තිබෙනවා. එසේ පලා ගිය පලස්තීන සරණාගතයන් අතරින් ඔවුන්ගේ ප්‍රශ්නයට විසඳුමක් සෙවීම සඳහා කණ්ඩායම් රැසක් බිහිවුණා. එයින් ප්‍රමුඛ සංවිධානය, පලස්තීන විමුක්ති සංවිධානයයි කලකට පෙර ප්‍රකට චරිතයක් වූ යසර් අරෆාත් නායකත්වය දුන්. එක් අවස්ථාවකදී මේ පලස්තීන විමුක්ති සංවිධානය ලෙබනනය තමන්ගේ මූලස්ථානයකොට ගත්තා. ඒකට හේතුවක් තිබුණා. මන්ද පලා ගිය පලස්තීන සරණාගතයන් රාශියක් ලෙබනනයේ කඳවුරුවල ජීවත්වීම නිසා. එසේ ලෙබනනයේ ස්ථානගතවූ පලස්තීන සරණාගත කණ්ඩායම් සන්නද්ධ බලයක් බවට පත් ව, වරින්වර ඊශ්‍රායලයට පහර දෙන්න පටන් ගත්තා. ඒ නිසයි ඊශ්‍රායලයේ වෛරය, කෝපය ලෙබනනය දෙසට යොමුවන්නේ.

මේ සියලු තොරතුරුවලින් අපට එළැඹිය හැකි නිගමනය නම් මුළු මහත් මැදපෙරදිග කලාපය ම ගිනි ජාලයකට ඇද දමා, ඒ ගිනි ජාලාවෙන් සමස්ත මානව වර්ගයා ම යම් යම් ප්‍රමාණයකට පිළිස්සී යන මේ ගැටුම පිටුපස තිබෙන මූලික සාධකය පලස්තීන ජනයා පිළිබඳ ප්‍රශ්නය බව. සටන් කරන පිරිස් මර්දනය කිරීමෙන් පමණක් ප්‍රශ්නයට විසඳුමක් සෙවිය නොහැකි බව ඊශ්‍රායලයට ආයුධ, අරමුදල්, නවීනතම මිසයිල ආදිය සපයන, ඩොලර් බිලියන ගණනින් සපයන ඇමරිකා එක්සත් ජනපදය සහ බටහිර යුරෝපය තේරුම් නොගන්නාතාක් කල් මේ ගැටලුව විසඳීමට හැකි වනු ඇතැයි සිතන්නට බැහැ. අතීතයේදී නම් මෙසේ මර්දනයෙන්, ඝාතනයෙන්, සමූල ඝාතනයෙන් එවැනි ප්‍රශ්න විසඳිය හැකි වාතාවරණයක් තිබුණත් අද එම පරිසරය මුළුමනින් ම පාහේ වෙනස් වී තිබෙනවා. කෙටි කලකදී අරගල කරන පිරිස්, පලස්තීන සටන්කරුවන් මර්දනය කරන්න පුළුවන්. නමුත් දිගුකාලීන ව එය කළ හැකි දෙයක් නොවෙයි. ප්‍රශ්නයට තිබෙන විසඳුම දැනට ලෝක ප්‍රජාව යෝජනා කර තිබෙන, බොහෝ රටවල් පිළිගන්නා අන්දමට පලස්තීනයේ රාජ්‍ය දෙකක් ස්ථාපනය කිරීම. දැනටමත් එක් රාජ්‍යයක්, එනම් යුදෙව් රාජ්‍යය පවතිනවා. පලස්තීන ජනයාටත් තමන්ට පිළිගත හැකි කොන්දේසි යටතේ තමන්ගේ අභිමානය, අයිතිවාසිකම් ආරක්ෂා වන රාජ්‍යයක් නිර්මාණය කළ යුතුයි. එසේ නොකරනතාක් කල් අපට නැවත නැවත මේ ප්‍රශ්නය ගැන කතා කරන්නට ලැබේවි.

සටහන

**කාංචනා සිරිවර්ධන**

## ජාත්‍යන්තර දේශපාලනයේ

# උණුසුම් සටන

## ඇමරිකානු ජනාධිපතිවරණය


කමලා හැරිස්

**නිහාල් පීරිස්**

ඇමරිකාවේ ජනාධිපතිවරණ උණුසුම කෙමෙන් උත්සන්න වෙමින් පවතින අතර මේ ජනාධිපතිවරණය ජාත්‍යන්තර දේශපාලනය ගැන උනන්දුව දක්වන කාගේත් විශාල අවධානයක් දිනා ගන්නක් බව අමුතුවෙන් කිව යුතු නැහැ. 2024 නොවැම්බර් 05 දින ජනාධිපතිවරණය පැවැත්වීමට නියමිත ව තිබෙනවා.

මෙවර ජනාධිපතිවරණයේදී ඓතිහාසික සිදුවීමක් සිදු වනු ඇත් ද යන කුතුහලය බොහෝ දෙනා තුළ පවතින්නක්. ඇතැම් විට මෙහිදී ඇමරිකානු ඉතිහාසයේ පළමු වතාවට කාන්තාවක එරට ජනාධිපති ධුරයට පත් වීමට ඉඩ තිබෙනවා. ඇය ඇමරිකාවේ ප්‍රධාන පක්ෂ දෙකෙන් එකක් වන ඩිමොක්‍රටික් පක්ෂයෙන් තරග කරන කමලා හැරිස්. වර්තමානයේ එරට උප ජනාධිපති ධුරය දරන්නේ ද ඇය. ජනාධිපතිවරණයේදී ඇය සමග තරග කරන ප්‍රධාන ප්‍රතිවාදියා වන්නේ ආන්දෝලනාත්මක චරිතයක් වන හිටපු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්. ඔහු රිපබ්ලිකන් පක්ෂයෙන් ඉදිරිපත් වනවා.

මෙවැනි පසුබිමක කාගේත් අවධානය දිනාගෙන සිටින කමලා හැරිස් කලින් මේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට නොසිටීම ද විශේෂත්වයක්. ඩිමොක්‍රටික් පක්ෂයෙන් තරග කිරීමට නියමිත සිටියේ වත්මන් ජනාධිපතිවරයා වන ජෝ බයිඩ්න්. එහෙත් මේ වනවිට 81 වැනි වියෙහි පසුවන ඔහු තවත් ධුර කාලයක් දැරීමට තරම් සුදුසු කායික මානසික තත්වයක සිටිනවා ද යන්න සම්බන්ධයෙන් පසුගිය කාලයේ විශාල සාකච්ඡාවක් ඇති වුණා.

මේ කාරණය පිළිබඳ කාලයක සිට ම සැක සංකා පැවතුණත් එය වඩාත් උත්සන්න වූයේ මෙයට මාස කිහිපයකට පෙර බයිඩ්න් සහ ට්‍රම්ප් අතර ජනාධිපතිවරණය ඉලක්ක කර පැවැති ප්‍රසිද්ධ විවාදයකින් පසුව. එම විවාදයට බයිඩ්න් මුහුණදුන් ආකාරය ගැන ඔහුගේ ඩිමොක්‍රටික් පක්ෂයේ ම බොහෝ දෙනාගෙන් විවේචන එල්ල වුණා.. ඔහුගේ දුර්වල කටහඬ සම්බන්ධයෙන් මෙන් ම ඔහු කියූ ඇතැම් කාරණා සහ ලබා දුන් ඇතැම් පිළිතුරු පිළිබඳ ව ද ප්‍රශ්න මතු වුණා. බයිඩ්න්ගේ ඇතැම් ප්‍රකාශ අපැහැදිලි සහ ව්‍යාකූල බවක් ගත් බැව් ද පෙනුණා.

බයිඩ්න් ජනාධිපති තරගයෙන් ඉවත් විය යුතු බවට ටික කලෙක සිට ඉදිරිපත් වෙමින් තිබූ අදහස් වඩාත් දැඩි ලෙස මතුවන්නට පටන් ගත්තේ මේ විවාදයෙන් පසු. ඒ වනවිට විවිධ ආයතන පවත්වමින් සිටි ජනමත සමීක්ෂණවලින් ද පෙනී ගියේ බයිඩ්න් ජනාධිපතිවරණයට ඉදිරිපත් වුවහොත් ඔහු පරාජය වීමට ද යම් ඉඩක් ඇති බව.

ඔහුට තරගයෙන් ඉවත් වන මෙන් ඉල්ලීම් ඉදිරිපත් වුවත් බයිඩ්න් මුලින් ඊට වැඩි කැමැත්තක් දක් වූ බවක් පෙනුණේ නැහැ. එහෙත් පක්ෂයෙන් නැගුණු පීඩනය වැඩි වෙද්දී ජුලි 21 දින ඔහු ජනාධිපති තරගයෙන් ඉවත් වුණා. ඔහු එම අවස්ථාවේ පැවසුවේ පක්ෂය ගැනත් රට ගැනත් සිතා තමා මේ තීරණය ගත් බව.

උප ජනාධිපතිනිය වූ කමලා හැරිස්ට ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට වරම් හිමි වූයේ බයිඩ්න් මේ ආකාරයෙන් තරගයෙන් ඉවත් වීමෙන් පසුව. ඩිමොක්‍රටික් පක්ෂයේ අපේක්ෂිකාව බවට හැරිස් පත් වීමෙන් පසු ජනමත සමීක්ෂණවලින් කලින් පෙන්නුම් කළ තත්වය ද බොහෝදුරට වෙනස් වී ඇති ආකාරයක් දක්නට පුළුවන්. ඒවායින් පෙන්නුම් කරන්නේ ජනාධිපති සටනේ හැරිස් යම්දුරකට ට්‍රම්ප්ට වඩා ඉදිරියෙන් සිටින බව.

කමලා දේවි හැරිස් යනු ඇමරිකානු කළු ජාතික කාන්තාවක්. ඇයගේ පියා,



ඩොනල්ඩ් ට්‍රම්ප්

මෙවර ජනාධිපතිවරණයේදී ඓතිහාසික සිදුවීමක් සිදු වනු ඇත් ද යන කුතුහලය බොහෝ දෙනා තුළ පවතින්නක්. ඇතැම් විට මෙහිදී ඇමරිකානු ඉතිහාසයේ පළමු වතාවට කාන්තාවක එරට ජනාධිපති ධුරයට පත් වීමට ඉඩ තිබෙනවා. ඇය ඇමරිකාවේ ප්‍රධාන පක්ෂ දෙකෙන් එකක් වන ඩිමොක්‍රටික් පක්ෂයෙන් තරග කරන කමලා හැරිස්. වර්තමානයේ එරට උප ජනාධිපති ධුරය දරන්නේ ද ඇය. ජනාධිපතිවරණයේදී ඇය සමග තරග කරන ප්‍රධාන ප්‍රතිවාදියා වන්නේ ආන්දෝලනාත්මක චරිතයක් වන හිටපු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්. ඔහු රිපබ්ලිකන් පක්ෂයෙන් ඉදිරිපත් වනවා.

ඩොනල්ඩ් ජේ. හැරිස් ජැමයිකානු ජාතිකයකු වන අතර මව, ශ්‍යාමලා ගෝපාලන් ඉන්දියානු කාන්තාවක්. මේ පසුබිම නිසා හැරිස්ට එරට සුළු ජාතිකයන් බහුතරයකගේ ඡන්දය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරෙනවා. එමෙන් ම කාන්තාවන් වැඩි දෙනකුගේ ඡන්ද ද ඇයට හිමි වනු ඇති බවට අදහස් පළ වනවා. ට්‍රම්ප් කාන්තාවන් පිළිබඳ දක්වන ආකල්ප දිගු කාලයක සිට ම එරට බොහෝ දෙනාගේ අප්‍රසාදයට ලක් වී ඇති බව නොරහසක්.

හැරිස්ගේ වයස ද ඇයට වාසිදායක තත්ත්වයක් හිමි කර දෙනු ඇතැයි විශ්වාස කෙරෙනවා. ඇමරිකාවේ ජනාධිපති අපේක්ෂකයන් බෙහෙවින් වියපත් අය වීම සම්බන්ධයෙන් පසුගිය කාලයේ එරට තරුණ පරපුරේ වැඩි ප්‍රසාදයක් තිබුණේ නැහැ. ට්‍රම්ප්ගේ වයස ද මේ වනවිට අවුරුදු 78ක්. හැරිස් ඔහුට වඩා වයසින් බාල වන්නේ අවුරුදු 19කින්. මේ තත්ත්වය මත ඇමරිකාවේ තරුණ තරුණියන් ද හැරිස්ට ඡන්දය දීමට වැඩි නැඹුරුවක් දක්වනු ඇති බවයි දේශපාලන විශ්ලේෂකයන්ගේ අදහස.

ජනමත සමීක්ෂණ අනුව හැරිස් මේ වනවිට ජනාධිපති තරගයේ මඳ වශයෙන් ඉදිරියෙන් සිටියත් ට්‍රම්ප් ඉතා ප්‍රබල තරගකරුවකු බව අමතක කරන්නට බැහැ. තීරණාත්මක ප්‍රාන්ත කිහිපයක ඔහු තවමත් ඉදිරියෙන් සිටිනු දක්නට පුළුවන්. දැනට තිබෙන තත්ත්වය ඕනෑ ම මොහොතක වෙනස් වීමේ හැකියාවක් ඇති බව බොහෝ විශ්ලේෂකයන්ගේ අදහස වී තිබෙනවා.

ට්‍රම්ප්ගේ ජීවිතාරක්ෂාවට තර්ජන එල්ල වෙමින් තිබීම ද ජනාධිපතිවරණය පසුබිමේ විශේෂ අවධානයක් යොමු වන කාරණයක්. ඔහු ඝාතනය කිරීමේ උත්සාහයන් බවට සැක කෙරුණු සිදුවීම් දෙකක් ම පසුගිය මාස කිහිපයේ සිදු වුණා. ඉන් පළමුවැන්න සිදු වූයේ ජූලි මාසයේ. ට්‍රම්ප් පෙන්සිල්වේනියා ප්‍රාන්තයේ දේශපාලන රැස්වීමක් අමතමින් සිටියදී ඒ ආසන්නයේ පිහිටි ගොඩනැගිල්ලක වහලය මත සිට තෝමස් කෲක්ස් නැමැති 20 හැවිරිදි තරුණයෙක් ඔහුට වෙඩි තැබුවා. එම වෙඩි තැබීමෙන් ට්‍රම්ප්ගේ ජීවිතය බේරුණේ අනූනවයෙන්. මුහුණ ආසන්නයෙන් ඇදී ගිය වෙඩි උණ්ඩයට ඔහුගේ කනක් තුවාල වූ අතර මේ සිද්ධියෙන් එම ස්ථානයේ සිටි ට්‍රම්ප්ගේ ආධාරකරුවකු මරණයට පත් වුණා. ට්‍රම්ප් වෙත වෙඩි තැබූ කෲක්ස් ද පොලිස් වෙඩි පහරින් මිය ගියා.

ට්‍රම්ප් ඝාතනය කිරීම සඳහා දරන ලද මේ උත්සාහයෙන් පසු ඔහුගේ ආරක්ෂාව දැඩි කිරීමට පියවර ගැනුණා. එසේ තිබියදීත් පසුගිය සැප්තැම්බර් මාසයේ ද තවත් මෙවැනි ම සිදුවීමක් වුණා. ඒ, ට්‍රම්ප් ෆ්ලොරිඩා ප්‍රාන්තයේ ඔහුගේ නිවස ආසන්නයේ පිහිටි ඔහුට ම අයත් ගොල්ෆ් ක්‍රීඩා පිටියක ක්‍රීඩා කරමින් සිටියදී. ට්‍රම්ප් ක්‍රීඩා කරමින් සිටි ස්ථානයට යාර 500ක් පමණ දුරින් තිබූ පඳුරකින් ගිනි අවියක් එල්ල වී තිබෙනු ආරක්ෂක නිලධාරියකුට දක්ක ගන්නට ලැබී තිබුණා. එම අවස්ථාවේ නිලධාරියා වහා ම එම පඳුර වෙත වෙඩි තබා තිබූ අතර එහි සැඟ ව සිටි පුද්ගලයකු එතැනින් ඉවතට දිව ගොස් මෝටර් රියක නැගී පලා යන්නට පටන් ගෙන තිබුණා. ඔහුගේ මෝටර් රියෙහි ඡායාරූපයක් ගත් කෙනෙක් එසැණින් ම එය ආරක්ෂක අංශ වෙත ලබා දීමට පියවර ගත්තා. එම හෝඩුවාව ඔස්සේ යමින් සැකකරු අල්ලා ගැනීමට ආරක්ෂක නිලධාරීන් සමත් වුණා. අත්අඩංගුවට ගත් සැකකරු 58 හැවිරිදි රයන් රූත් නමැත්තෙක්. මේ සිද්ධිය ද සැලකෙන්නේ ට්‍රම්ප් ඝාතනය කිරීම සඳහා ගන්නා ලද උත්සාහයක් ලෙසින්. මේ සිදුවීම් සම්බන්ධයෙන් මේ වනවිට විමර්ශන පැවැත්වෙනවා.

ඇමරිකානු ජනාධිපති සටන ඉදිරියට යමින් ඇත්තේ මෙවැනි ආන්දෝලනාත්මක, නාටකීය සිදුවීම් පවතිද්දී. ඉදිරි දිනවල ජනාධිපතිවරණ උණුසුම තව තවත් ඉහළ යනු ඇති බව අමුතුවෙන් කිව යුතු නැහැ.

නොවැම්බර් 05 දින පැවැත්වෙන ජනාධිපතිවරණයෙන් ජය ගන්නා අපේක්ෂකයා හෝ අපේක්ෂිකාව හෝ සිය ධුරයේ දිවුරුම් දීමට නියමිත ව ඇත්තේ 2025 ජනවාරි 20 දින. ඒ, ඇමරිකාවේ 47 වැනි ජනාධිපති ලෙසින්.

# කුඩා ම රාජ්‍යය බිහි වන ලකුණු

**සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි**

රටක පිහිටි තවත් රාජ්‍යයක් හැටියට අප මෙතෙක් හඳුනාගෙන තිබුණේ වතිකානය (VATICAN). එයයි ලොව කුඩා ම රාජ්‍යය. අක්කර 109කට ආසන්න බිම්කඩකට සීමා වී ඇති එය රෝමානු කතෝලික පල්ලියේ මූලස්ථානය වන අතර පාප්තුමාගේ නිවහන ද වනවා. එහෙත් මේ රාජ්‍යයටත් වඩා ඉතා ම කුඩා රාජ්‍යයක් බිහිවීමට නියමිත බව සඳහන්. ඒ, ඇල්බේනියාවේ. මෙහි විශේෂත්වය වන්නේ එය මුසල්මානු භක්තික කුඩා කණ්ඩායමක රාජ්‍යයක් වීම. ඒ අනුව මේ රාජ්‍යය අලුතෙන් යුරෝපයේ බිහිවන 'මුස්ලිම්-වතිකානය' බවට පත්වනු ඇති.

තිබෙන සැලසුම් අනුව ස්ථාපිත වුවහොත්, අක්කර 27ක භූමි ප්‍රමාණයකින් යුක්ත එම රාජ්‍යය වතිකානයට වඩා 1/4ක් තරම් අතිශය කුඩා වනු ඇති බවයි පැවසෙන්නේ. පාපන්දු පිටි 14ක තරම් විශාලත්වයක් ඊට අයත්. 'බෙක්ටාෂි ප්‍රජාවේ ස්වෛරී රාජ්‍යය' ලෙස නම් කර තිබෙන මෙහි රටක සියලු ලක්ෂණ ඇතුළත්. ඒ, එයට ම වෙන්වූ රජයක්, ජාතික කොඩියක්, විදේශ ගමන් බලපත්‍රයක්, පරිපාලන ක්‍රමවේදයක් සහ දේශසීමාවක් මෙන් ම ඔවුන්ගේ ම සාහිත්‍යයක්, සංස්කෘතියක් සහ ලිහිල් ආගමික ඇදහිල්ලක් ආදී වශයෙන්. ඒ අනුව බෙක්ටාෂි ප්‍රජාවේ ස්වෛරී රාජ්‍යය යනු යෝජිත යුරෝපීය ක්ෂුද්‍ර රාජ්‍යයක්. පිරිමින් සහ කාන්තාවන් අතර සමානාත්මතාව මෙන් ම ඇඳුම් පැළඳුම් සහ මත්පැන් සම්බන්ධයෙන් පවා වන නිදහස 'ඉවසන' ඉස්ලාමයේ නව අනුවාදයක් ප්‍රවර්ධනය කිරීම සහ ඇතැම් ඉස්ලාම් රාජ්‍යවලට සාපේක්ෂ ව දැඩි නීති ප්‍රතික්ෂේප කළ ඉතා ප්‍රගතිශීලී ජීවන රටාවක් හඳුන්වා දීමයි මෙහි අරමුණ. ඇල්බේනියාවේ අගනුවර වන 'ටිරානා'හි මේ නවීන ආදර්ශමත් රාජ්‍යය පිහිටුවීමට අවසර ලැබෙනු ඇති. මේ විස්මිත කැප කිරීමට අතගැසූ ඇල්බේනියාව යනු මනුෂ්‍යත්වයට ආදරය මූර්තිමත් කළ තෙරේසා මව්තුමිය ලෝකයට දායාද කළ රට ලෙසයි සැලකෙන්නේ.

වතිකාන ආදර්ශය අනුගමනය කරමින්, අනාගත රාජ්‍යයේ පුරවැසිභාවය ලබා දෙන්නේ බෙක්ටාෂි පූජකවරුන්ට සහ රජයේ නිලධාරීන්ට පමණක් ම බව සඳහන්. බෙක්ටාෂි ප්‍රජාවගේ ම රාජ්‍ය නිර්මාණය කිරීමේ අදහස ඇල්බේනියානු අගමැති එඩි රාමා විසින් ඉදිරිපත් කර ඇති අතර එයට එම ආගමේ නායක බාබා මොන්ඩිගේ සහය ලැබී තිබෙනවා. පාප් වහන්සේ වතිකානයේදී කරන ආකාරයට ම ක්ෂුද්‍ර රාජ්‍යයක මුලසුන හෙබවිය හැකි දෙවැන්නා ඔහු. අදහස සාර්ථක වුවහොත් මෙය මුස්ලිම් ලෝකයේ විශ්මයජනක පරිවර්තනයකට මුලපිරීමක් වනු ඇති. ඇල්බේනියාවේ නව රාජ්‍යය නිර්මාණය කිරීම සඳහා නීති කෙටුම්පත් කිරීම 2024 සැප්තැම්බර් මාසයේදී ආරම්භ වී ඇති අතර මේ සඳහා ව්‍යවස්ථා සංශෝධනයකින් ඇල්බේනියානු පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වනවා. මේ නව රාජ්‍යය නිර්මාණය කිරීම සඳහා වන සැලසුම් ඇල්බේනියානු අගමැති සාකච්ඡා කර ඇති අතර බාබා මොන්ඩිගේ සහය ඇති ව ප්‍රාන්තය නිර්මාණය කිරීම සඳහා වැඩි විස්තර නුදුරු අනාගතයේදී අනාවරණය වනු ඇති බව ඔහු ප්‍රකාශ කරනවා.

බෙක්ටාෂිවරු යනු ඇදැහිල්ලේ වෙනස්කම් සහිත ලොව කුඩා මුස්ලිම් ප්‍රජාවක්. ඇල්බේනියාවේ බෙක්ටාෂිවරු, එරට මුස්ලිම් ජනගහනයෙන් 9%ක් සහ රටේ සමස්ත ජනගහනයෙන් 5%ක් වන අතර එරට වෙසෙන සුන්නි මුස්ලිම්වරුන්, ඕතඩොක්ස් ක්‍රිස්තියානින් සහ කතෝලිකයන්ට පසුව ඇල්බේනියාවේ සිව් වැනි විශාලතම ආගමික ප්‍රජාව වනවා. අතිරේක බෙක්ටාෂිවරුන් මිලියන 12.5ක් ජීවත් වන්නේ තුර්කියේ. බෙක්ටාෂි ප්‍රජාව ප්‍රධාන වශයෙන් ඇනටෝලියාව, බෝල්කන් ප්‍රදේශය සහ ඔටෝමාන්





යුගයේ ග්‍රීක මුස්ලිම් ප්‍රජාව අතර පැතිර ඇති බව දක්නට ලැබෙන්නක්. බෙක්ටාෂි ප්‍රජාව ලෙස එය නම් කර ඇත්තේ එහි මුල් ම සාන්තුවරයා වන හාජි බෙක්ටාෂ් වේලිගේ නම අනුව යමින්. බෙක්ටාෂි ප්‍රජාවේ දැනට නායකත්වය දරන්නේ මොන්ඩි වන අතර ඔහු ඔවුන්ගේ අට වැනි ආගමික නායකයා ලෙස පිළිගැනෙනවා.

බොහෝ සූෆිවරුන් මෙන් බෙක්ටාෂිවරු දෛනික මුස්ලිම් නීති පිළිපැදීමේදී තරමක් ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන අතර ස්ත්‍රීන් මෙන් ම පිරිමින් ද චාරිත්‍රානුකූල වයින් පානය කිරීමට සහ භක්ති උත්සවවලදී නැටීමට සහභාගි වනවා. බෝල්කන්හි බෙක්ටාෂිවරු රොටි බෙදාගැනීම සහ පාපොච්ඡාරණය වැනි ක්‍රිස්තියානි වත්පිළිවෙත් ද අනුගත කරගෙන තිබෙන බව සඳහන්.

බෙක්ටාෂි ගුප්ත ලේඛන සූෆි කවියට විශාල දායකත්වයක් ලබාදී ඇති අතර බෙක්ටාෂි ආධ්‍යාත්මිකත්වය සම්ප්‍රේෂණය කිරීමේදී කවිය වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා. ඔටෝමාන් යුගයේ වැදගත් කවියන් කිහිපදෙනකු බෙක්ටාෂිස් වූ අතර තුර්කි භාෂාවේ වඩාත් ම පිළිගත් කවියා වන යුනුස් එම්රේ ද සාමාන්‍යයෙන් බෙක්ටාෂි අනුග්‍රාහකයකු ලෙසයි පිළිග ැනෙන්නේ.

එඩි රාමා සහ බාබා මොන්ඩි






බෙක්ටාෂි ප්‍රජාව 13 වැනි සියවසේ ඇනටෝලියාවෙන් ආරම්භ වූ සහ ඔටෝමාන් අධිරාජ්‍යයේ ව්‍යාප්ත වූ ඉස්ලාමීය සූෆි ආගමික ගුප්ත කණ්ඩායමක්. ඔටෝමාන් අධිරාජ්‍ය සමයේ සිටි ප්‍රමුඛ හමුදාව වන ජැනිසරිවරු එහි දේශපාලනයේ ප්‍රමුඛ බලවේග යක් බවට පත් ව තිබෙනවා. ඔවුන් සිය බලකායේ ආගම ලෙස අනුගමනය කළේ බෙක්ටාෂිස්වාදය. එම බලපෑම නිසා බෙක්ටාෂි පැතිරීම සහ පිළිගැනීම ඉහළ ගියා. මුලින් එය සුන්නි ඉස්ලාමයේ සූෆි කණ්ඩායම්වලින් එකක් වූ අතර 16 වැනි සියවස වන විට  ෂියා ඉස්ලාමයේ ඇතැම් මූලධර්ම ද සම්මත කර ගත්තා. ඒ අනුව මුහම්මද්තුමාගේ බෑනා වන අලි සහ ඉමාම්වරුන් දොළොස් දෙනා නමස්කාරය ද මේ ආගමට ඇතුළු වුණා. සෙසු ලෝකයා ඔවුන් පොදුවේ සුන්නි ඉස්ලාම් ප්‍රජාවට ම අයත් වන ලෙස සැලකුවත් කුරාණය අදහන අනෙකුත් මිනිසුන්ට වඩා බෙක්ටාෂිවරුන් මිථ්‍යාදෘෂ්ටිකයන් ලෙස සලකන ඇතැම් ෂියාවරුන් සහ සුන්නිවරුන්ගෙන් මේ ප්‍රජාව දැඩි හිංසා පීඩාවලට මුහුණ දී තිබෙනවා. ඒ, ඔවුන්ගේ ප්‍රතිසංස්කරණවාදී වඩාත් නිදහස්කාමී හැසිරීම නිසා.

මේ අන්දමට තමන් ජීවත්වන රාජ්‍යවල අවසරයකින් තොර ව වෙන ම ජන කණ්ඩායමක් ලෙස සහ බලධාරීන්ගේ හිරිහැර සහිත ව ඔවුන් සිය ආගම ඇදහීම දිගට ම පවත්වාගෙන ගියා. බොහෝ පිරිස් නැගෙනහිර ඇනටෝලියානු සහ ඇල්බේනියානු උස්බිම් වැනි අවම රජයේ පාලනයක් සහිත ග්‍රාමීය ප්‍රදේශවලට කැමැත්තක් දක්වූ බවයි සඳහන් වන්නේ. 1925 වසරේදී ඔටෝමාන් අධිරාජ්‍යය විසුරුවා හැරීමෙන් පසු සහ තුර්කියේ ජනරජය පිහිටුවීමෙන් පසුව ජනාධිපති මුස්තාෆා කෙමාල් අටටුර්ක් බෙක්ටාෂිවරු ඇතුළු සියලු ම කුඩා ප්‍රජා තහනම් කර දැමුවා. එහි ප්‍රතිඵලයක් ලෙස, බෙක්ටාෂි නායකත්වය ඔවුන්ගේ මූලස්ථානය තුර්කියේ සිට අල්බේනියාවේ කඳුකරයෙන් වට වූ සුන්දර ටිරානා නගර වෙත ගෙන ගියා. එලෙස කලක් ලොව විසිර යාමකට ලක්වූ මේ පිරිස පසුව ඇල්බේනියාව වෙත එක් රැස් ව තිබෙනවා. ඒ අනුව ඔවුන්ගේ නිල නොලත් ලෝක මූලස්ථානය ලෙස ඇල්බේනියාවේ ටිරානා අගනගරය සහ ආශ්‍රිත උස්බිම් ප්‍රදේශ සැලකුණා.

1967 වසරේදී මේ ආගම තහනම් කළ හිටපු ඇල්බේනියානු කොමියුනිස්ට් නායක එන්වර් හොක්ෂා යටතේ බෙක්ටාෂි ප්‍රජාවේ ජනප්‍රියතාව අඩු වුණා. ඔහුගේ රජය බෙක්ටාෂි ලෝක මූලස්ථානයට අයත් ඉඩම් කොටස් මත ගබඩා ඉදි කළා. ඇල්බේනියාවේ කොමියුනිස්ට්වාදය බිඳවැටීමෙන් පසු පුද්ගලික සංවර්ධකයන් ද අවසරයකින් තොර ව බෙක්ටාෂින්ගේ දේපළ අද්දර නිවාස ඉදිකරන විට ඔවුන්ට තවත් ඉඩම් අහිමි වූ අතර 2023 වසර වන විට ඇල්බේනියාවේ ජනගහනයෙන් 5%ක් පමණක් බෙක්ටාෂිවරුන්  ඇතැයි ගණන් බලා තිබුණා.

2024 සැප්තැම්බර් 21 දින වත්මන් ඇල්බේනියානු අගමැති එඩි රාමා, ඇල්බේනියාවේ සහ ලෝකයේ සෙසු රටවල ඉස්ලාම් දහම පිළිබඳ වඩාත් ධනාත්මක අදහස් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙන් ම වෙනත් ආගම් ඉවසීම පිළිබඳ ආදර්ශයක් ලබාදීමට බෙක්ටාෂි ප්‍රජාවේ ස්වෛරී රාජ්‍යය නිර්මාණය කිරීමට සැලසුම් කරන බව නිවේදනය කළා. ඒ අනුවයි දැන් ලොව නවතම හා අතිශය කුඩා වෙන ම රජ්‍යය බිහිවන්නට සූදානම් වන්නේ.

---

# බල පෙරළියෙන් ජන පෙරළියට

දීප්ත කුමාර බටගොඩ

ශ්‍රී ලංකා දේශපාලනයේ සුවිශේෂ සන්ධිස්ථානයක් නොබෝදා පසු කළා. බොහෝ විද්වතුන් සඳහන් කරන ආකාරයට මෙය දේශපාලනයේ නව පරිවර්තනීය වෙනසක්. ශ්‍රී ලංකාවේ නව වැනි විධායක ජනාධිපතිවරයා පත් වීම එලෙස ඉතිහාසයේ පෙර නොවූ විරූ ආකාරයෙන් සමාජයේ යම් කතාබහක් නිර්මාණය කර තිබෙනවා. කුමක් ද මේ වෙනස? එහි සමාජ, ආර්ථික, දේශපාලන බලපෑම කුමක් විය හැකි ද? මෙවර 'දෙසතිය' කවරයේ කතාව ලියැවෙන්නේ ඒ පිළිබඳ ව.



මෙරට දේශපාලන ඉතිහාසයේ රටේ නායකයා, එනම් ජනාධිපතිවරයා පත් වන්නේ ජනතා ඡන්දයෙන්. එනම් ව්‍යවස්ථානුකූල ව ජනතා පරමාධිපත්‍ය බලයෙන්. එම බලය දේශපාලන නායකයන් වෙත ලබා දීමටත් නැවත ඔවුන්ගෙන් එම බලය ලබා ගැනීමටත් හැකි බව ඉතිහාසය ඔප්පු කර අවසන්. 2024 සැප්තැම්බර් 21 දින පැවති ජනාධිපතිවරණයෙන් ශ්‍රී ලංකාවේ නව වැනි විධායක ජනාධිපතිවරයා ලෙස අනුර කුමාර දිසානායක පත් වන්නේ සැබවින් ම තියුණු තරගයකින්. කෙසේ වෙතත් රටේ ජනතාව අපේක්ෂා කළ දේශපාලන වෙනසක ගැලවුම්කරු ලෙස ඔහු පත් කර ගන්නේ ශ්‍රී ලංකාවේ දේශපාලන නව කියවීමකට ඉඩකඩ විවර කර දෙමින් බව පැවසීම සාවද්‍ය නොවනු ඇති.

## විධායක ජනාධිපති ක්‍රමය සහ ඉතිහාසය

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දෙවැනි සංශෝධනය අනුව විධායක ජනාධිපති ධුරය ස්ථාපිත කෙරුණා. ඒ අනුව ශ්‍රී ලංකාවේ පළමු වැනි විධායක ජනාධිපතිවරයා වූයේ ජේ. ආර්. ජයවර්ධන. ඔහු 1977 පැවති මහා මැතිවරණයෙන් 5/6ක බලයක් ලබාගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති කරන ලද සංශෝධනයකිනුයි විධායක ජනාධිපති ධුරයට පත් වූයේ. බොහෝ දේශපාලන විශ්ලේෂකයන් පෙන්වා දුන්නේ ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ධුරයට අසීමිත බලයක් පවතින බවක්. ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට කළ නොහැක්කේ 'කාන්තාවක පුරුෂයකු කිරීම හෝ පුරුෂයකු කාන්තාවක කිරීම පමණක් ය' යන්න ජන සමාජයේ ප්‍රසිද්ධ කියමනක් බවට පත් වූයේ මේ නිසා. ජේ. ආර්. ජයවර්ධන දරුවේ ජනාධිපති ධුර කාල දෙකක්. ඉන්පසුව දෙවැනි විධායක ජනාපති ලෙස පත් වන ආර්. ප්‍රේමදාස 1993 මැයි 01 දින ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරයකින් මිය යාමත් සමග ඩී. බී. විජේතුංග ජනාධිපති ධුරයේ වැඩ බැලීම සඳහා පත් වූ අතර 1994 නොවැම්බර් 12 දින දක්වා ඔහු ජනාධිපතිවරයා වශයෙන් ක්‍රියා කළා. විධායක ජනාධිපති ධුරය හඳුන්වා දීමෙන් පසුව පළමු ජනාධිපතිවරු තිදෙනා ම පත් වූයේ දක්ෂිණාංශික දේශපාලනයේ නිරත යැයි සම්මත එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින්.

1994දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළ චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපති ධුරයට පත් වූයේ වාමාංශික පක්ෂයක් ලෙස සලකන ලද පක්ෂයක නියෝජිතයකු ජනාධිපති වූ පළමු අවස්ථාව ලෙස ඉතිහාසගත වෙමින්. ඇය සියයට 62.27ක ජයක් ලබා ගත්තා. මෙතෙක් ඉතිහාසයේ විධායක ජනාධිපති ධුරය සඳහා තරග කිරීමේදී වැඩි ම ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත් අපේක්ෂකයායි ඇය. 1999/2000 ජනාධිපතිවරණයේදී දෙවැනි වරටත් ඇය ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ලෙසින් පත් වුණා. ඉන්පසුව 2005 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පස් වැනි විධායක ජනාධිපතිවරයා වශයෙන් මහින්ද රාජපක්ෂ බලයට පත්වූයේ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු පක්ෂ කිහිපයක සන්ධානගත වීමෙන්. 2009 වර්ෂයේ උතුරු-නැගෙනහිර යුද්ධය නිමා කිරීමේ ජනප්‍රසාදය ද රැගෙන ඔහු දෙවැනි වරටත් ජනාධිපති ධුරයට පත් වුණේ සියයට 57.8ක ජනවරමක් ලබාගනිමින්. ව්‍යවස්ථා සංශෝධනයකින් පසුව තුන් වැනි වරටත් ජනාධිපති ධුරය සඳහා තරග කිරීමට මහින්ද රාජපක්ෂ ඉදිරිපත් වුවත් 2015 වර්ෂයේදී ජනාධිපති ධුරය සඳහා ජනතාව පත් කර ගත්තේ පොදු අපේක්ෂකයකු ලෙසින් ඉදිරිපත් වූ මෛත්‍රීපාල සිරිසේන. එවකට අගමැති රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව සහ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන අතර ඇති වූ විවිධ දේශපාලන ගැටලුකාරී තත්ත්ව සහ පාස්කු ප්‍රහාරය වැනි සමාජමය ගැටලුකාරී



තත්ත්ව සමග 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ අට වැනි ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් වුණා. එහිදී ජනාධිපති ධුරයට පත් වුණේ ගෝඨාභය රාජපක්ෂ. පාලනයට එරෙහි ව ඇති වූ ජනතා විරෝධය හමුවේ ඔහු සිය ධුරයෙන් 2022 වර්ෂයේදී ඉල්ලා අස් වූ අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ බහුතර ඡන්දයෙන් (134) රනිල් වික්‍රමසිංහ අට වැනි විධායක ජනාධිපතිවරයා වශයෙන් පත් වුණා.

## බල පෙරළියක්

ශ්‍රී ලංකාවේ නව වැනි ජනාධිපතිවරණය පැවැත්වුණේ 2024 සැප්තැම්බර් 21 දින. වැඩි ම අපේක්ෂකයන් ගණනක් තරග කළ ජනාධිපතිවරණය ලෙසත් අපේක්ෂකයන් තිදෙනකු අතර තියුණු තරගකාරීත්වයක් පැවති ජනාධිපතිවරණයක් ලෙසත් එය සමාජයේ දැඩි කතාබහට ලක් වුණා.

2024 ජනාධිපතිවරණයේදී ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව 17,140,354ක් වූ අතර ඉන් 13,619,916ක් (සියයට 79.46) ඡන්දය ප්‍රකාශ කර තිබුණා. වලංගු ඡන්ද සංඛ්‍යාව 13,319,616 (සියයට 97.8)ක්. ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව 300,300 (සියයට 2.2)ක්. ජාතික ජන බලවේග යේ අනුර කුමාර දිසානායක ඡන්ද 5,634,915ක් (සියයට 42.31) ද සමගි ජන බලවේගයේ සජිත් ප්‍රේමදාස 4,363,035ක් (සියයට 32.76) ද ස්වාධීන අපේක්ෂකයකු ලෙස ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ එවක ජනාධිපති රනිල් වික්‍රමසිංහ ඡන්ද 2,299,767ක් (සියයට 17.27) ද ලබාගෙන තිබුණා. කිසි ම අපේක්ෂකයකුට සියයට 50ක් ලබා ගැනීමට නොහැකි වූ හෙයින් ඉතිහාසයේ පළමු වතාවට දෙවැනි මනාපය ගණනය කිරීමට මැතිවරණ කොමිසම තීරණය කළ අතර එහිදී ද අනුර කුමාර දිසානායක අභිභවා යාමට සජිත් ප්‍රේමදාසට හැකියාව ලැබුණේ නැහැ. ඒ අනුව අනුර කුමාර දිසානායක ශ්‍රී ලංකාවේ නව වැනි විධායක ජනාධිපතිවරයා වශයෙන් පත් වුණා.

අනුර කුමාර දිසානායක ශ්‍රී ලංකාවේ නව වැනි ජනාධිපතිවරයා වශයෙන් පත් වීම විදෙස් රටවල ජනමාධ්‍යවල ද විශේෂ ප්‍රවෘත්තියක් වුණා. බීබීසී පුවත් සේවය ඔහු හඳුන්වා දී තිබුණේ "දුප්පතුන් වෙනුවෙන් පෙනී සිටින වෙනස් නායකයෙක්","හිටපු මාක්ස්වාදියෙක්" ලෙසින්. The Hindu වෙබ් අඩවිය පවසා තිබුණේ "ප්‍රභූ පැලැන්තියෙන් වෙනස් වූ, ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව ඉල්ලා සිටි වෙනස නියෝජනය කළ එක ම ජනාධිපති අපේක්ෂකයා" ලෙසින්. පාරිසරික හා මානව හිමිකම් ක්‍රියාකාරිනියක වන මෙලනි ගුණතිලක "ජනතාවගේ වේදනාව අව්‍යාජ ලෙස තේරුම් ගන්නා කම්කරු පන්ති

පසුබිමක ජනාධිපතිවරයකු ශ්‍රී ලංකාවට ඉතා අවශ්‍ය ව තිබුණා” යනුවෙන් අල් ජසීරා වෙබ් අඩවියට පවසා තිබුණා.

නව වැනි ජනාධිපතිවරයාගේ සම්ප්‍රාප්තිය සාම්ප්‍රදායික බල විතැන් වීමෙන් ඔබ්බට ගොස් සිදු වූ සුවිශේෂ බල පෙරළියක් බවට පත්වීමට හේතු කිහිපයක් බලපා තිබෙනවා. ඇතැමුන් පවසන පරිදි ශ්‍රී ලංකාවේ ප්‍රභූ පැළැන්තියෙන් සාමාන්‍ය පන්තියේ පුද්ගලයකුට බල හුවමාරුව සිදු වූ පළමු අවස්ථාවයි මෙය. ඊට පෙර ආර්. ප්‍රේමදාස විධායක ජනාධිපතිවරයා වශයෙන් පත් වුව ද ඔහු නියෝජනය කරන ලද්දේ දක්ෂිණාංශික දේශපාලනයේ ධනපති පන්තිය ම බව ඔවුන් පෙන්වා දෙනවා.


මේ බල පෙරළිය, දිගුකාලීන ව රටේ සිදුවෙමින් තිබූ දුර්වල ආර්ථික කළමනාකරණයේත් දේශපාලන අස්ථාවරත්වයේත් ප්‍රතිඵලයක් ලෙසින් ක්‍රමවේදයේ වෙනසක් ඉල්ලා සිටි ශ්‍රී ලංකා තාරුණ්‍යයේ විකල්ප දේශපාලනයේ නියෝජනයක් බවයි ඇතමුන්ගේ අදහස. කොවිඩ් වසංගතය සහ රටේ ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ මෙතෙක් පැවති දේශපාලන පක්ෂ කෙරෙහි ජනතාව තුළ ඇති ව තිබූ අප්‍රසාදය පළ කිරීමක් ලෙසිනුත් මෙය අර්ථ දක්වා තිබුණා.

කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හෂාන් විජේසිංහ පවසන්නේ නිදහසින් පසුව ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් අතර එනම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ප්‍රධාන දේශපාලන කණ්ඩායම් දෙක වෙත හුවමාරු වූ ශ්‍රී ලංකාවේ දේශපාලන බලය පළමු වතාවට ජාතික ජන බලවේගය වැනි පක්ෂයට විතැන් වීම ම සුවිශේෂි වූ තත්ත්වයක් බව. 1965 වර්ෂයේ බිහි වූ දේශපාලන පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුණ විවිධ හැලහැප්පීම් ඔස්සේ ගමන් කරමින් පසුකාලීන ව වෙනත් සංවිධාන කිහිපයක් සමග සන්ධානගත වීමකින් පසුව ‘ජාතික ජන බලවේගය’ නමින් 2019 වර්ෂයේදීයි නව දේශපාලන ගමන් මගකට පිවිසුණේ.

මේ ජනාධිපතිවරණය ද අන් කවර මැතිවරණයකටත් වඩා සුවිශේෂ

නව වැනි ජනාධිපතිවරයාගේ සම්ප්‍රාප්තිය සාම්ප්‍රදායික බල විතැන් වීමෙන් ඔබ්බට ගොස් සිදු වූ සුවිශේෂ බල පෙරළියක් බවට පත්වීමට හේතු කිහිපයක් බලපා තිබෙනවා. ඇතැමුන් පවසන පරිදි ශ්‍රී ලංකාවේ ප්‍රභූ පැළැන්තියෙන් සාමාන්‍ය පන්තියේ පුද්ගලයකුට බල හුවමාරුව සිදු වූ පළමු අවස්ථාවයි මෙය. ඊට පෙර ආර්. ප්‍රේමදාස විධායක ජනාධිපතිවරයා වශයෙන් පත් වුව ද ඔහු නියෝජනය කරන ලද්දේ දක්ෂිණාංශික දේශපාලනයේ ධනපති පන්තිය ම බව ඔවුන් පෙන්වා දෙනවා.

වූවක් ලෙසින් දේශපාලන විශ්ලේෂකයන් පෙන්වා දෙනවා. සාමාන්‍යයෙන් මෙයට පෙර පැවති ජනාධිපතිවරණවලදී අපේක්ෂකයන් දෙදෙනකු අතර පමණක් පැහැදිලි තරගයක් පැවති බව පෙනී යන කරුණක්. දරුණු ගණයේ ආර්ථික අර්බුදයකින් පසුව වුවත් එය පූර්ණ ලෙසින් පහ ව නොගිය කාලයක, ප්‍රධාන දේශපාලන පක්ෂවල පදනම දෙදරා ගොස් තිබූ අවස්ථාවක විවිධ පක්ෂවල සහ ස්වාධීන අපේක්ෂකයන් 39 දෙනකු තරග කළ 2024 ජනාධිපතිවරණයේ ජයග්‍රාහකයා කවුරුන් ද යන්න පිළිබඳ පුරෝකථනය කිරීම පවා අසීරු තත්ත්වයකයි පැවතුණේ. මේ නිසා ජයග්‍රහණය කරන අපේක්ෂකයා පිළිබඳ විවිධ සමීක්ෂණ ප්‍රතිඵල ආශ්‍රයෙන් විවිධ පුරෝකථන රාශියක් ද ඉදිරිපත් වී තිබුණා. අතිශයින් තියුණු තරගකාරී වටපිටාවක් පැවතුණ ද ජනාධිපතිවරණයේ විශේෂ ලක්ෂණයක් වුණේ පූර්ව හා පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අවම වීම. කිසිදු ජීවිත හානියක් සිදු නොවූවා පමණක් නොව, වෙනත් ආකාරයේ බරපතල ප්‍රචණ්ඩ ක්‍රියා ද වාර්තා වී තිබුණේ නැහැ. ප්‍රචාරක රැළිවලදී පශ්චාත් ප්‍රචණ්ඩ ක්‍රියා බහුල වනු ඇති බවට ඇතැම් අපේක්ෂකයන් ප්‍රකාශ කළ ද




එවැන්නක් සිදු වූයේ ද නැහැ. එය ශිෂ්ට සම්පන්න වූ, ඉහළ දේශපාලන සාක්ෂරතාවකින් යුත් ජන සමාජයක දැකිය හැකි ලක්ෂණයක්. ජනාධිපතිවරයකු සිය ධුරයෙන් ඉල්ලා අස්වීමට පෙළඹවීමට තරම් ජනතා විරෝධයක් පැවති සමයකින් පසුව පවත්වන ජනාධිපතිවරණයකදී මෙවැනි තත්ත්වයක් ඇති වීම ද සුවිශේෂ තත්ත්වයක්.

## ලොව කුඩා ම කැබිනෙට්ටුව

අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරු ව අන්තර්වාර කැබිනට් මණ්ඩලය පත් කළ අතර එය සමන්විත වුණේ තිදෙනකුගෙන්. ලෝකයේ කුඩා ම කැබිනට් මණ්ඩලය ලෙසින් ඇතැමුන් එය අර්ථ දක්වා තිබෙනවා. නව අගමැති වශයෙන්

පත් වුණේ ආචාර්ය හරිනි අමරසූරිය. නව භාරකාර ආණ්ඩුවේ අමාත්‍යාංශ 15ක් මෙහෙයවනු ලබන්නේ ජනාධිපතිවරයා, අගමැතිවරිය හා කැබිනට් ප්‍රකාශක විජිත හේරත් යන තිදෙනා.

තම කැබිනට් මණ්ඩලය පත්කර ගැනීමෙන් අනතුරු ව අභිනව ජනාධිපතිවරයා විසින් 2024 සැප්තැම්බර් 24 මධ්‍යම රාත්‍රියේදී පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවා.



ඒ අනුව මැතිවරණ කොමිසන් සභාව පවසන පරිදි 2024 නොවැම්බර් 14 දින පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීම පැවැත්වෙනු ඇති.

## ජනතා අපේක්ෂා සහ ජාතික ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික අර්බුදයත් සමග ජනතා අවශ්‍යතා තෘප්ත කර ගැනීම ඉතා දුෂ්කර කාර්යයක් වුණා. කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා දැමීම නිසා මේ තත්ත්වය වඩාත් දරුණු වුණා. ව්‍යාපාර වසා දැමීමට සිදු වීම නිසා පුද්ගල ආදායම අවම වුණා. විදේශ සංචිත හිඟ වීම නිසා අත්‍යාවශ්‍ය භාණ්ඩ පවා ආනයනය කළ නොහැකි තත්ත්වයකුයි උදා වී තිබුණේ. ලෝක බැංකුවට අනුව 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව දෙගුණයකින් පමණ වර්ධනය වූ බවත් එය සියයට 25ක් පමණ වන බවත් ඇස්තමේන්තු කර තිබුණා. මේ නිසා මහජනතාව වීදි පුරා තැන තැන අරගල කරන්නටත් පසුව එය ජනාධිපතිවරයා ඇතුළු ජනතා නියෝජිතයන් ප්‍රතික්ෂේප කරන තත්ත්වයටත් පත් වුණා. මේ සඳහා හේතු වූයේ එතෙක් රට පාලනය කළ ජනතා නියෝජිතයන්ගේ දුර්වල කළමනාකරණය සහ දූෂිතභාවය යැයි ජනතාව විශ්වාස කළා. එම නිසා පවතින ක්‍රමවේදයේ වෙනසකුත් දූෂිත පාලකයන්ගේ වෙනසකුත් ජනතාව බලාපොරොත්තු වුණා. මෙවර ජනාධිපතිවරණයේදී අනුර කුමාර දිසානායක ජනාධිපති වශයෙන් තෝරා පත් කර ගැනීමේ ප්‍රධාන ජනතා අපේක්ෂා දෙකක් පවතින බව උපකල්පනය කරන්න පුළුවන්. ඉන් පළමුවැන්න වංචා හා දූෂණ අවම කිරීමත් දූෂිතයන් සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමත්. දෙවැන්න නම් ඉසිලිය නොහැකි තරම් වූ ජීවන බර සැහැල්ලු කර ගැනීමත් ස්ථාවර වූ යහපත් ජීවන තත්ත්වයක් පවත්වාගෙන යා හැකි පරිදි ආර්ථිකය පරිසරය සකස් කර ගැනීමත්. මෙය ඉතා සරල කාරණා ලෙසින් හැඟී ගිය ද නීතියේ ආධිපත්‍යය, විනිවිදභාවය, වගවීම, වගකීම වැනි යහපාලනයේ අන්තර්ගත කරුණු සියල්ල ම පාහේ ඇතුළත් වන අපේක්ෂා. ඒ අනුව වත්මන් ජනාධිපතිවරයාට මේ ජනතා අපේක්ෂා ඉටු කිරීමේ වගකීම පැවරී ඇත්තේ ඉතා සංකීර්ණ වූ දේශපාලනික, සමාජ හා ආර්ථික සන්දර්භයකදී බව කිව යුතු නැහැ.

> මේ බල පෙරළිය, දිගුකාලීන ව රටේ සිදුවෙමින් තිබූ දුර්වල ආර්ථික කළමනාකරණයේත් දේශපාලන අස්ථාවරත්වයේත් ප්‍රතිඵලයක් ලෙසින් ක්‍රමවේදයේ වෙනසක් ඉල්ලා සිටි ශ්‍රී ලංකා තාරුණ්‍යයේ විකල්ප දේශපාලනයේ නියෝජනයක් බවයි ඇතමුන්ගේ අදහස. කොවිඩ් වසංගතය සහ රටේ ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ මෙතෙක් පැවති දේශපාලන පක්ෂ කෙරෙහි ජනතාව තුළ ඇති ව තිබූ අප්‍රසාදය පළ කිරීමක් ලෙසිනුත් මෙය අර්ථ දක්වා තිබුණා.

ජනාධිපතිවරණයේදී ඉදිරිපත් වූ බොහෝ ප්‍රතිපත්ති ප්‍රකාශන ජනතා අපේක්ෂාවලට ආමන්ත්‍රණය කර තිබුණා. සෑම ප්‍රතිපත්ති ප්‍රකාශනයක ම වංචා හා දූෂණ වැළැක්වීමටත් ජනතාවට විවිධ සහන ලබාදෙන බවටත් ප්‍රකාශ වී තිබුණා. වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායකගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල පහළ හෙළීම (බදු ඉවත් කිරීම හෝ සහන සැලසීම), බදු ක්‍රමය සංශෝධනය කිරීම හා වංචා දූෂණ වැළැක්වීම සහ නීතියේ ආධිපත්‍ය සුරැකීම යන කරුණු අන්තර්ගත වුණා. ඉදිරියේදී රටේ ආර්ථික වර්ධනය සියයට 8ක පමණ පවත්වාගෙන යමින් රටේ ස්ථාවර සංවර්ධනයක් ඇති කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳවත් එහි සඳහන්.

## ඉදිරි අභියෝග

ඕනෑ ම රජයක ප්‍රධානතම වගකීම ද පරමාර්ථය ද විය යුත්තේ පුරවැසියාගේ යහපත් ජීවන පැවැත්මට අවශ්‍ය

## ශ්‍රී ලංකා ජනාධිපතිවරණය 2024

| අපේක්ෂකයා | දේශපාලන පක්ෂය | ලබාගත් ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| අනුර කුමාර දිසානායක | ජාතික ජන බලවේගය | 5,634,915 | 42.31% |
| සජිත් ප්‍රේමදාස | සමගි ජන බලවේගය | 4,363,035 | 32.76% |
| රනිල් වික්‍රමසිංහ | ස්වාධීන අපේක්ෂක | 2,299,767 | 17.27% |
| නාමල් රාජපක්ෂ | ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ | 342,781 | 2.57% |
| අරයිනේත්‍රුම් පාක්කියසෙල්වම් | ස්වාධීන අපේක්ෂක | 226,343 | 1.70% |

මූලාශ්‍රය - මැතිවරණ කොමිසන් සභාව

සමාජ, දේශපාලනික හා සංස්කෘතික වටපිටාව ප්‍රශස්ත මට්ටමකින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික පද්ධතිය නිසි පරිදි පවත්වාගෙන යාම. ඒ සඳහා කෙටිකාලීන, මැදිකාලීන හා දිගුකාලීන වූ උපායමාර්ගික සැලසුමක් අවශ්‍ය වෙනවා. එම නිසා බලයට පත්වන ඕනෑ ම ආණ්ඩුවක් තම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු උපායමාර්ගික සැලසුම ඒ සඳහා වූ විශේෂඥ දැනුමින් යුතු කණ්ඩායමකගේ අනුදැනුමින් සකස් කළ යුතු වෙනවා. ඉදිරියේදී ශ්‍රී ලංකාවේ බිහිවන නව පාර්ලිමේන්තුවේ ප්‍රධාන වගකීම හා අභියෝගය ද වනු ඇත්තේ එය. විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර ඇතිවන ගැටුම්වලින් ද පීඩාවට පත්වන්නේ රටේ පුරවැසියාම බව මෑතකාලීන අත්දැකීම් විමසන විට පෙනී යන කාරණයක්.

දෙවැනි ව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග වූ ගිවිසුම ප්‍රකාර ව ජනතාවට සහන සලසමින් රාජ්‍ය ආදායම ඉහළ මට්ටමක පවත්වා ගැනීම ද ඉදිරියේදී රජය මුහුණ දිය යුතු අභියෝගයක් වනු ඇති. ජනතාවට සහන සැලසීමේදී රාජ්‍ය වියදම් ඉහළ යාම පමණක් නොව රාජ්‍ය බදු ආදායමේ පහළ යාමක් ද සිදු වීමේ හැකියාව තිබෙනවා. එය රජයේ අයවැය ලේඛනයට අමතර බරක් වනු ඇති. මේ නිසා බදු මූලධර්ම අනුව බදු ගෙවිය යුතු සියලු පාර්ශ්ව බදු දැලට හසු කර ගැනීමටත් ඒ සඳහා අවශ්‍ය බදු ක්‍රමයේ සංශෝධන සහ සංවර්ධනය සිදු කිරීමටත් පියවර ගත යුතු වෙනවා. අවුරුදු 18ට වැඩි සියලු පුද්ගලයන් සඳහා බදු ගොනුවක් විවෘත කිරීම පිළිබඳ පසුගිය කාලයේ කතාබහක් ඇති වුවත් එය මෙතෙක් සිදු වී නැහැ. ඒ සඳහා පවතින ගැටලු හඳුනාගෙන එය කඩිනම් කිරීමෙන් බදු පදනම පුළුල් කර ගැනීම කළ යුතු වෙනවා. බදු පැහැර හැරීමකදී ව්‍යාපාර බංකොලොත්භවයට පත් නොවන පරිදි ඒවා අය කර ගැනීමට හා ඒ සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම ද අවධානය යොමු කළ යුතු කරුණක්. සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ද ඉලක්කගත මට්ටමින් සිදු කිරීමත් අවදානම් පිරිස් සඳහා සහන සැලසීමේදී අවදානම් කාල සීමාව සහ ඉන් ඔබ්බට ගමන් කිරීමේ හැකියාව පිළිබඳ පූර්ව ඉලක්කයකින් යුතු ව ක්‍රියාත්මක වන වැඩසටහනක් හඳුන්වා දීමත් වැදගත්. ශ්‍රම බලකායේ ස්ත්‍රී දායකත්වය සහ ශ්‍රම බලකායේ නිපුණත්වය රටේ සංවර්ධනයට සෘජු ව ම දායක වන පරිදි මැදිකාලීන හා දිගුකාලීන සැලසුම්වල අවශ්‍යතාවත් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වැදගත්.

රටේ පවතින ණය අර්බුදය විසඳා ගැනීමේදී මෙන් ම ආර්ථික වර්ධනය ස්ථාවර ව පවත්වා ගැනීමේදී අපනයන



ප්‍රවර්ධනය හා විවිධාංගීකරණයෙන් විදේශ විනිමය ඉපයුම් ප්‍රමාණය ඉහළ මට්ටමකට ගෙන ඒම කළ යුතු වෙනවා. ඒ සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩලයේ සහය ලබා ගැනීමෙන් රටේ සංචාරක කර්මාන්තය, විදේශ ආයෝජන අවස්ථා හා විදේශ රැකියා අවස්ථා ලබා ගැනීම ආදියෙන් කෙටිකාලීන වශයෙන් විදේශ විනිමය ඉපයුම් ඉහළ දමා ගැනීම පවතින තත්ත්වය ස්ථාවර ව පවත්වා ගැනීමටත් දිගුකාලීන සැලසුම් බාධාවකින් තොර ව ක්‍රියාත්මක කිරීමටත් පහසුකාරකයක් වනු ඇති. විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා නීතිමය සහ අනෙකුත් බාධක හා ගැටලු හඳුනාගෙන ඒ සඳහා කඩිනම් විසඳුම් ලබාදීමෙන් ප්‍රාග්ධනය මෙන් ම රටේ නිෂ්පාදනය ද වර්ධනය කර ගැනීමට රුකුලක් වනු ඇති.

රජයකට තම අරමුණු ඉටු කර ගැනීම සඳහා රට පිළිබඳ කෙටිකාලීන, මැදිකාලීන හා දිගුකාලීන සැලසුම් හා බලාපොරොත්තු ඇතිවාක් මෙන් ම ජනතාවට ද කෙටිකාලීන, මැදිකාලීන හා දිගුකාලීන අරමුණු ඇති බවටත් රජයේ සහ රටවැසියාගේ අරමුණු සමපාත වී එක ම ගමන් මාර්ගයක කළහොත් දෙපාර්ශ්වයේ ම අරමුණු ජය ගත හැකි බවටත් ලෝක ආදර්ශ තිබෙනවා. ඒ සඳහා වූ නීතියේ ආධිපත්‍යය හා දේශපාලන ස්ථාවරත්වය ඇති කර ගැනීම සමස්ත ශ්‍රී ලාංකිකයන්ගේ වගකීම වනු ඇති.



# අපේක්ෂා කළ 'ක්‍රමයේ වෙනසක' ප්‍රතිඵලයක්



මහචාර්ය
**නිර්මාල් රංජිත් දේවසිරි**
ඉතිහාස අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ මෑතකාලීන දේශපාලන බල පෙරළිය සුවිශේෂ තත්ත්වයක් වීමට හේතු කිහිපයක් බලපානවා. මේ බල පෙරළිය ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ ක්‍රමයේ දිගුකාලීන ව ඇතිවෙමින් තිබූ පරිහානියත් සමග සිදු වීම විශේෂිත කාරණාවක්. 2022 වර්ෂයේදී ඇති වූ ජනතා නැගිටීම හේතුවෙන් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ විශාල කඩා වැටීමකට ලක් වුණා. රනිල් වික්‍රමසිංහ ජනාධිපති ධුරයට පත්වීමෙන් පසුව එම තත්ත්වය තවදුරටත් බරපතළ වුණා. මේ නිසා නිර්මාණය වුණේ විශාල දේශපාලන රික්තයක්. ඒ හේතුවෙන් ජාතික ජන බලවේගය දෙසට ජනතා ආකර්ෂණය යොමු වීමක් දක්නට ලැබුණා. විශේෂයෙන් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ බිඳ වැටීමත් සමඟ, ඔවුන්ට ඡන්දය පාවිච්චි කළ පිරිසගේ ආකර්ෂණය ලබා ගැනීමට සමගි ජන බලවේගයට හෝ එක්සත් ජාතික පක්ෂයට හෝ හැකියාවක් ලැබුණේ නැහැ. ජාතික ජන බලවේග යේ ජනතා විමුක්ති පෙරමුණ දිගු කාලයක් ලංකාවේ ක්‍රියාකාරී දේශපාලන ව්‍යාපාරයක් ලෙස ක්‍රියා කිරීමෙන් පසුව, ජාතික ජන බලවේගය නමින් සන්ධානගත වෙමින් ඔවුන්ගේ දේශපාලන ගමනේ යම් ඉදිරි පියවරක් තැබුවා. නව දේශපාලන ප්‍රතිරූපයක් සමාජයේ ඇති කර ගැනීමටත් ඔවුන් සමත් වුණා. කෙසේ වෙතත් 2019 ජනාධිපතිවරණයේදී ඔවුන්ට ලැබුණේ සියයට 3ක වැනි ඉතා අඩු ඡන්ද සංඛ්‍යාවක්.

ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් දැකිය හැකි ලක්ෂණයක් වන්නේ පාලකයා සහ ජනතාව අතර යම් දුරස්ථ ස්වභාවයක් පැවතීම. මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකදී ජනමතය සංවිධානය කිරීමට අතරමැදියකුගේ අවශ්‍යතාව මතු වෙනවා. නිදහසින් පසුව ලංකාවේ ජනමතය සංවිධානය කිරීම ආකාර දෙකකට සිදුවන බව පෙනී යනවා. පළමුවැන්න ජාතිකවාදී දේශපාලනය. දෙවැන්න සේවාදායක දේශපාලනය (Political Clientelism). ජාතිකවාදී දේශපාලනයේදී සිංහල බෞද්ධ ජාතිකවාදය විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වීම දක්වන්න පුළුවන්. මෙය ජනමතය සංවිධානය කිරීමේ දෘෂ්ටිවාදී බලවේගය බවට පත් වුණා. මෙහි අන්තර්ගතය ජාතිකවාදය. එහි ආකෘතිය වූයේ දේශපාලන පක්ෂය. මෙයට අමතර ව ජනමතය සංවිධානය කිරීම සඳහා දේශපාලන පක්ෂ විසින් ඡන්දදායකයාට විවිධ අනුග්‍රහ දැක්වීමත් දකින්නට පුළුවන්. එයින් අදහස් වන්නේ ජන ජීවිතයට බලපාන නිවාස, ඉඩම්, මාර්ග ඉදිකිරීම, රැකියා අවස්ථා ලබා දීම හෝ පෞද්ගලික පරිත්‍යාග සිදුකිරීම ආදියෙන් ජනමතය

සංවිධානය කිරීම. එය සේවාදායක දේශපාලනය නැතහොත් අනුග්‍රාහක දේශපාලනය ලෙසින් හඳුන්වනවා. මේ ආකාරයට ජනමතය සංවිධානය කිරීම ඉතා දිගුකාලයක් පැවතුණා. මේ කාලයේදී සමාජය විවිධ විපර්යාසවලට ලක් වුණා. විශේෂයෙන් ජනගහනයේ විශාල වර්ධනයක් ඇති වීමත් ඔවුන්ගේ සරල අවශ්‍යතා වෙනුවට අවශ්‍යතා සහ අපේක්ෂාවල සංකීර්ණතාවක් ඇති වෙමින් තිබුණා. නමුත් මේ වෙනස පැවති දේශපාලන ව්‍යුහයේ වෙනස්කම් සිදු වුණේ නැහැ. ඒ වෙනුවට සිදු වුණේ විකෘතියක්. ජාතිකවාදය භාවිත කරමින් බලය ලබා ගත් දේශපාලන පක්ෂ සහ ඒවායේ නායකයන්, නැතහොත් ප්‍රභූ පිරිස ඒවායෙන් ප්‍රයෝජන ලබා ගත්තා. රාජ්‍ය බලය අවභාවිත කිරීමට යොමු වුණා. මෙයයි දේශපාලනයේ පරිහානිය යනුවෙන් හඳුන්වන්නේ. මෙය දේශපාලනයේ තිබූ සුජාත බව විනාශ කිරීමට හේතු වුණා. 1990 ගණන්වල සිටයි මෙය ඉස්මතු වී පෙන්නුම් කිරීම නිරීක්ෂණය වන්නේ. ආසන්න කාලයකදී ජනතා විමුක්ති පෙරමුණේ සටන් පාඨයක් වූ "උනුත් එකයි මුනුත් එකයි මෙදා පාර අපි ජවිපෙට" යන්න ජනප්‍රිය සටන් පාඨයක් වූයේ මේ තත්ත්වය මතුපිටට ඉස්මතු වීම හේතුවෙන්. මෙයින් එම පක්ෂයට යම් ආකර්ෂණයක් ද ලැබුණා.

මහින්ද රාජපක්ෂගේ ආගමනයත් සමග දේශපාලන පක්ෂ ක්‍රමයේ පිරිහීම යම්තාක්දුරකට යටපත් වුණා. එයට හේතු වූයේ උතුරු නැගෙනහිර පැවති යුද වාතාවරණය නිමා කිරීම නිසා ඔහුගේ ජනප්‍රියත්වය ඉහළ යාම. නමුත් 2014 වසර පමණ වන විට ඔහුගේ ජනප්‍රියභාවය හීන වී ගොස් නැවතත් යටපත් ව ගිය දේශපාලන පක්ෂ ක්‍රමයේ අර්බුදය මතු වීම ආරම්භ වුණා. කොවිඩ් වසංගත සමයේ එය සමාජයට පූර්ණ වශයෙන් නිරාවරණය වුණා. ඒ සමග ම සිදු වුණේ පැමිණි ආර්ථික අර්බුදය හා මහජන නැගිටීම ඔස්සේ පැරණි පක්ෂ ආකෘතිය බිඳ වැටීම. මේ බිඳ වැටීම හමුවේ ජනතාවට විකල්ප ක්‍රමයක අවශ්‍යතාව දැනුණා. මේ නිසයි තරුණ තරුණියන් 'ක්‍රමයේ වෙනසක්' (System Change) ඉල්ලා සිටියේ. එය සමාජයේ බොහෝ ජනප්‍රිය වූ සටන් පාඨයක් බවට පත් වුණා. මේ ක්‍රමයේ වෙනස ඇති කළ හැක්කේ ජාතික ජන බලවේග යට බව ජනතාව පිළිගෙන තිබෙනවා. ජාතික ජන බලවේගය ද වෙනස් වූ දේශපාලන සංස්කෘතියක් ඇති කරන බව ජනතාවට ප්‍රකාශ කළා. ඒ අනුව මොවුන් පැරණි පක්ෂ ක්‍රමයට බාහිර කණ්ඩායමක් ලෙසිනුයි ජනතාව දුටුවේ. අනුර කුමාර දිසානායක ජනාධිපති වශයෙන් පත් වීමට ප්‍රධාන හේතුව වූයේ එය.

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ඉතා ශක්තිමත් වූවක්. නමුත්

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ඉතා ශක්තිමත් වූවක්. නමුත් මේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය පසුගිය කාලවකවානුවේ ප්‍රභූන් අපයෝජනය කළා. මේ තත්ත්වය ඉදිරියේදී වෙනසකට ලක් විය යුතු වෙනවා. මේ වන විට ශ්‍රී ලංකාව ජීවත් වීමට නොහැකි ආකාරයේ රටක් බවට පත් ව අවසන්. හැකි සෑම පුද්ගලයකු ම විදේශගත වීමට අපේක්ෂා කරනවා. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව නගරයට හෝ විදේශකයට සංක්‍රමණයට වීමට උත්සාහ කරන ආකාරයක් දකින්නට පුළුවන්. මෙය විශාල ගැටලුවක්. මේ තත්ත්වය වෙනස් කිරීම අවශ්‍ය වෙනවා.

මේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය පසුගිය කාලවකවානුවේ ප්‍රභූන් අපයෝජනය කළා. මේ තත්ත්වය ඉදිරියේදී වෙනසකට ලක් විය යුතු වෙනවා. මේ වන විට ශ්‍රී ලංකාව ජීවත් වීමට නොහැකි ආකාරයේ රටක් බවට පත් ව අවසන්. හැකි සෑම පුද්ගලයකු ම විදේශගත වීමට අපේක්ෂා කරනවා. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව නගරයට හෝ විදේශකයට සංක්‍රමණයට වීමට උත්සාහ කරන ආකාරයක් දකින්නට පුළුවන්. මෙය විශාල ගැටලුවක්. මේ තත්ත්වය වෙනස් කිරීම අවශ්‍ය වෙනවා. එය පහසු කාර්යයක් වන්නේ නැහැ. එය සමස්ත ක්‍රමයේ බිඳ වැටීමක් නිසා සිදු වූවක්. ජනතාව විශාල අතෘප්තිමත් බවකින් සිටින්නේ. ඒ නිසා ම පත්වන ආණ්ඩුවකින් ජනතාව බොහෝ දේ බලාපොරොත්තු වෙනවා. ඒවා ඉටු කිරීමට වත්මන් ආණ්ඩුවට හැකියාව තිබිය යුතුයි. එසේ නොවුවහොත් ජනතාව අතරින් ඔවුන් ප්‍රතික්ෂේප වීමට ඉඩ තිබෙනවා.

ඉදිරි මහා මැතිවරණයේදී ජාතික ජන බලවේගයට පාර්ලිමේන්තුවේ බහුතර බලය ලබා ගැනීමට ඉහළ සම්භාවිතාවක් තිබෙනවා. එයට හේතුව සාමාන්‍යයෙන් බහුතර ඡන්දදායකයන් තම ඡන්දය භාවිත කරන්නේ ඉදිරියේදී තමා ඡන්දය ලබාදෙන පක්ෂය හෝ පුද්ගලයා ජයග්‍රාහකයා වනු ඇතැයි අපේක්ෂාවෙන්. ඒ අනුව ජයග්‍රහණය කරාවි යැයි අනුමාන කරන පක්ෂයට ඡන්දය ලබා දීම අපේක්ෂා කරන්න පුළුවන්. ජාතික ජන බලවේගයට ආණ්ඩු බලය මේ වන විට ලැබී තිබෙනවා. මේ නිසා ජාතික ජන බලවේගයට ඡන්දදායක ආකර්ෂණය තවදුරටත් ඉහළ යාමක් සිදු වේවි යැයි අපේක්ෂා කරන්න පුළුවන්. එය සාමාන්‍යයෙන් දැකිය හැකි තත්ත්වයක්. 1994 මහමැතිවරණයෙන් පසුව පැවැත් වූ ජනාධිපතිවරණයේදී මෙවැනි තත්වයක් නිරීක්ෂණය වුණා. එහිදී චන්ද්‍රිකා බණ්ඩාරනායක සියයට 62ක පමණ විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත්තේ මහා මැතිවරණයේ එයට අඩු ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන තිබියදී.

# දේශපාලන ස්ථාවරභාවය ප්‍රමුඛ සාධකයක්



මහාචාර්ය
**ඒ. අරුණ ශාන්තආරච්චි**
ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන විද්‍යා අධ්‍යයනාංශය
සමාජීය විද්‍යා හා භාෂා පීඨය
සබරගමුව විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා ආර්ථිකයේ දැඩි අර්බුදකාරී සමයක ජනාධිපති ධුරයට පත් වූ රනිල් වික්‍රමසිංහ පැවසූ පරිදි කැඩුණු වැල්පාලමේ යායුතු දුරෙන් ඉතාමත් අඩු දුරකුයි අප තවමත් ගමන් කර ඇත්තේ. එයට හේතුව කිසියම් සහනශීලී බවක් පෙන්නුම් කළ ද තවමත් රට ඇත්තේ බංකොළොත් තත්ත්වයේ බවයි මගේ විශ්වාස ය . කෙසේ වෙතත් පැවති තත්ත්වයේ යම්කිසි සුබදායි තත්ත්වයක් ද පවතිනවා. වඩාත් පැහැදිලි කරනවානම් විදේශ විනිමය හිගය, උද්ධමනකාරී තත්ත්වය, පොලී අනුපාතිකය වැනි සාර්ව ආර්ථික විචල්‍යවල යම් ස්ථායි මට්ටමකට අප පැමිණ තිබෙනවා. නමුත් ණය අර්බුදය තවමත් එසේ ම පවතිනවා. මෙවැනි පසුබිමකයි 2024 නව වැනි ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීමෙන් ජාතික ජන බලවේග යේ අනුර කුමාර දිසානායක ජනපති ධුරයට පත් වන්නේ. ඒ අනුව නව ජනාධිපතිවරයා ඇතුළු වත්මන් ආණ්ඩුව මුහුණදෙන ප්‍රධානම අභියෝගය ලෙසින් මා දකින්නේ පවතින මතුපිට සුබදායි තත්ත්වය තවදුරටත් එලෙස ම ආරක්ෂා කර ගනිමින් අනෙකුත් ගැටලු සඳහා ආමන්ත්‍රණය කිරීමේ කාර්යය සිදු කළ යුත්තේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරු සොයා ගැනීම.

එහිදී ජනතාවට සහන ලබා දීම හා රාජ්‍ය ආදායම් හා වියදම් කළමනාකරණය ප්‍රශස්ත මට්ටමකින් සිදු කිරීම කළ යුතු වෙනවා. ඉන්ධන මිල අවම කිරීම, පොහොර සහනාධාරය ඉහළ දැමීම වැනි කාර්යයන් සාමාන්‍ය ජනතාවගේ ජීවන බර යම් මට්ටමකට අවම කිරීමට ගත් උත්සාහයක් ලෙසින් සලකන්න පුළුවන්. ඒ ආකාරයට අත්‍යාවශ්‍ය සහන ලබා දීම මෙන් ම අවම වශයෙන් දේශපාලන ස්ථාවරභාවයක් ඇති කර ගන්නා තුරු රාජ්‍ය ආදායම හා වියදම් අතර තුලනයක් ඇති කර ගැනීම පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු වෙනවා. අනෙක් අතට පවතින ආණ්ඩුවේ දේශපාලන ස්ථාවරත්වය ඇති කර ගැනීම ද කළ යුත්තක්. ඉදිරියේදී රජයේ ආර්ථික උපායමාර්ගික සැලසුමට අදාළ වන නීති, අණපනත් සම්මත කර ගැනීමට හැකියාව ලැබෙන්නේ දේශපාලන ස්ථාවරභාවය ඇති කර ගැනීමෙන් පමණයි. ඒ නිසා වත්මන් රජය විසින් පවතින තත්ත්වය ආරක්ෂා කර ගැනීම ම විශාල ජයග්‍රහණයක්.

පවතින තත්ත්වය ආරක්ෂා කර ගැනීමටත් එය ධනාත්මක ව ඉහළ මට්ටමකට ගෙන ඒමටත් රජයට කෙටිකාලීන ව අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් හැටියට විදේශ ප්‍රේෂණ ඉහළ දමා ගැනීම පෙන්වා දෙන්න පුළුවන්. නව බළ පෙරළියත් සමග විදේශගත ශ්‍රමිකයන්ගේ විශ්වාසය ඉහළ ගොස් තිබෙනවා. එම නිසා විදේශ ප්‍රේෂණ නීත්‍යානුකූල ක්‍රමවේදයට අනුව මෙරට බැංකු පද්ධතියට ගෙන්වා ගන්නට පුළුවන්. ඒ සඳහා රජය විදේශගත ශ්‍රමිකයන්ට ලබා දිය හැකි උත්තේජනය ලබා දිය යුතු වෙනවා. වත්මන් ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වන පරිදි විදේශ ප්‍රේෂණ රැස් කිරීම හා නඩත්තු කිරීම සඳහා වූ ක්‍රමවේදය කඩිනමින් ක්‍රියාත්මක කිරීමෙන් මේ තත්ත්වය වඩාත් ඉක්මන් වනු ඇති.



සංචාරක කර්මාන්තය කෙටිකාලීන ව ප්‍රවර්ධනය කිරීමේ හැකියාව තිබෙනවා. වීසා ලබා දීම කඩිනම් කිරීමට ගත් පියවර නිසා සංචාරක කර්මාන්තයට ලැබී තිබෙන්නේ පහසුවක්. ඒ ආකාරයට ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් සඳහා වියදම් කිරීමට ක්‍රියාකාරකම් නිර්මාණය කළ හැකියි. පැමිණෙන සංචාරකයන් විශාල සංඛ්‍යාවක් රටේ වියදම් කිරීමට අපේක්ෂා කරන මුදල් සියල්ල වියදම් කරන්නේ නැහැ. ඒ සඳහා වූ මාර්ග කෙටිකාලීන ව නිර්මාණය කිරීමේ හැකියාවක් තිබෙනවා. මැදි හා දිගුකාලීන ව වඩා වැඩි මුදල් ප්‍රවාහයක් රටට ගලා එන පරිදි සංචාරකයන් සඳහා වූ වියදම් කිරීමේ මූලාශ්‍ර නොහොත් ක්‍රියාකාරකම් නිර්මාණය කිරීම ද කළ හැකියි.

ආයෝජන ප්‍රවර්ධනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය, ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය වැනි ආයතන ඔස්සේ ලංකාවෙ ආයෝජන අවස්ථා ඉහළ දමා ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙළ සකස් කිරීම කළ යුතු යි. නව ආණ්ඩුව කෙරෙහි ඇති වූ විශ්වාස හේතුවෙන් මේ වන විටත් යම් විදේශ ආයෝජකයන් පිරිසක් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට සූදානම් වී සිටිනවා. දූෂණය හා අල්ලස වැනි කාරණාවලදී වත්මන් රජය කෙරෙහි යම් විශ්වාසයක් හා ආකල්පමය වෙනසක් රටේත් ජාත්‍යන්තර ප්‍රජාව තුළත් ඇති ව තිබෙනවා. ආකල්පමය වශයෙන් ඇති ව තිබෙන මේ වෙනස භාවිත කරමින් නිර්මාණය වී තිබෙන්නේ ආර්ථිකයේ විශාල පිම්මක් පැනීමේ හැකියාවක්, වටපිටාවක්. ඒ නිසා ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීමට අවශ්‍ය කෙටිකාලීන පියවර ගැනීම සිදු කළ යුතු යි. ඒ සඳහා පවතින ආයෝජන මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම කෙටි කාලයකදී කළ යුත්තක්. එය රජයට අභියෝගයක් විය හැකි වුවත් කළ යුත්තක් හැටියටයි මා දකින්නේ. මන්ද, එය රටක් වශයෙන් අප බලාපොරොත්තුවන ඉලක්ක ජය ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ගයක් වන නිසා.

අපනයන ක්‍රියාවලියේ යම් කඩා වැටීමක් සිදු ව තිබෙන බවක් පෙනී යනවා. එය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කළ යුතුයි. මේ සඳහා ශ්‍රී ලංකා තානාපති සේවාව භාවිත කළ හැකියි. ශ්‍රී ලංකා තානාපති සේවාව නැතහොත් දූත මණ්ඩල සේවාව දැනට ක්‍රියාත්මක වන්නේ දූත මණ්ඩල සේවාවකින් අපේක්ෂා කරන මූලික අරමුණු හෝ ඉටු කර ගත නොහැකි මට්ටමකින්. දූත මණ්ඩල සේවාවක ප්‍රධාන අරමුණු තුනක් තිබෙනවා. ඉන් පළමුවැන්න රටට අවශ්‍ය වෙළෙඳපොළ නිර්මාණය කිරීම. දෙවැන්න රැකීරක්ෂා උත්පාදනය කර දීම. තුන්වැන්න ආයෝජන අවස්ථා සොයා දීම. මේ අරමුණු රටේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සමග බද්ධ වී පවතිනවා. තානාපති සේවාවක ද්විතියික අරමුණු විදියට රාජ්‍ය තාන්ත්‍රික හා දේශපාලන සබඳතා දක්වන්න පුළුවන්. මේවා රටේ සංවර්ධනය හා සෘජු ව සම්බන්ධ වූ කාරණා නොවුණත් දිගු කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ තානාපති සේවාව ප්‍රධාන කාර්ය ලෙසින් සලකා ඇත්තේ ද්විතියික අරමුණු බව පෙනී යනවා. මේ තත්ත්වය වෙනස් විය යුතුයි. එහිදී සෑම තානාපති සේවාවකට ම ප්‍රධාන අරමුණු සම්බන්ධයෙන් ඉලක්ක ලබා දීමක් කළ යුතුයි.

රටේ ජනතාවගෙන් සියයට 38ක් පමණ දරිද්‍රතාවෙන් පෙළෙනවා. අනිවාර්යෙන් ම එම පිරිස රැක බලා ගැනීම වත්මන් රජයේ වගකීමක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කරගෙන තිබෙන ගිවිසුම් ප්‍රකාර ව ක්‍රියා කරමින් ම ඔවුන් සමග සාකච්ඡා කර රටට තවදුරටත් වාසි සහගත තත්ත්වයන් ළඟා කර ගත යුතු වෙනවා. මේ සියලු කාරණා වත්මන් රජය කෙටිකාලීන ව අවධානය යොමු කළ යුතු හෝ ආරම්භ කළ යුතු කාරණා.

අනුර කුමාර දිසානායක ජනපති වශයෙන් පත් කර ගත් ජනතාව බලාපොරොත්තු වූ මූලික හා ප්‍රධාන අරමුණු කිහිපයක් තිබෙනවා. වංචාව, දූෂණය හා නාස්තිකාර වියදම් අවම කිරීමත් පවතින ජීවන වියදම අවම කර ගැනීමත් ඒ අතර ප්‍රධාන වෙනවා. මේ සඳහා දැනටමත් යම් යම් පියවර ගෙන තිබෙන බවක් පෙනෙනවා. නාස්තිකාර වියදම් අවම කිරීම සඳහා දේශපාලන නියෝජිතයන් සඳහා තිබෙන වරප්‍රසාද අවම කිරීම හා අනවශ්‍ය වියදම් කපා හැරීමේ ආදර්ශ රජය ලබා දී තිබෙනවා. මේ තත්තවය අඛණ්ඩ ව පවත්වා ගැනීමෙන් ජනතා විශ්වාසය තහවුරු කර ගත හැකියි. පූර්ව දූෂණ හා වංචා සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම දිගුකාලීන ක්‍රියාවලියක්. එය දේශපාලන ක්‍රියාමාර්ගයක් ම නොවන නිසාත් එය නීතිමය ආයතනික පද්ධතියත් සමග ක්‍රියාත්මක වන්නක් නිසාත් එය තාක්ෂණික ක්‍රියාවලියක් නිසාත් ඒ සඳහා වූ සම්මත ක්‍රියාවලිය අනුග මනය කිරීමට සිදු වෙනවා. ඒ නිසයි මා පැවසුවේ එය දිගුකාලීන ක්‍රියාවලියක් කියා. නමුත් එම ක්‍රියාවලිය ආරම්භ කිරීමෙන් පසුව එහි අදියර පිළිබඳ විනිවිදභාවයකින් යුතු ව ජනතාවට දැන ගැනීමට සැලැස්වීම රජයේ වගකීමක් මෙන්ම යුතුකමක්. ජනමාධ්‍යවලට ද මෙහිදී නිවැරදි තොරතුරු ජනතාවට රැගෙන යාමේ වගකීම පැවරෙනවා.

ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ආර්ථික, සෞඛ්‍ය, අධ්‍යාපනික වැනි ප්‍රධාන ක්ෂේත්‍රවල නිශ්චිත වර්ධනයක් සහ නිශ්චිත කාලයකදී ළඟා කරගත යුතු ඉලක්ක සඳහන්. එම ඉලක්ක ළඟා කර ගැනීම සඳහා පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන හඳුනාගෙන නියමිත කාලයේදී එම ඉලක්ක සපුරා ගැනීමයි වත්මන් ආණ්ඩුවට මුහුණපෑමට සිදුවන ප්‍රධානතම අභියෝගය. එහිදී නැවත ශුන්‍යයේ සිට ඉදිරියට යාමට සිදුවන බව ද මතකයේ රඳවා තබා ගත යුතුයි. මා විශ්වාස කරනවා ජනාධිපතිවරයා තම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි ම ශ්‍රී ලංකාවේ ජනතාවට 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' කෙටි කාලයකදී ම අත්දැකීමට හැකි වේවි කියා.



# තුලිත විදේශ ප්‍රතිපත්තියක්




**හෂාන් විජේසිංහ**
කථිකාචාර්ය
ජාත්‍යන්තර අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය


ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය බලන විට ප්‍රධාන බල කඳවුරු දෙක පරාජය කරමින් නව කණ්ඩයමකට බලය විතැන් වීම සුවිශේෂ තත්ත්වයක්. එය පැවති දේශපාලනික, ආර්ථික තත්ත්වය හමුවේ ජනතාව ලබා දුන් තීන්දුවක් ලෙස අර්ථ දක්වන්න පුළුවන්.

අනුර කුමාර දිසානායක ශ්‍රී ලංකාවේ නව වැනි ජනාධිපතිවරයා වශයෙන් පත්වීම ජාත්‍යන්තර ප්‍රජාවටත්, ශ්‍රී ලාංකිකයන්ටත් නවමු අත්දැකීමක් වනු ඇතැයි මා විශ්වාස කරනවා. ඒ අනුව ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සහ ජාත්‍යන්තර සබඳතා ගොඩනගා ගැනීමේදී රටේ ජාතික අභිලාෂ අවබෝධ කරගෙන ඒ අනුව ක්‍රියාත්මක වීම වර්තමාන ආණ්ඩුවට තිබෙන ප්‍රධාන අභියෝගයක්. බොහෝ විට මැතිවරණ ප්‍රචාරක රැළිවලදී සහ වෙනත් අවස්ථාවලදී අනුර දිසානායක ප්‍රමුඛ කණ්ඩායමට එල්ල වූ චෝදනාවක් වූයේ අත්දැකීම් අවම වීම සහ ජාත්‍යන්තර සබඳතා නොමැති වීම හේතුවෙන් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර සහයෝගය නොලැබෙනු ඇතැයි කියා. නමුත් මේ කෙටි කාලයේදී එය සාවද්‍ය කාරණයක් බව අද තහවුරු වී තිබෙන ආකාරය දක්නට පුළුවන්.

සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව අනුගමනය කරන්නේ නොබැඳි විදේශ ප්‍රතිපත්තියක්. එහි බරපතළ වෙනසක් වත්මන් ආණ්ඩුව ක්‍රියාත්මක කරනු ඇතැයි මා අපේක්ෂා නොකළත් ජාත්‍යන්තරයේ සිදු වී තිබෙන වෙනස්කම් අනුව තුලිත විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ඇතැයි උපකල්පනය කරන්න පුළුවන්. මෙයට පෙර ලෝක බලවතුන් ලෙස සිටියේ රටවල් කිහිපයක් පමණයි එහෙත් අද වන විට රටවල් රාශියක් ලෝක බලවතුන් ලෙස ජාත්‍යන්තර පද්ධතියේ ක්‍රියාත්මක වෙනවා. උදාහරණ වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය, චීනය, රුසියාව වගේ ම කලාපීය බලවතුන් ලෙස ඉන්දියාව හඳුන්වන්න පුළුවන්.



ජාත්‍යන්තර සබඳතා පවත්වා ගැනීමේදී ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ බරපතල වෙනස්කම් සිදු නොවුණත් පවතින ආණ්ඩුවේ නිපුණත්වය හා හැකියාව මත පුද්ගලයන් පත් කිරීමෙන් ජාත්‍යන්තර ප්‍රජාවගේ සහයෝගය රටේ සංවර්ධනයට දායක කර ගැනීමේ වෙනසක් ඇති වේ යැයි අනුමාන කරන්නට පුළුවන්. ඒ අනුව විදේශ දූත සේවය නිවැරදි මාර්ගයට අවතීර්ණ කිරීමෙන් රටට ලබා ගත හැකි වාසි බොහෝ තිබෙනවා.

විදේශ දූත සේවයෙනුයි රටේ විදේශ ප්‍රතිපත්තිය නිවැරදි දිශාවට යොමු කරන්නේ. අපනයන වෙළෙඳපොළ පුළුල් කර දීම, විදේශ රැකියා අවස්ථා උදා කර ගැනීමට අවශ්‍ය පසුබිම සකසා දීම හා විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට පසුබිම සැකසීම විදේශ දූත සේවයේදී බලාපොරොත්තු වන අරමුණු.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග වූ ගිවිසුම ඉදිරියටත් ක්‍රියාත්මක කිරීම වැදගත්. එය පවතින ආණ්ඩුව අවබෝධ කරගෙන තිබෙනවා. ඒ අනුව ගිවිසුමේ බරපතළ වෙනස්කම් සිදු නොවේවි. එසේ වුවත් එම ගිවිසුම් රාමුවේ සාමාන්‍ය ජනතාවට පැටවී ඇති බර අවම කිරීම සඳහා ඔවුන් සමග එකඟතාවකට පැමිණෙනු ඇති. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල බලාපොරොත්තු වන්නේ රටේ ණය අර්බුදය විසඳා ගැනීමට තරම් රටේ ආර්ථික ප්‍රතිපත්තිය ශක්තිමත් ද යන්න පමණයි.

**ඩබ්ලිව්. එම් ශාන්තප්‍රිය**

# ජාජබ දිග්විජය

2024 සැප්තැම්බර් 21 පැවති ජනාධිපතිවරණයෙන් ජාතික ජන බලවේගයේ හා ජවිපෙ නායක අනුර කුමාර දිසානායක ලද ජයග්‍රහණයේදී දෙවැනි මනාපය එක් කළ විට ද සියයට 50 ඉක්මවීමට ඔහුට නොහැකි විය. ඇතැම්හු මෙය සියයට 50 ඉක්මවීමට නොහැකි වූ ජයග්‍රහණයැයි ඔච්චම් ස්වරයකින් කතා කළහ. එහෙත් මෙතෙක් පැවති අධිපති බලයට එරෙහි ව නොයෙක් බාධක මැද්දේ පහළ පාන්තික සන්ධානයක් ප්‍රථමවරට ලද ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි හෙයින් එය සුවිශේෂ සංසිද්ධියක් ලෙස හඳුන්වන්නට පුළුවන.

ජාජබ ජයග්‍රහණයේ ස්වරූපය ගත් කල පෙනී යන කාරණයක් වන්නේ නාගරික ව එය සැලකිය යුතු ජන ආකර්ෂණයක් ලබා ඇති බවත් නාගරික කම්කරු පාන්තික හා මැද පාන්තික බහුතරයක සහාය ඊට ලැබී ඇති බවත් ය. නිදසුන් ලෙස අනුර කුමාර දිසානායක කොළඹ දිස්ත්‍රික්කයේ අනෙක් ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා වන සජිත් ප්‍රේමදාස හා රනිල් වික්‍රමසිංහ එකතුව ගත් 623,544ක ඡන්ද සංඛ්‍යාවට වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවක් එනම් ඡන්ද 629,963ක් ලබා තිබුණි. ඒ, මැද කොළඹ, උතුරු කොළඹ හා බටහිර කොළඹ වැනි සාම්ප්‍රදායික එජාප බලකොටු පවතිද්දී ය. ගම්පහ අනුරට ඡන්ද 809,410ක් ලැබෙන විට අනෙක් දෙදෙනාට ලැබී ඇත්තේ ඡන්ද 565,578ක් පමණි. ගාල්ලෙන් අනුරට 366,721ක් ලැබෙන විට අනෙක් දෙදෙනාට ලැබී ඇත්තේ ඡන්ද 296,891කි.

ග්‍රාමීය ව ගත් කල ද බොහෝ ප්‍රදේශවල අනුර ජයගෙන තිබුණත් නාගරික කම්කරු පාන්තික හා මැද පාන්තික සහායට සාපේක්ෂ ව ඊට ලැබී ඇති සහයේ යම් අඩුවක් නිරීක්ෂණය කළ හැකි ය. නිදසුන් ලෙස මොණරාගල දිස්ත්‍රික්කයෙන් අනුර ඡන්ද 140,269ක් ලබන විට රනිල් හා සජිත් දෙදෙනාට ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව 170,156කි. අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් අනුර ඡන්ද 285,944ක් ලබන විට ඔවුන් දෙදෙනා ලැබූ ඡන්ද සංඛ්‍යාව 284,436ක් වෙමින් ආසන්නයට පැමිණ ඇත. එමෙන් ම උතුර, නැගෙනහිර හා කඳුරට හැරුණු විට රටේ අනෙකුත් ප්‍රදේශවල තරුණ ජනයාගේ සහය විශාල වශයෙන් ලැබී ඇත්තේ ජාතික ජන බලවේගයට බව සිතන්නට පුළුවන. එසේ වුව ද



ජනවාර්ගික පදනමින් ගත් කල සුළුතර ජාතික ජන කොටස්වල බහුතරයක් අනුර කුමාර දිසානායක කෙරෙහි විශ්වාසයක් තබා නැති බව දැකිය හැකි ය. උතුර, නැගෙනහිර හා කඳුරට ගත් විට දෙමළ හා මුස්ලිම් බහුතර ජනතාවක් සිය සහය විශාල වශයෙන් ලබා දී ඇත්තේ ප්‍රධාන ධනපති අපේක්ෂකයන් දෙදෙනා වන සජිත් ප්‍රේමදාස හා රනිල් වික්‍රමසිංහ දෙදෙනාට බවත් එසේ වීමට හේතු වී ඇත්තේ විශේෂයෙන් ජාජබයේ නියමු පක්ෂය වන ජවිපෙහි අතීත දේශපාලනය ද යන්න සලකා බැලිය යුතු කරුණකි. පීඩිත ජාතීන් සඳහා අල්ලස, දූෂණය පිටු දැකීම හා හොරු ඇල්ලීම යන සටන් පාඨය එතරම් වැදගත් වී නැති බව පෙනේ.

මෙතෙක් මෙරට පාලනය ගෙන යමින් බලය අභ්‍යාස කළ ඉහළ පාන්තික අධිපති බලවේග පරාජයට පත් කළ මෙම ජයග්‍රහණය අවතක්සේරු කළ නොහැකි ය. නොකළ යුතු ය. මෙය සැලකිල්ලට ගත යුත්තේ 2019දී අනුර- ජාජබය ලද 3%ට සාපේක්ෂ ව ය. එම ප්‍රතිශතයට සාපේක්ෂ ව ගත් කල මෙය 1350%කට ආසන්න ව ලද ජයග්‍රහණයකි.

ලද ජයග්‍රහණය සැබෑ ජනතා ජයග්‍රහණයක් බවට පරිවර්තනය කිරීම නව පාලනයේ වගකීමකි. එහෙත් මෙම ජයග්‍රහණය ලැබුවා මෙන් එය පහසු කටයුත්තක් නොවන බව පැහැදිලි ය. එයට බාධා

කරන සාධක රැසක් බාහිරින් පමණක් නොව එහි අභ්‍යන්තරයේමත් පවතින බව යථාර්ථයකි.

ආණ්ඩුවේ නියමු බලය වන ජාතික ජන බලවේගය මේ වන විට වාමාංශික පක්ෂයක් වන ජවිපෙ හා තවත් විවිධ වර්ගයේ සුළු ධනපති සමාජවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායම් ද පුද්ගලයන් ද ඒකාබද්ධ කර ගත් සුළු හා මැද ධනපති කොටස් සමග සන්ධානගත වූ පහළ පාන්තික දේශපාලන සන්ධානයකි. වමේ අසාර්ථකත්වය නිසා ම මෙතෙක් කල් විකල්පයක් නොමැති ව ධනේශ්වර පක්ෂ පස්සේ ඇදී ගිය කම්කරු පන්තියේ ද ගොවි හා ධීවර ආදී වශයෙන් වන පීඩිත පාන්තික හා සෙසු පීඩිත ජන කොටස්වල (පීඩිත ජාතීන් හැර) ද සැලකිය යුතු ජන සමූහයක් ඒ වටා පෙළ ගැසීමෙන් එහි මෙම ස්වභාවය වෙනස් වන්නේ නැත.



> **පැවති පාලකයන්ට සාපේක්ෂ ව භාරකාර ආණ්ඩුව දූෂණ, වංචා, නාස්තිය ආදිය නැති කිරීමට, නීතියේ පාලනය ඇති කිරීමට හා කිසියම්දුරකට ජනහිතකාමී ආර්ථික ප්‍රතිසංස්කරණ ඇති කිරීමට ප්‍රයත්න දරනු ඇත. එහෙත් පරාජයට පත් වූ ප්‍රමුඛ ප්‍රතිගාමී බලවේග එයට කළ හැකි සීමිත කාර්යභාරය පවා ඉටු කිරීමට බාධා කරන නොයෙකුත් අන්දමේ කූඨ උපාමාරු, කුමන්ත්‍රණකාරී ක්‍රියා හා කඩාකප්පල් වැඩ ආදිය කරනු ඇත.**

ඒ අනුව ආණ්ඩුවක් වශයෙන් ගත් කල මෙම ආණ්ඩුව එහි පන්ති ස්වභාවයට අනුව පැවති පාලනයන්ට සාපේක්ෂ ව යම් යම් දේශපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරණවලට පමණක් සීමා වෙමින් ධනේශ්වර ක්‍රමයට ප්‍රබල අභියෝගයකින් තොර ව පවත්වාගෙන යන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පන්නයේ ආණ්ඩුවක් වනු ඇත. එය ප්‍රාග්ධනයේ ඇතැම් අධිපතීන්ට (මෙතෙක් පාලන බලය දැරූ පාලකයන්ගේ වරප්‍රසාදවලට පාත්‍ර වූ අන්ත දූෂිත ගජ මිතුරු ධනපතීන් වැනි කොටස්වලට) එරෙහි ව (සිංගප්පූරුවේ ලී ක්වාං යූ ආණ්ඩුව මෙන්) යම් යම් පියවර ගනු ඇතැයි සිතිය හැකි වුව ද සමස්තයක් වශයෙන් ප්‍රාග්ධනයේ ආධිපත්‍යයට අත තැබීම මෙම මොහොතේ අතිශය අමාරු කරුණකි.

ඒ අනුව පැවති පාලකයන්ට සාපේක්ෂ ව භාරකාර ආණ්ඩුව දූෂණ, වංචා, නාස්තිය ආදිය නැති කිරීමට, නීතියේ පාලනය ඇති කිරීමට හා කිසියම්දුරකට ජනහිතකාමී ආර්ථික ප්‍රතිසංස්කරණ ඇති කිරීමට ප්‍රයත්න දරනු ඇත. එහෙත් පරාජයට පත් වූ ප්‍රමුඛ ප්‍රතිගාමී බලවේග එයට කළ හැකි සීමිත කාර්යභාරය පවා ඉටු කිරීමට බාධා කරන නොයෙකුත් අන්දමේ කූඨ උපාමාරු, කුමන්ත්‍රණකාරී ක්‍රියා හා කඩාකප්පල් වැඩ ආදිය කරනු ඇත.

ජනාධිපතිවරණ සටන් බිමේ වැඩියෙන් ම හඬ නැගුණේ අල්ලසට, දූෂණයට, වංචාවලට හා නාස්තියට එරෙහි සටන් පාඨ ය. එම සටන් පාඨ මොනතරම් ජනතා ආකර්ෂණයට පත් ව තිබුණා ද කියතොත් ඒවා හාස්‍යය දනවන අන්දමින් සජබ වේදිකාවේ පවා ද නැගුණු ප්‍රධාන සටන් පාඨ බවට පත් ව තිබුණි. ඉදිරි දැක්මකින් යුත් දේශපාලන විඥානයකින් තොර ව උමතුවෙන් මෙන් ගෝඨාභය රාජපක්ෂ වටා පෙළ ගැසී, ඔහු ව බලයට ගෙන ඒමට ඇප කැප වූ තරුණ ජනයාගෙන් අතිබහුතරයක් ගෝඨාභය වටා පෙළ ගැසුණු පරිද්දෙන් ම අනුර කුමාර දිසානායක වටා ද පෙළ ගැසුණු අයුරු දැකිය හැකි විය.

එපරිද්දෙන් ම ස්ථාපිතයෙන් නොයෙක් වෙනස්කම්වලට පාත්‍ර වූ හමුදා හා පොලිස් නිලධාරීන් වැන්නන් ද රාජ්‍ය නිලධරයේ බොහෝ දෙනා ද ගජ මිතුරු වරප්‍රසාදවලට අහිමි ව වෙනස්කම්වලට පාත්‍ර ව විවිධ පීඩාවලට ලක් වූ ව්‍යාපාරිකයන් වැන්නන් ද ඇතුළු එවැනි බොහෝ දෙනා ජාජබ වටා තොග වශයෙන් පෙළ ගැසුණේ ඉදිරි දැක්මකින් යුත් දේශපාලන විඥානයකින් නොව බොහෝ සෙයින් තමන්ගේ ම වූ විවිධාකාර වූ ආත්මීය අරමුණු සාධනය කර ගැනීම සඳහා විය හැකි ය. මොවුන් අතර පොදු උවමනා සහිත පුද්ගලයන් නොවූවා යයි අපි නොකියමු. එහෙත් ඉන් සැලකිය යුතු පිරිසක් එසේ යැයි කියන්නට අපට නොහැකි ය. සාපේක්ෂ වශයෙන් විනයගත පක්ෂයක් වූ ජවිපෙන් පවා එවැනි පුද්ගලයන් තොග ගණනින් බිහි වූ බව රහසක් නොවේ.

ආණ්ඩුවට පරිපාලනයේදී සිදු වනු ඇත්තේ බොහෝදුරට මෙවැනි නිලධාරීන් මත යැපීමට ය. එය දැනටමත් පෙන්නුම් කරමින් තිබේ. ආණ්ඩුවට තමන් මුහුණදෙන තත්ත්වය අතික්‍රමණය කිරීම පහසු නැත. මෙය තාවකාලික භාරකාර ආණ්ඩුවක් වන බව අපි පිළිගත යුත්තෙමු. පවතින තත්ත්වය යටතේ බලාත්මක ආණ්ඩුවක් වන්නට ජනාධිපති බලය පමණක් ප්‍රමාණවත් වන්නේ නැත. ඒ සඳහා පාර්ලිමේන්තු බලය ද නැතිව ම බැරි කොන්දේසියකි. ඊළඟ මහා මැතිවරණයෙන් ජාජබයට පාර්ලිමේන්තු බලය ද හිමි වනු ඇත. එහෙත් එය කොතරම් බලාත්මක වූවක් වනු ඇද්දැයි අපට කිව නොහැකි ය. ජනතා බහුතරයක් එම බලය ලබාදෙනු ඇතැයි අපි විශ්වාස කරමු. කාලයක් ඔවුන්ට ඉඩ දිය යුතු බව ද අපි කියා සිටිමු.

කෙසේ වුව ද ජනාධිපතිවරණය ජයගත් පමණින් හා පාර්ලිමේන්තු මැතිවරණය ජයගත් පමණින් සැබෑ ජනතා ආණ්ඩුවක් ලැබෙනු ඇතැයි සිතතොත් එය බරපතළ වරද්දා ගැනීමක් පමණක් වනු ඇති බව පැවසිය යුතු ය. ඒ සඳහා සක්‍රීය, දැනුවත්, සංවිධිත මහජන බලයක් පණ ගැන්වීමට ක්‍රියා කිරීම අවශ්‍ය ය. ජාජබ ආණ්ඩුව සැබෑ මහජන ආණ්ඩුවක් බවට පත් වීමට නම් එවැනි මහජන බලයක් බල ගැන්වීමට ක්‍රියා කළ යුතු ය. එසේ නොවන්නේ නම් ජාජබය ද මෙතෙක් පැවති ආණ්ඩු ලැයිස්තුවේ තවත් එක් ආණ්ඩුවක් පමණක් වනු ඇත.

# පුනරුද ලංකාවක ඔක්තෝබර් විප්ලවය නැවත කියවීම

පැරණි රුසියාවේ 1917 වසරේ ඇති වූ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවය 2017 වසර වන විට වසර 100ක් සම්පූර්ණ කළා. එය ලෝකය ස්මරණය කළේ ඉතා ම උත්කර්ෂයෙන්. ශ්‍රී ලංකාවේත් මේ නිමිත්තෙන් විහාර මහා දේවී උද්‍යානයේ සැමරුම් උත්සවයක් පැවැත්වුණා. වෙළුම් දෙකකින් සිංහලට පරිවර්තනය කරන ලද 'සෝවියට දිවියක මතක සුවඳ' පොත ලියූ ඉරීනා මලෙන්කෝ නැමැති ලේඛිකාවත් සෝවියට් දේශයේ සිට එදින පැමිණ සිටියා.

2024 වසරට ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයට වසර 107ක් වෙනවා. මේ විප්ලවය යුග තුනකට බෙදා දක්වන්න පුළුවන්. ඒ, පූර්ව විප්ලව යුගය, විප්ලවීය යුගය, පශ්චාත් විප්ලවීය යුගය වශයෙන්. පූර්ව විප්ලවීය යුගය ආරම්භ වන්නේ මාක්ස් හා එංගල්ස්ට පෙර සිට ම. ලෙනින්ගේ යුගයයි විප්ලවීය යුගය ලෙස සැලකෙන්නේ. පශ්චාත් විප්ලවීය යුගය යනු ජෝසප් ස්ටාලින්ගෙන් ආරම්භ වී ට්‍රොට්ස්කි යටපත් වූ යුගය. මෙය 1991 සෝවියට් සමූහාණ්ඩුව බිඳ වැටීම දක්වා පැවතුණා. 1917 ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයෙන් ආරම්භ වී දීර්ඝ කාලයක් ලෝකයට බලපෑම් කළ සමාජ ව්‍යාපාරය හා සමාජ ක්‍රමය, ක්‍රමික ව ඇති වූ ප්‍රතිවිපාකවල ප්‍රතිඵලයක් ලෙස 1991දී බිඳ වැටෙනවා.

මිහායිල් ගොර්බචොව් ජනාධිපතිවරයාගේ සමයේ එකල බොහෝ ප්‍රසිද්ධ වචනයක් වන්නේ ජනාධිපතිවරයාගේ දේශපාලන ප්‍රතිසංස්කරණ සම්භාරය ඇතුළත් 'පෙරොස්ත්‍රොයිකාව'. සෝවියට් සංගමයේ බිඳ වැටීම් සිදුවන්නේ කේවල ආකාරයෙන් නොවෙයි. බර්ලින් තාප්පය බිඳ වැටී නැගෙනහිර හා බටහිර ජර්මනිය අතර තිබූ ආණ්ඩුක්‍රම දෙක



මහාචාර්ය
**හිනිදුම සුනිල් සෙනෙවි**
භාෂා අධ්‍යයන අංශය
සමාජීය විද්‍යා හා භාෂා පීඨය
සබරගමුව විශ්වවිද්‍යාලය

බිඳ වැටීම ආදී කාරණා නිසා සමාජවාදී කඳවුරේ බිඳවැටීම සිදුවුණා. එය රටවල් රැසකට ම බලපෑම් එල්ල කළා.

වැඩවසම් රුසියාව හා එහි ජීවන ක්‍රමය, නිලධාරීවාදය, සමාජ මර්දනය පරදවා සමාජවාදී සමාජ පර්යායක් බිහිකර ගැනීම සෝවියට් සමූහාණ්ඩුව නමැති අනුස්මරණීය සමාජ ක්‍රමය බිහිවීම ලෙස සැලකෙනවා. ඓතිහාසික ක්‍රියාදාමයන් රැසක් අනුව පූර්ව විප්ලව යුගයේදී රුසියාවේ සමාජ, දේශපාලන, සංස්කෘතික ක්‍රමය සකස් වෙමින් තිබුණා. 1848දී කාල් මාක්ස් නමැති ජර්මන් දේශපාලන ආර්ථික විද්‍යාඥයා සහ ඔහුගේ මිත්‍රයා වූ ෆෙඩ්රික් එංගල්ස් නමැති න්‍යායාචාර්යවරයා එක් ව සුප්‍රකට 'කොමියුනිස්ට් ප්‍රකාශය' රචනා කළා. එය බිහිවන්නේ ද අහම්බයකින් නොවෙයි. තරුණ මාක්ස්ට බලපෑ දේශපාලන මතවාද ගණනාවක් තිබෙනවා. ෆෙයාබාක්ගේ ප්‍රවාද, ඉමැනුවෙල් කාන්ට්, ෆෙඩ්‍රික් හෙගල් සිට විඥානවාදීන් හා භෞතිකවාදීන් විශාල පිරිසක් සමාජ වෙනසක් පැතූ දේශපාලන න්‍යායාචාර්යවරුන් මෙන් ම එංගලන්තය, ජර්මනිය වැනි රටවල් මුල් කරගෙන බිහිවූ සමාජ විපරිවර්තන කණ්ඩායම් රැසක් ඒ සඳහා බලපෑවා. 1848 විශිෂ්ට ප්‍රඥා සම්ප්‍රදායක් ලෙස කාල් මාක්ස් 'කොමියුනිස්ට් ප්‍රකාශනය' ලියන විට ලංකාවේ වීර පුරන් අප්පුලාගේ මූලිකත්වයෙන් මාතලේ කැරැල්ල ඇති වනවා.

අප වැඩවසම් යුගයක සිටින කාලයේ යුරෝපයේ ඇති වන ප්‍රබුද්ධ මතවාද ජර්මනිය ඇතුළු රටවල් ඔස්සේ ව්‍යාප්ත වුණා. බුද්ධිමතුන් සහ දේශපාලන විද්‍යාඥයන්, සමාජ කණ්ඩායම්, උද්‍යෝගී තරුණ පිරිස් මේ නව ඥානය පිළිබඳ උනන්දු වුණා. 1870 වන විට 'නරෝද්නික්' නමින් ගොවි ව්‍යාපාරයක් ඇති වෙනවා. 1883 වන විට ප්ලේහෙනව් ඇතුළු පිරිස ශ්‍රම විමුක්ති කණ්ඩායම් නමැති ව්‍යාපාරය ආරම්භ කරනවා. ඊට පසු මාක්ස්වාදී අධ්‍යයන කව නව රුසියාවේ ප්‍රචලිත වෙනවා. මාක්ස්, එංගල්ස් වැනි පඬිවරු අනුමාන කළේ කොමියුනිස්ට් පාලනයක් එංගලන්තය වැනි රටක ස්ථාපිත විය හැකි බව. ඒ සඳහා පන්ති සකස්වීම, පන්ති අතර පීඩනය සහ පන්ති පරිණාමයට පත්වීම ආදිය අවශ්‍ය වුණා. එහෙත් රුසියාවේ නව අධ්‍යයන කව ආරම්භ වීමේ ප්‍රතිඵලයක් ලෙසට රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය බිහි වනවා. ඔවුන්ගේ පළමු සමුළුව පවත්වන්නේ 1898දී. මේ සමාජ කණ්ඩායම්වල උද්‍යෝගය නිසා සංවාද, නව දේශපාලන මැදිහත්වීම් පත්වන්නේ දේශපාලන ක්‍රියාවන් බවට. එහිදී බහුතරය හා සුළුතරය ලෙස මුල් වතාවට බෙදීම් දක්නට පුළුවන්. ඒ, බහුතරය බොල්ෂෙවික් ලෙසත්



සුළුතරය මෙන්ෂෙවික් ලෙසත්. සුළුතරය අවස්ථාවාදී දේශපාලන ක්‍රියාවල නිරත වුණා. බහුතරය බොල්ෂෙවික් පක්ෂය ලෙස සංවර්ධනය වුණා. 1905දී මොස්කව්වල ඇතිවන ජනතා නැගිටීම ඉතා වැදගත්. මෙය 1905 අරගලය ලෙස ද හැඳින්වෙනවා. ඉන්පසු ජනතා නැගිටීමක් ඇතිවන්නේ 1912දී රන් ආකරවල නිරායුධ ජනතාවට වෙඩි තැබීම නිසා.

1914දී ලොව පළමු වැනි ලෝක යුද්ධය ඇතිවෙනවා. මේ වන විට ජනතාව සිටින්නේ දැඩි කුසගින්නෙන් සහ පීඩනයෙන්. ලෝකය කඳවුරුවලට බෙදී සටන් කිරීමට පටන් ගත්තා. 1917 පෙබරවාරි වන විට සාර්ගේ පාලනය බිඳවැටීම ආරම්භ වෙනවා. එහිදී සිදු වන්නේ සෝවියට් සභා සංකල්පය හඳුන්වා දීමක්. බලය පැවරෙන්නේ මේ සෝවියට සභාවලට. පොදු ජනතාවගේ ආණ්ඩුව මධ්‍යගත වී තිබුණේ ද මේ සෝවියට සභා සමග. 1917 ස්විට්සර්ලන්තයේ සිටි ලෙනින් මොස්කව්වලට පැමිණීම තීරණාත්මක කාරණයක් වුණා. ඔහු පැවති තත්ත්වය න්‍යායගත කර ලියූ ලේඛනය 'අප්‍රේල් ප්‍රවාද' ලෙස හැඳින්වෙනවා.

නව වැඩපිළිවෙළක් ලෙනින් ආරම්භ කළා. එහි උද්‍යෝග පාඨය වුණේ සියලු බලය සෝවියට සභාවලට පවරන ලෙස. 1917 ඔක්තෝබර් 10 දින අවසන් පහර දීම සිදුවෙනවා. අධිරාජ්‍යවාදී යුගය අවසන් කිරීම සඳහා පක්ෂය සම්මත කරගන්නා දිනය වන්නේ එදින. සුප්‍රකට අවුරෝරා නෞකාව විප්ලවයේ පළමු සංඥාව නිකුත් කළා. 1917 ඔක්තෝබර් 25 දින සාර්ගේ පාලනය සංකේතාත්මක ව සහ භෞතික ව කේන්ද්‍රගත වී තිබූ ශීත මාලිගය අත්පත් කරගන්නවා. විප්ලවය නිම කළ දිනය ලෙස සැලකෙන්නේ ද එදින. ලෙනින්ගේ මූලිකත්වයෙන් බලය අත්පත් කරගෙන සෝවියට සමූහාණ්ඩුව ගොඩනැගීම ආරම්භ වන්නේ ඉන්පසුව. ලංකාව වැනි රටක එය ප්‍රචලිත වූයේ සෝවියට් දේශය නැතහොත් සෝවියට සමූහාණ්ඩුව ලෙස. ලෙනින් හා අරගලයේ නායකයන්ට මුහුණදීමට සිදු වූ ප්‍රධාන අභියෝගය වන්නේ විප්ලවයකින් පසු උදාවන දේශපාලන තත්ත්වය. ප්‍රතිවිප්ලවය පැමිණීම හා සිවිල් යුද තත්ත්වයක් මෙහිදී හට ගත්තා.

එක් සමාජ ක්‍රමයකින් තවත් සමාජ ක්‍රමයකට දේශපාලන බලය හුවමාරු වන විට පැරණි ආණ්ඩුව නිහඬ ව සිටින්නේ නැහැ. බලය මෘදු ලෙස හුවමාරු වන්නේ නැහැ. බලය හෙබවූ අය අපරාධ කර ඇති නිසා බලය රඳවා ගැනීමට විවිධ ක්‍රියාමාර්ගවල නිරත වනවා. මෙය බලගතු ලෙස සෝවියට් දේශයේ සිදුවූවක්. 1917 සිට 1924 දක්වා ලෙනින් වසර 07ක කාලයක් ජීවත්වෙනවා. ඔහු මුහුණදුන් හදිසි රෝගාබාධ තත්ත්වය කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් ලෙසට ද මත පළ වී තිබෙනවා. මේ කාලයේ ලෙනින් ඇතුළු පිරිස ගොඩනැගූ සෝවියට් දේශය අතිවිශිෂ්ට සමාජ පර්යායක් බවට පත් වනවා. මෙය ලොව පුරා උද්‍යෝගයෙන් හමා යනවා. සමාජවාදී කඳවුරේ රටවල් බිහි වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙස. පෝලන්තය, චෙකොස්ලොවැකියාව වැනි රටවල්. මේ කාලයේ සමාජවාදී මූලධර්ම මත පදනම් ව බලවතාගෙන් දුබලයා පෙළෙන්නේ නැති, සමානාත්මතාව ඇති වූ සමාජයක මූලාරම්භය සිදුවුණා. රාජ්‍ය හා හමුදාව වැනි අංශ කළමනාකරණය කර ගන්නවා. කෘෂිකර්මය, විද්‍යාව හා තාක්ෂණය සඳහා ඥානය යොදා ගන්නවා. මොස්කව් සිනමා පාසල බිහි වන්නේ මේ කාලයේ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආදිය මෙහිදී සිදු වෙනවා. සෝවියට සංගමය ඉතා වේගයෙන් ගොඩ නගන්න මේ පිරිස ක්‍රියා කළා. නිෂ්පාදන ආර්ථිකයක් ඇතිවීමත් ඒ අතර දක්නට පුළුවන්. එහි ප්‍රතිලාභ ලංකාව වැනි පෙරදිග රටවලටත් හිමි වුණා.

ලෙනින්ගේ අභාවයෙන් පසු ජෝසප් ස්ටාලින්ට පාලන බලය හිමි වන්නේ පක්ෂය තුළ බලය පිළිබඳ ඇති වූ කැරලි හා සංවාදවල ප්‍රතිඵලයක් ලෙස. ලියොන් ට්‍රොට්ස්කි මෙක්සිකෝවට පලා යනවා. ස්ටාර්ලින්ගේ පාලනය දීර්ඝ කාලයක් ක්‍රියාත්මක වෙනවා. එය බෙහෙවින් මර්දනීය පාලන මාදිලියක්. ට්‍රොට්ස්කි විශ්වාස කළ ලෝක සමාජවාදය යනු නොනවතින විප්ලවයක්. එය ලෝක සමාජවාදයක්. එම කඳවුරේ රටවල් ලොව පුරා පැතිරිය යුතු බව ඔවුන් විශ්වාස කළා. එහෙත් ස්ටාලින්ගේ පාලන මාදිලියේ තිබුණේ තනි රටේ සමාජවාදය. කලාකරුවන් ඝාතනය වීම, විවිධ පුද්ගලයන් පලා යාම හා පිටුවහල් කිරීම වැනි තත්ත්ව ඇති වුණා. අපකීර්තිමත් නඩු විභාග ද සිදුවුණා.

1953දී මේ යුගය අවසන් වූ පසු නිකිතා කෲෂෙප්ගේ පාලන සමය හා 1991 වන විට මිහායිල් ගොර්බචොව්ගේ සමය පැමිණෙනවා. සමාජවාදී සෝවියට් දේශය බිඳ වැටීම ද සිදු වන්නේ මේ සමග. මේ සමාජවාදී රුසියාව 'ලෝකයේ වසන්තය' ලෙස හඳුන්වා තිබෙනවා. එබඳු සමාජයක් ඇතිවීම හා එහි ප්‍රතිවිරෝධ මතු වී අවසානය එළඹෙනවා. කෙසේ වෙතත් න්‍යාය බිඳවැටීමක් සිදුවන්නේ නැහැ. සිදු වන්නේ එය වෙනස්වීමක්. සමාජවාදී අර්ථ ක්‍රමය ඔස්සේ කොමියුනිස්ට් ක්‍රම ඇතිවීම මනෝරාජික තත්ත්වයක් නොවෙයි. සමාජවාදී කඳවුර බිඳවැටීමේ

කෙළවර වන්නේ ව්ලැඩිමීර් පුටින් ජනාධිපතිවරයාගේ රුසියාව බිහිවීම. රුසියා-යුක්රේන යුද්ධය දෙස බලන විට පෙනී යන්නේ මේ ව්‍යසනය කෙතරම් දරුණු ද යන්න. විද්‍යා හා තාක්ෂණ ඥානය යුද්ධවලට යොදන අයුරු ද දක්නට පුළුවන්.

සෝවියට් සමූහාණ්ඩුවේ ජීවන ක්‍රමය ලංකාවට ද බලපෑමක් එල්ල කළා. ඒ, සෝවියට සාහිත්‍යය, තුන් වැනි ලෝකයේ රටවලට ශිෂ්‍යත්ව ලබාදීම සහ මහා පරිමාණ කර්මාන්ත ඇරඹීමට සෝවියට් ආධාර ලබා දීම ආදියෙන්. 1919දී ජාතික සංගමය ලංකාවේ නිර්මාණය වන යුගයේ මෙරට අධිරාජ්‍යවාදය ක්‍රියාත්මක වුණා. මාක්ස්වාදී අධ්‍යයන කව රුසියාවේ ක්‍රියාත්මක වුණා මෙන් ම ලංකාවේ ද සමාජ පෙරළියක් වෙනුවෙන් විවිධ කණ්ඩායම් අත්හදබැලීම් කළා. 1931දී සර්වජන ඡන්ද බලය හිමිවන ලංකාවේ පළමු වැනි දේශපාලන පක්ෂය ලෙස සමසමාජ පක්ෂය ආරම්භ වන්නේ 1935දී. 1941දී එම පක්ෂය දෙකඩ වී ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ඇති වනවා. ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා, ආචාර්ය ඇන් ඇම් පෙරේරා, පිටර් කෙනමන් හා එස්. ඒ. වික්‍රමසිංහ වැනි අය එහි විශේෂ භූමිකාවක් නිරූපණය කළා. නැගී එන ධනේශ්වරයට අයත් පවුල්වල දරුවන් යුරෝපයට ගොස් ඉගෙනුම ලබා පැමිණ ලංකාවේ විවිධ භූමිකා නිරූපණය කරනවා. 1948දී ශ්‍රී ලංකාවට ඩොමීනියන් තත්ත්වයේ දේශපාලන නිදහස හිමිවීමෙන් පසුවයි එක්සත් ජාතික පක්ෂය බිහිවන්නේ. 1956 මැතිවරණයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහි වනවා මේ සමාජ මැදිහත්වීම 1956 සංස්කෘතික විප්ලවය ලෙසට ද සලකන්න පුළුවන්.

1965 වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සභාගයකට එළඹීමත් රෝහණ විජේවීරගේ භූමිකාවත් කැපී පෙනෙන අතර චීන හා කොමියුනිස්ට් පිල ලෙස වාමාංශික ව්‍යාපාරයේ ප්‍රවණතා දෙකක් බිහිවීමත් දක්නට පුළුවන්. රෝහණ විජේවීර සහ කුඩා කණ්ඩායමක් ගාල්ල අක්මීමන ප්‍රදේශයේ සිදු කළ මූලික සාකච්ඡාවෙන් පසුව අලුත් දේශපාලන පක්ෂයක් පිහිටුවා ගන්නවා. 1970 සමගි පෙරමුණු රජය බිහි වන අතර 1971 ජනතා විමුක්ති පෙරමුණේ පළමු නැගිටීමත් 1987-89 දෙවැනි නැගිටීමත් සිදුවෙනවා. 1990-91 වන විට සිදු වන්නේ ජනතා විමුක්ති පෙරමුණ සමූල ඝාතනය කර දේශපාලනික වශයෙන් අක්‍රීය කිරීම. 1994දී ආරිය බුලේගොඩගේ ප්‍රගතිශීලී පෙරමුණෙන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රථම මන්ත්‍රීවරයා ලෙස නිහාල් ගලප්පත්ති පාර්ලිමේන්තුවට පිවිසෙනවා. ඒ, මල් බඳුන ලාංඡනයෙන්. අනුර කුමාර දිසානායක මුලින් ම

> සෝවියට් සමූහාණ්ඩුවේ ජීවන ක්‍රමය ලංකාවට ද බලපෑමක් එල්ල කළා. ඒ, සෝවියට සාහිත්‍යය, තුන් වැනි ලෝකයේ රටවලට ශිෂ්‍යත්ව ලබාදීම සහ මහා පරිමාණ කර්මාන්ත ඇරඹීමට සෝවියට් ආධාර ලබා දීම ආදියෙන්. 1919දී ජාතික සංගමය ලංකාවේ නිර්මාණය වන යුගයේ මෙරට අධිරාජ්‍යවාදය ක්‍රියාත්මක වුණා. මාක්ස්වාදී අධ්‍යයන කව රුසියාවේ ක්‍රියාත්මක වුණා මෙන් ම ලංකාවේ ද සමාජ පෙරළියක් වෙනුවෙන් විවිධ කණ්ඩායම් අත්හදාබැලීම් කළා. 1931දී සර්වජන ඡන්ද බලය හිමිවන ලංකාවේ පළමු වැනි දේශපාලන පක්ෂය ලෙස සමසමාජ පක්ෂය ආරම්භ වන්නේ 1935දී.

පාර්ලිමේන්තුවට පිවිසෙන්නේ 2000 වසරේදී.

එක් එක් යුගවල ඇති වූ දේශපාලන ප්‍රවණතාවලට අනුගත වෙමින් හා ප්‍රතිසංස්කරණය වෙමින් ජනතා විමුක්ති පෙරමුණ ද ඉදිරියට පැමිණ තිබෙනවා.


2024දී සිදුවූ සමාජ පරිවර්තන බීජයට පසුබිම් වූ උප ප්‍රවණතා රැසක් පවතිනවා. උතුරු නැගෙනහිර කේන්ද්‍ර කරගත් යුද්ධය ද මෙහිදී අමතක කරන්නට බැහැ. ආසන්න යුගයේ 2021 වන විට ලක්ෂ 10ක පමණ පිරිසක් ආගනුවරට පැමිණ, ලක්ෂ 69ක ජනතා වරමින් බිහි වූ ජනාධිපතිවරයකු පලවා හරිනවා. 2024 ජනතා පරිවර්තනය ගැන කතා කරන විට මේ අරගලය අමතක කරන්නට බැහැ. ජාතික ජන බලවේගය නමැති ජනතා ව්‍යාපාරය ඉදිරියට පැමිණෙන්නේ පාර්ලිමේන්තු දේශපාලනයෙන්. 2019 ජනාධිපතිවරණයේදී 03%ක ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙන ඉන් පසුව 2024 ජනාධිපතිවරණයේදී 42% ඉක්ම වූ ජනවරමක් ජාතික ජන බලවේගය ලබා ගන්නවා. එය 40%ක පමණ වර්ධනයක්. එය වසර 4 1/4 පමණ කාලයකින් ආසියාවේ හෝ ලෝකයේ හෝ දේශපාලන පක්ෂයක් ඉතා ශීඝ්‍ර නැග්මක් සටහන් කළ අවස්ථාවක්.

ඔක්තෝබර් විප්ලවය වන විට පැවති ශ්‍රේෂ්ඨ අරමුණු එලෙස ම 2024දී ශ්‍රී ලංකාවේ ද දක්නට පුළුවන්. ඒ අනුව රටවල් දෙකේ ම අරමුණු අතර පවතින්නේ සමාන බවක්. යුක්ති සහගත සමාජයක්, සැමට සමාන සමාජයක්, නිෂ්පාදනයට සියල්ලන් දායක කරගත් සමාජයක් මෙන් ම අධ්‍යාපනය පිළිබඳ දැඩි විශ්වාසයක් තබමින් විද්‍යා හා තාක්ෂණයේ ප්‍රතිලාභ ජනතාවට බෙදා දෙන සමාජයක්, ජනාධිපතිවරයා ඇතුළු සමස්ත පාලනය ම නීතියට යටත් වන සමාජයක් බිහිකිරීම මෙන් ම තරගය හැකි තරම් අඩු කළ සමාජයක් නිර්මාණය කිරීම ද මීට අයත්. මේ සියල්ල සමාජවාදී සමාජයක මූලික ලක්ෂණ.

ලෙනින්ගේ පාලන සමයේ මුහුණදුන් ප්‍රතිවිප්ලවය වැනි අවස්ථාවක් දක්නට නොලැබුණත් එම ලක්ෂණ සහිත බීජ තියුණු දේශපාලන විශ්ලේෂකයන්ට මෙහිදී දැකිය හැකියි. සාර්ගේ රුසියාවේ තිබූ සංස්කෘතියට බොහෝදුරට සංකල්පීය ලෙස මේ තත්ත්වය සමාන කරන්නට පුළුවන්.

සංවාද සටහන
**චන්දන මාරසිංහ**






# ටයිම් තේරූ චිත්‍රපට 100

**තුසිත ජයසුන්දර**

සිනමාවේ යහපැවැත්ම, ප්‍රගමනය හා අවශ්‍යතාව සහතික කර ගැනීමේ වගකීම සිනමාව පමණක් ම දැරිය යුතු නැහැ. සිනමා ඉතිහාසයේ මුල් සමයේ පටන් ම දැකගත හැකි වන්නේ සමගාමී මාධ්‍ය සමග අවබෝධයකින්, උචිත ගැලපීම් සහිත ව ක්‍රියා කිරීම මෙහිලා අත්‍යන්තයෙන් ම සඵලදායී වන බව. වෙසෙසින් ම මුද්‍රිත මාධ්‍ය දක්වන සහය හා සහභාගිත්වය කැපී පෙනෙනවා. වර්තමානයේ විකල්ප මාධ්‍ය ප්‍රවණතා ද සිනමාව පොහොසත් කරන වග නන් අයුරින් හඳුනා ගන්නට පුළුවන්. ඇතැම් විකල්ප සිනමා අත්දැකීම් සියුම් ව සඳහන් කරන්නේ සිනමාව ආසක්ත කර ගැනීමේදී එහි ප්‍රදර්ශන අනන්‍යතාව නොසලකා නොහැරිය යුතු ය යන්න. මේ නිසයි සිනමාව මේ වන විටත් ලොව සිය පැවැත්ම, ප්‍රගමනය හා අවශ්‍යතාව සහතික කර ගනිමින් සිටින්නේ.

ලොව පරසිඳු 'ටයිම් සඟරාව' ගෙවුණු දශක ගණනාවේ ලෝක සිනමාවේ නොයෙක් පෙදෙස් විෂය කර ගන්නට දැක්වූ උනන්දුව විෂයෙහි පෙර දැක්වූ අදහස් මනාව දත හැකි වන වග නොරහසක්. ඇමරිකානු සඟරාවක් වුවත් ඇමරිකානු සිනමාව මත ම නොරැඳෙන්නට 'ටයිම්' දැක්වූ උනන්දුව අතිමහත්. මෙතැනදී සිනමාවේ ප්‍රමිතිය සම්බන්ධයෙන් සිදු කළ සනිටුහන් කිරීම වැදගත්. එහි එන සිනමාපට කේන්ද්‍රීය විචාර ප්‍රතිචාර ද ප්‍රකාශයට පත්වන්නේ එම ප්‍රමිතිය යන සාධකය ඉවහල් කර ගනිමින්.

'ටයිම්' වරින් වර ලොව හොඳම සිනමාපට හඳුන්වා දෙමින් සිනමා රසික පාඨකයා දැනුවත් කරන්නේ පෙර කී පරිදි ම ඇමරිකානු සීමා රහිත හෝ අවම අරමුණු සහිත ව. මේ අනුව පෙනී යන්නේ ඇකඩමි සිනමා සම්මාන උළෙල තරමට ම 'ටයිම්'හි සිනමා දැක්ම ද අතිශය බලපෑම් සහගත වන බව. මෙතැනදී පූර්ව ප්‍රතිරූප බිඳ හෝ නොබිඳ නවමු විවරණ කරා යන්නට නොපැකිළෙන අන්දමක් දැක ගන්නට ද පුළුවන්.

ලොව හොඳම සිනමාපට 100 නම් කරන්නට 'ටයිම්'හි සිනමා විචාරිකා Stephanie Zacharek මෑතකදී පියවර ගත්තේ 'ටයිම්' හා සිනමාව අතර සබැඳියාව තවත් වටයකින් මූර්තිමත් කරමින්. 'ටයිම්' විශේෂ සංස්කරණයකින් මෙය ගෙන එනවා සේ ම 'ටයිම්' වෙබ් අඩවිය පරිශීලනයෙන් වඩා සවිස්තර ව මේ පිළිබඳ කරුණු දැන ගන්නට පුළුවන්.

සිරිලක සිනමා විවරණ මේ තෝරා ගැනීම් අරභයා වැඩි සැලකිල්ලක් නොදැක්වීම කනගාටුවට කරුණක්. සිරිලක

සිනමාවේ අන්තර්ජාතික පිවිසුම් පිළිබඳ විමසුමකට මෙය මහෝපකාරී කර ගැනීම අසීරු නැහැ. කිසිදු සිරිලක සිනමාපටයක් මෙතැන නොවීම ද උක්ත අඩු සැලකිල්ලට තුඩු දෙන එක් හේතුවක්.

සිනමා විචාරිකා Stephanie Zacharekගේ සිනමා විචාර භාවිතය 1990 දශකය දක්වා ඈදී යනවා. වසර 1999 සිට වසර 2010 දක්වා ඇය Salon.com වෙබ් අඩවියේ ජ්‍යෙෂ්ඨ ලේඛිකාවක හා සිනමා විචාරිකාවක සේ ක්‍රියා කළ බව සඳහන්. ප්‍රධාන සිනමා විචාරක සේ Movieline වෙබ් අඩවියට ඇය එක්වන්නේ වසර 2010දී. ඉනික්බිතිවයි ඇය The Village Voice නැමැති ඇමරිකානු පුවත් හා සංස්කෘතික ප්‍රකාශනයේ ප්‍රධාන සිනමා විචාරක සේ ක්‍රියා කරන්නේ.

වසර 2015 සිට ඇය 'ටයිම්' සඟරාවේ සිනමා විචාර කාර්යයෙහි නිරත වන්නේ නිව්යෝර්ක් නගරය පාදක කර ගනිමින්. එහෙත් ලෝක සිනමාව ම විශද කරමින්. 2018 වසරේදී 68 වැනි බර්ලින් අන්තර්ජාතික සිනමා උලෙළේ ජූරි සභාව නියෝජනය කරන්නට ද ඇයට ඇරියුම් ලැබුණා.

1920 දශකය ආරම්භයේ සිට 2010 වසර අවසානය දක්වා වූ සියවසක කාලයේ නිර්මිත ලොව හොඳම සිනමාපට 100 තෝරා ගැනීමේදී ඇය වෙසෙසින් අනුගමනය කළ පිළිවෙතක් වූයේ සෑම දශකයක ම හොඳම සිනමාපට 10ක් නම් කිරීම. මෙය ඒ ඒ දශකවල ලෝක සිනමාවේ හැඩරුව හා ගුණාගුණ පිළිබඳ කරුණු අඩංගු ප්‍රතිවිවරණයකට ලැබෙන මනා අවකාශයක්. අන් විචාරක දැක්මකට අනුව මේ තෝරා ගැනීම් අඩ වශයෙන් හෝ මූලික වශයෙන් වෙනස් වන්නටත් පුළුවන්. එහෙත් ඇය ලොව සියලු සිනමා කලාප ආවරණයට දැරූ වෑයම නොතකා හරින්නට බැහැ.

මේ අනුව ඇමරිකානු, ඉතාලි, ප්‍රංශ, ඉන්දියානු හා ජපාන සිනමාපට කිහිපයක් ම ඇගේ ලේඛනයට ඇතුළත්. ලෝක සිනමාවේ නිසැක හැරවුම් අවස්ථා හා ඒවායේ වර්ධිත අවස්ථා සලකා බැලීමට ඇය කෙසේවත් පසුබට වී නැහැ. The Cabinet of Dr. Caligari, The Passion of Joan of Arc, The Rules of the Game, Vretigo යන කීර්තිමත් ඇමරිකානු සිනමාපට අතරට ඉතාලි, ප්‍රංශ, ඉන්දියානු හා ජපාන නව සිනමා ප්‍රවණතා ගෙන ඒම හොඳම නිදසුනක්. ඉතාලි නව යථාර්ථවාදී සිනමාවේ ප්‍රශස්තම අවස්ථාවක් සේ හඳුන්වා දෙන 'Bicycle Thieves', සුප්‍රකට ප්‍රංශ සිනමා නව රැල්ලේ සමාරම්භක අවස්ථා ද්විත්වයක් වූ The 400 Blows හා Breathless, ඉන්දියානු සිනමාව ලොවට විවර කළ 'Pather Panchali', ජපාන සිනමාව විසින් බටහිර සිනමාව අමතනු ලැබූ පුරෝගාමී අවස්ථාවක් වූ 'Seven Samurai' මෙසේ නම් කළ සිනමාපට අතරට එක්කොට තිබෙනවා.

ලොව හොඳම සිනමාපට 100 නම් කිරීම කිසිසේත් ම පහසු කාර්යයක් වන්නේ නැහැ. ඒ ඒ සිනමාපට නිර්මිත කාල වකවානු, සමකාලීන දේශපාලනික හා සංස්කෘතික තතු, තාක්ෂණික මැදිහත්වීමේ ස්වරූපය හා ප්‍රමාණය, විචාර ප්‍රතිචාර හා සම්මාන හිමිවීම් ආදී කාරණා මෙහිදී පාදක කර ගන්නට සිදුවනවා. පශ්චාත් ප්‍රශ්න කිරීම් හමුවේ විපිළිසර නොවීම සඳහා මෙයට අදාළ දැනුවත්වීම වැදගත්.

කලාත්මක, සම්භාවනීය හා විවාදාත්මක ලකුණු මත ම නොරැඳීම සිනමා විචාරිකා Stephanie Zacharekගේ සුවිශේෂත්වයක්. ලොව මුල් පෙළේ සිනමා සමාගම් යටතේ නිර්මිත විනෝදාස්වාදය සිනමානුරූපී ව සහතික කළ සිනමාපට සමුච්චයක් ද මෙසේ ඇය විසින් තෝරා ගනු ලබන්නේ සිනමා විචාරය සතු ඇතැම් පටු හා සීමිත මැදිහත්වීම් ප්‍රශ්න කරමින්. සිනමා විචාරය තවදුරටත් කලාත්මක, සම්භාවනීය හා විවාදාත්මක ලකුණු සහිත සිනමාපට උත්කර්ෂයට නංවමින් සිටින බව ද මෙතැනදී සිහිපත් වනවා.

Some Like is Hot, Jaws, Taxi Driver, The Empire Strikes Back මෙසේ Stephanie Zacharek විසින් තෝරා ගනු ලැබූ විනෝදාස්වාදය සිනමානුරූපී ව සහතික කළ සිනමාපට අතරට එක්වනවා. එහෙත් සිනමාව ලෝක පරිමාණ ව තහවුරු කරලනු පිණිස රසික කේන්ද්‍රීය රසාලිප්ත සිනමාපට මාදිලි ඉටු කළ කාර්යභාරය අරභයා Stephanie Zacharek දැක්වූ අවධානය ප්‍රමාණවත් නැතැයි සිතෙන්නට ද ඉඩ තිබෙනවා. මෙවැනි සිනමාපට මාදිලි ආසියානු සිනමා කලාප වෙතින් ද හඳුනා ගන්නට පුළුවන්.

ලොව හොඳම සිනමාපට හඳුනා ගැනෙන බොහෝ අවස්ථාවලදී 'Citizen Kane' ට හිමි වන්නේ මුල් තැනක්. මෙය සිනමාවේ අනන්‍යතාව, ප්‍රකාශන සමත්කම හා ගැඹුර හදාරන පාර්ශ්ව නිරන්තරයෙන් ම විෂය කර ගන්නා සිනමාපටයක්. එහෙත් 'ටයිම්'හි සිනමා විචාරිකාව සිය තෝරා ගැනීම් සඳහා 'Citizen Kane' සලකා බලන්නේ නැහැ. මෙය නිරනුමාන ව ම විවාදයකට තුඩු දෙන්නක්.

සිනමා විචාරිකා Stephanie Zacharek තවත් මුල් පෙළේ සිනමාකරුවන් කිහිප දෙනකු ම බැහැර කරලීමට පියවර ගෙන ඇත්තේ උක්ත විවාදාත්මක බව තීව්‍ර කරමින්. මෙතැන ඉංග්මාර් බර්ග්මාන්, අන්ඩ්‍රෙයි තර්කොව්ස්කි, අබ්බාස් කියරොස්තාමි යන සිනමාකරුවන් ද සිටිනවා.

ලොව හොඳම සිනමාපට 100 නම් කිරීම කිසිසේත් ම පහසු කාර්යයක් වන්නේ නැහැ. ඒ ඒ සිනමාපට නිර්මිත කාල වකවානු, සමකාලීන දේශපාලනික හා සංස්කෘතික තතු, තාක්ෂණික මැදිහත්වීමේ ස්වරූපය හා ප්‍රමාණය, විචාර ප්‍රතිචාර හා සම්මාන හිමිවීම් ආදී කාරණා මෙහිදී පාදක කර ගන්නට සිදුවනවා. පශ්චාත් ප්‍රශ්න කිරීම් හමුවේ විපිළිසර නොවීම සඳහා මෙයට අදාළ දැනුවත්වීම වැදගත්.

Stephanie Zacharekගේ මේ තෝරා ගැනීම් ලෝක සිනමාවේ අතීත, පසුකාලීන හා වර්තමාන ජයග්‍රහණ පිළිබඳ සංකථනයකට අගනා නිමිත්තක් වන්නේ විකල්ප තෝරා ගැනීම් සඳහා ඇවැසි සාධක මේ ඔස්සේ ම සාක්ෂාත් කර ගත හැකි වීම ද නිසා.

# කියවීම සහ කියවීම

**නුවන් කුමාර කටුගම්පල**

'කියවීම' පිස්සුවක්. ඒ ඔහේ ආවාට ගියාට වල්පල්, ඕපාදූප සහ සම්පප්‍රලාප කියවීම. අප කතා කරන්නේ ඒ කියවීම ගැන නොවෙයි. සාහිත්‍ය මාසය ඉක්ම යාමත් සමග ම ඇරඹෙන කියවීමේ මාසයට අදාළ ව පතපොත කියවීම ගැන.

විවිධ ශබ්දකෝෂ අර්ථකථනවල සම්පිණ්ඩයකට අනුව කියවීම යනු කියවීමේ ක්‍රියාව හෝ කුසලතාවයි. සාහිත්‍ය දැනුමටත් සාහිත්‍යමය ලියවිලි හෝ විධිමත් පාඨ උපුටාගෙන ප්‍රේක්ෂකයන්ට ඇසෙන්නට හෝ ස්වයං ව ශබ්ද නගා කියවීමටත් 'කියවීම' කියා කියනවා. පෙළක් (Text) හෝ තත්ත්වයක් පිළිබඳ විශේෂිත අර්ථකථනයක් දීමට ඇති හැකියාවට කියන්නෙත් 'කියවීම'. පොත්වලින් තොරතුරු ලබා ගැනීමේ කුසලතාව හෝ ක්‍රිකාරකම ද 'කියවීම'. ඔබ යමක් තේරුම් ගන්නා ආකාරයටත් කියන්නේ 'කියවීම' කියා. ලිඛිත වචනවලින් තොරතුරු ලබා ගැනීමේ කුසලතාව හෝ ක්‍රිකාරකම හඳුන්වන්නේත් 'කියවීම' යනුවෙන්. ලේඛනයකින් පෙනීම හෝ ස්පර්ශය ඔස්සේ සංකේතවල අර්ථය ලබා ගැනීමේ ක්‍රියාවලිය ද 'කියවීම' ම වනවා. වචන හඳුනාගැනීම, අක්ෂර වින්‍යාස අවබෝධය, ශබ්ද විද්‍යාත්මක ව ශබ්දය විකාශනය, වචන මාලාව භාවිතයේ චතුරතාව වැනි තත්ත්ව ද ඇතුළත් බහුවිධ ක්‍රියාවලියක් බවට ද අර්ථගැන්වෙන 'කියවීම' සාමාන්‍යයෙන් තනි පුද්ගල ක්‍රියාකාරකමක්. එය නිශ්ශබ්ද ව මෙන් ම යම් විශේෂ අවශ්‍යතා වෙනුවෙන් ශබ්ද නගා සිදු කළ හැකි ක්‍රියාවක්. සාහිත්‍ය කෘතියක් ප්‍රේක්ෂකයාට හෝ පාඨකයාට හෝ කතා කරන්නේ කියවන අවස්ථාවේදී ඉතා සමීප මිතුරකු ලෙස.

පුද්ගලයකුගේ කියවීමේ හැකියාව සාමාන්‍යයෙන් තීරණය වන්නේ භාෂා කුසලතා, ශබ්ද විද්‍යාත්මක දැනුවත්භාවය, චින්තනය, අධ්‍යාපනය, අභ්‍යාසය සහ පරිචය ආශ්‍රයෙන් අවබෝධ කර ගැනීමේ හැකියාව සහ එහි වේගය අනුව. ළමයින් සහ වැඩිහිටියන් විසින් රසෝත්පාදනය සඳහා සහ විනෝදාංශයක් ලෙසත් ලෝකය සහ සමාජය ගැන වැඩි විස්තර දැනගන්නටත් කියවීමයි සාහිත්‍යයට අදාළ ව 'කියවීම' යනුවෙන් අදහස් වන්නේ. එවිට වඩා හොඳ ප්‍රඥාසම්පන්න පාඨක පිරිසක් බිහි වෙනවා. විශේෂයෙන් අනිවාර්ය අධ්‍යාපන කාර්යයක් ලෙස විෂය දැනුම උකහා ගැනීමට පතපොත කියවීම හඳුන්වන්නේ සාහිත්‍යයික කියවීමක් ලෙස නොව 'ඉගෙනීමට කියවීම' ලෙස. කියවන්නට අකමැති අයකුට වෘත්තීයමය අත්‍යවශ්‍යතා නිසා හෝ වෙනත් අවශ්‍යතා නිසා ස්වකීය ධාරිතා සීමාව ඉක්මවා කියවීමට සිදුවීම හෝ ළමයින් බලහත්කාරයෙන් කියවීමට යොමු කිරීම වැනි අවස්ථාවලදී සිදුවන්නේ ඔවුන් ඉක්මනින් ම කියවීමෙන් ඉවත්වීම.

පතපොත කියවීමට සාක්ෂරතාව උදව් වනවා මෙන් ම සාක්ෂරතාව සම්පූර්ණ වීමට කියවීමේ, ලිවීමේ සහ කතා කිරීමේ හැකියාව තිබීම පමණක් ප්‍රමාණවත් නොවන බවයි අධ්‍යාපනඥයන්ගේ අදහස. ඒ අනුව එය සංඛ්‍යාංක අවබෝධය, මාධ්‍ය ඇසුරු කිරීමේත් සවන් දීමේත් තේරුම් ගැනීමේත් හැකියාව, අසන දකින දෙයින් යථා අර්ථ සහ විවිධාර්ථ නිර්මාණය කරගැනීමේ කුසලතාව, ශ්‍රව්‍ය-දෘශ්‍ය සහ ඩිජිටල් ද්‍රව්‍ය භාවිතයෙන් සන්නිවේදනය කිරීමටත් තොරතුරු සම්ප්‍රේෂණය කරමින් සමාජයේ ක්‍රියා කර තම අරමුණු සාක්ෂාත් කර ගැනීමටත් තව කෙනකුගේ දැනුම සහ හැකියා වර්ධනය කිරීමටත් ඇති හැකියාව වැනි අංශ රැසක් නියෝජනය කරන පුළුල් සංකල්පයක්. නූතන භාෂා විශ්ලේෂකයන්ගේ අදහස් "බහු සාක්ෂරතා"




'ළමා පොත් පිළිබඳ ජාතික ප්‍රඥප්තිය' ජනපති අනුර කුමාර දිසානායක වෙත පිරිනැමූ අවස්ථාව



සංකල්පය දක්වා විහිදෙනවා. ඒ අනුව පරිභෝජනය, නිෂ්පාදනය, ඇගයීම හා සම්බන්ධ කුසලතා සහ ආකල්ප ද සාක්ෂරතාවේ පරාසයට ඇතුළත්. ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළ තාක්ෂණික කුසලතා මෙන් ම පරිගණක, පාරිසරික, සෞඛ්‍ය, ප්‍රවාහන යනාදී විවිධ අවශ්‍යතා පිළිබඳ සාක්ෂරතාව ද ඊට අයත්. අද්‍යතන පාඨකයාට මේ දැනුම වැදගත් වන්නේ මිනිසා, අඛණ්ඩ ව මිනිසා ම නිර්මාණය කළ තාක්ෂණය විසින් ග්‍රහණයට ගනු ලබමින් පවතින තත්ත්වයක.

වචන මාලාව සහ ගණිත සංජානන ප්‍රගතිය වර්ධනය වන්නේ විනෝදය සඳහා කියවීමෙන් බවයි පර්යේෂණවලින් සනාථ වී තිබෙන්නේ. ජීවන මට්ටම උසස් වීමට, ජයග්‍රහණ ලබා ගැනීමට, ආතතිය කළමනාකරණයට, මතකය වර්ධනයට, අවධාන ශක්තිය පුළුල් වීමට, ලිවීමේ කුසලතා දියුණු වීමට සහ පරිකල්පනය වැඩිදියුණු වීමට ද එය බහුල ව ඉවහල් වන බවයි නිගමන. මුල් ළමා වියේ පටන් කියවීමට හුරුවීමෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසිභාවය දක්වා ම එම හුරුව ක්‍රියාකාරී වන බව සොයාගෙන තිබෙනවා. වයස්ගත වීමත් සමග ස්වාභාවික ව සිදුවන සංජානන පරිහානිය අවම කළ හැකි මොළය උත්තේජනය කරන ක්‍රිකාරකම් අතර පොත් කියවීම සහ ලිවීම ද සුවිශේෂයි.

ලොව බොහෝ දරුවන් 'ඉගෙනීමේ දරිද්‍රතාවෙන්' පෙළෙනවා. යුනෙස්කෝ අරුත්ගැන්වීම අනුව ඉගෙනීමේ දරිද්‍රතාව යනු 'වයස අවුරුදු 10 වන විට සරල පාඨයක් කියවා තේරුම් ගැනීමට නොහැකි වීම'. පදනම් කුසලතාව එය වුවත් කියවීම, ගණන් කිරීම, මූලික තර්කන හැකියාව, සමාජ-චිත්තවේගීය කුසලතා සහ වෙනත් එවැනි හැකියා ද කියවීමේ ශක්‍යතාව මත රඳා පතින බව පර්යේෂකයන් පෙන්වා දෙනවා. කියවීමේ ප්‍රවීණතාව අනුව සෑම විෂය ක්ෂේත්‍රයක් ඉගෙනීමේදී ම පහසුවෙන් තේරුම් ගත හැකි වන අතර ඒ සඳහා ප්‍රවිශ්ට දොරටුව ලෙස සහ ඉගෙනීමේ මූලික පදනම ලෙසත් 'කියවීම' මිනිසාට සේවය කරනවා.

කියවීමට ඉගෙනීම (Learn to Read) සහ ඉගෙනීමට කියවීම (Read to Learn) යනුවෙන් කියවීමේ ආකාර දෙකක් තිබෙනවා. මෙයින් සාහිත්‍ය ක්ෂේත්‍රයට අදාළ වන්නේ කියවීමට ඉගෙන ගැනීමයි. කියවීමට ඉගෙනීමේදී සිදුවන්නේ මුද්‍රිත වචන පිටුපස ඇති අරුත තේරුම් ගැනීමට අවශ්‍ය කුසලතා අත්පත් කර ගැනීම සඳහා පුහුණුවීම. එවිට දක්ෂ පාඨකයකු බිහිවනවා. එවැනි පාඨකයකුට කියවීමේ ක්‍රියාව සරලවත් ආයාසයකින් තොරවත් ස්වයංක්‍රීය කාර්යයක් ලෙසත් දැනෙනවා. කෙසේ වෙතත් කියවීමට ඉගෙනීමේ ක්‍රියාවලිය සංකීර්ණ කාර්යයක්. එය කුඩා කල සිට වර්ධනය වන සංජානන, භාෂාමය සහ සමාජ කුසලතා මත ගොඩනැගෙන්නක්. සවන්දීම, කථා කිරීම, කියවීම සහ ලිවීම යන මූලික භාෂා කුසලතා හතරෙන් අනෙක්වායේ ව්‍යක්ත බවට ද ඉමහත් ප්‍රයෝජනවත් වන වඩාත් ප්‍රමුඛතම කුසලතාව 'කියවීම'.

කුඩා කල ළමයින් අකුරු දැකීමට පෙර කියවීමට ඉගෙනීමේ පදනම ලෙස භාවිත කෙරෙන්නේ කථනය. කථන භාෂාව ළමා වයසට ප්‍රධාන වන අතර කියවීම කථනය අභිභවා යන ගැඹුරු කාර්යයක්. අප ජීවත් වන පරිසරය ද කියවීමේ කුසලතා ලබා ගැනීමේ හැකියාව කෙරෙහි බලපානවා. නිදසුනක් ලෙස පරිසර ශබ්ද දූෂණයට නිතිපතා නිරාවරණය වන ළමයින්ගේ භාෂා හැකියාව අඩුවන අතර කියවීමේ දුර්වලතා ද ඇතිවන බව සොයාගෙන තිබෙනවා. නිතර සාධනීය කතාබහ ඇසුරේ නිදහස් හා නිස්කලංක පරිසරයක ජීවත් වන ළමයින්ගේ භාෂා හැකියාව වැඩි වන අතර කියවීමේ ප්‍රවීණතාව වර්ධනය වන බවත් පිළිගැනෙනවා. කෙසේ වෙතත් කියවීම ස්වභාවික ක්‍රියාවලියක් නොකර කුඩා කල සිට ම 'ක්‍රමානුකූල මග පෙන්වීමේ සහ ප්‍රතිපෝෂණ' ක්‍රියාවලියකින් එය ඉගැන්විය යුතුයි. එනම් 'දරුවන්ට කියවීමට වඩා ඔවුන්ට කියවීමට ඉගැන්වීම' වැදගත්.

අධ්‍යාපන අමාත්‍යාංශය, සංස්කෘතික අමාත්‍යාංශය, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය වැනි ආයතනවලට අයත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ලෝක ළමා දිනය සහ ජාතික කියවීමේ මාසයට අදාළ ව පවත්වන විවිධ ක්‍රිකාරකම් අතර පතපොත කියවීමට සම්බන්ධ වැඩසටහන් ද වනවා. මේවායේ අරමුණ වන්නේ හරවත් දේ කියවීමෙන් සමබර පෞරුෂයකින් හෙබි සහකම්පනයෙන් යුත් සංවේදී දැනුමැති පරපුරක් බිහිකරලීම සඳහා සෑම කෙනකුට ම කියවීම යාවජීව පුරුද්දක් බවට පත් කිරීම. කියවීමේ වටිනාකම පිළිබඳ දැනුවත් කිරීමට දේශන, වැඩමුළු, සාකච්ඡා, වාද විවාද, කථික සහ ලිඛිත තරග ආදිය පැවැත්වීම මේ සඳහා වන ප්‍රායෝගික ක්‍රියාකාරකම්. පෝස්ටර් ප්‍රදර්ශන, පොත් ප්‍රදර්ශන ආදිය පැවැත්වීම ද එහිදී සිදු

වනවා. කියවීම් කඳවුරු පැවැත්වීම, සාහිත්‍යධරයන් සමග සම්මුඛ වීමට අවස්ථා සැලැස්වීම, පුස්තකාල සංවර්ධනය කිරීම සහ ජංගම පුස්තකාල ඇති කිරීම, අලුත් පොත් ප්‍රකාශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පාඨක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යනාදිය ද මේ අතරට ඇතුළත්.

ඒ ඒ වයස් කාණ්ඩ සඳහා ගැළපෙන ඉලක්කගත පොත්පත් සම්පාදනය, කියවීම් ද්‍රව්‍ය සකස් කිරීම වැනි කාර්යයන්ට අදාළ ව ජාත්‍යන්තරයේ විශේෂ නිර්ණායක පද්ධති සකස් කර තිබෙනවා. ශ්‍රී ලංකාවට ද එවැන්නක අවශ්‍යතාව දැනී බොහෝ කල්. අධ්‍යාපන අමාත්‍යාංශය, කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල විඥාපන විද්‍යා ආයතනය (NILIS), ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, විවිධ රාජ්‍ය නොවන සංවිධාන යනාදී ආයතන වසර ගණනාවක් මුළුල්ලේ මේ සඳහා පර්යේෂණ, සමීක්ෂණ යනාදිය සිදු කරනවා.

පසුගිය සැප්තැම්බර් 28 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පැවැත්වුණු කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී ජනාධිපති අනුර කුමාර දිසානායක වෙත පිරිනැමූ ළමා පොත් පිළිබඳ ජාතික ප්‍රඥප්තියේ තේමාව වන්නේ 'දැයේ දරුවන්ට කියවීම සඳහා ගුණාත්මක පොතක්' යන්න. අධ්‍යාපන අමාත්‍යාංශයේ ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය සහ Room to Read Sri Lanka ආයතනය අනෙකුත් විෂයානුබද්ධ ආයතනවල ද දායකත්වය ඇති ව ක්‍රියාත්මක 'ළමා පොත් පිළිබඳ ජාතික සමුළුව (NCCB)' විසින් විෂය ප්‍රාමාණිකයන්ගේ ද උපදෙස් ලබාගෙන එය ප්‍රකාශයට පත් කළා. කාලීන අවශ්‍යතාව හඳුනාගෙන ගුණාත්මක කියවීමකට ජාතියේ අනාගතය මෙහෙයවීම සඳහා තැබූ සාධනීය පියවරක් බවට එය පත් වනවා.

රටක් සංවර්ධනය කිරීමේදී දැනුම අත්‍යාවශ්‍ය සාධකයක්. 'කියවීම' දැනුම ලබා ගැනීමේ වැදගත් ම ප්‍රභවයක්. නමුත් කියවීමේ මූලික පරමාර්ථය විය යුත්තේ මිනිසුන්ට ක්‍රියාශීලී හා නිර්මාණාත්මක වීමට අවශ්‍ය සහය ලබාදෙමින් ඔවුන් ශික්ෂණය කිරීම සාහිත්‍යකරුවාගේත් පාඨකයාගේත් අභිලාෂ මුදුන්පත් වන්නේ එවිට.



# සොඳුරු දඩබ්බරයා

## ඩබ්ලියු ජයසිරි

**නුවන් කුමාර කටුගම්පල**

ඔහු ඩබ්ලියු. ජයසිරි. අවුරුදු 77ක් වන සිය පෞද්ගලික දිවිපෙවෙතේ ද අවුරුදු 54ක් ඉක්මවූ සිය කලා දිවිපෙවෙතේ ද හිතුවක්කාරකම එක සේ අනුගමනය කළ අයෙක් ඔහු. ඒ හිතුවක්කාරකම ඔහු භාවිත කළේ ඕනෑ ම දෙයක් සම්බන්ධ ව තමා නිවැරදියැයි දරන මතය සනාථ කිරීමට.

සුගතපාල ද සිල්වා, ධර්මසේන පතිරාජ, මහාචාර්ය කාලෝ ෆොන්සේකා, ප්‍රේමසිරි කේමදාස, ජෝ අබේවික්‍රම, පියසේන අහංගම, කේ.ඞී.කේ. ධර්මවර්ධන, විජය කුමාරතුංග වැනි ජ්‍යේෂ්ඨ නිර්මාණකරුවන්ගේ ප්‍රබුද්ධ ඇසුරේ තලකොටුව වත්තේ පිහිටි පී.බී. ඉලංගසිංහගේ කලා නිවහනේ සහ 'අපේ කට්ටියේ' නිර්මාණශීලී හැදෑරීම් ඇසුරේ ලද පරිචයෙනුත් සහජයෙන් ලද ජානමය උරුමය ස්වයං ව සංවර්ධනයෙනුත් රංගවේදියකු වීම නිසා දිවි ඉම තෙක් ම ඔහු රැඳී සිටියේ අහසේ නොවෙයි, පොළොවේ. ජීවිතය, කලාව, සමාජය සහ දේශපාලනය අරභයා පටු සරල දෘෂ්ඨියක නොපිහිටි ඔහු ක්‍රියා කළේ ගැඹුරු දැක්මක් ඇති ව. මේ, ඔහුගේ සමුගැන්මෙන් පසු (සැප්තැම්බර් 22) දෙසතිය තබන සටහන.

'ඩබ්ලියු' අක්ෂරය ඔහුගේ මුල් නම තරමට ම ජනසම්මත වන තුරු 'ඩබ්ලියු ජයසිරි' යන නම ජන හදවත්වල ලියාපදිංචි වුණා. ඒ, පෙනුමෙන් නළුවකු නොවූවත් ඔහු ක්‍රියාවෙන් නළුවකු වූ නිසා. ඔහුගේ වෘත්තීයභාවය ප්‍රමුඛ ව කැපී පෙනුණේ රංගනයෙන් වුවත් ගුවන්විදුලිය, නාට්‍යය, සිනමාව, ටෙලිනාට්‍යය, වෙළෙඳ ප්‍රචාරණය යනාදී ක්ෂේත්‍රවල ද ඔහු වෘත්තිකයෙක්. නිෂ්පාදනය, අධ්‍යක්ෂණය, සහාය අධ්‍යක්ෂණය, පිටපත් රචනය, නිවේදනය, කලා අධ්‍යක්ෂණය, ගීත රචනය සහ විචාරය යන ක්ෂේත්‍රවල ඔහු දැක්වූ ප්‍රවීණත්වය ද විශිෂ්ට වූවක්. ඔහුට ම ආවේණික රසවත් භාෂා ශෛලියක් අනගමනය කරමින් 'සිරිසේන සහ තෙපානිස් සමග දේශද්‍රෝහී බල්ලා', 'මතක සමග ලට්ට ලොට්ට', 'ඉතුරු මිතුරු මතක සමග මා ලියූ ගී' වැනි කෘති රචනා කළ ගත්කතුවරයා වන්නේත් ඔහු. ප්‍රකට සමාජ විශ්ලේෂකයකු වූ ඔහු ජනාදරය නිසල ව ඉවසුවා මිස එය ඇගයුම්, සම්මාන, සහතික, පුද්ගලික ලාභ ප්‍රයෝජන හෝ විවිධ වරදාන වරප්‍රසාද සඳහා අවභාවිත කළේ නැහැ.

කලාවට ඔහුගේ ප්‍රවේශය සිදුවන්නේ පාසල් වේදිකාවෙන්. ඒ, 60 දශකය අගභාගයේදී පමණ. ශ්‍රී ලංකා ගුවන්විදුලිය සංස්ථාවේ ක්‍රියාකාරී සහායකයකු ලෙස මුලින් ම රාජ්‍ය සේවයට බැඳුණු ඔහු අධ්‍යක්ෂණය කළ ප්‍රථම ගුවන්විදුලි නාට්‍යය 'සහෝ'. ඔහු එහි හඬ නළුවකු ද වුණා. ගුවන්විදුලිය ධර්ම දේශනා වැඩසටහනට නිෂ්පාදනයෙන් දායක වුණේත් ඔහු. නැවත රජයේ සේවයට නොඑන අදිටනින් ඔහු ගුවන්විදුලියෙන් සමුගත්තේ වසරක් ඉක්මවූ කෙටි කාලයකින්.

'ඩබ්ලියු' අක්ෂරය ඔහුගේ මුල් නම තරමට ම ජනසම්මත වන තුරු 'ඩබ්ලියු ජයසිරි' යන නම ජන හදවත්වල ලියාපදිංචි වුණා. ඒ, පෙනුමෙන් නළුවකු නොවූවත් ඔහු ක්‍රියාවෙන් නළුවකු වූ නිසා. ඔහුගේ වෘත්තීයභාවය ප්‍රමුඛ ව කැපී පෙනුණේ රංගනයෙන් වුවත් ගුවන්විදුලිය, නාට්‍යය, සිනමාව, ටෙලිනාට්‍යය, වෙළෙඳ ප්‍රචාරණය යනාදී ක්ෂේත්‍රවල ද ඔහු වෘත්තිකයෙක්. නිෂ්පාදනය, අධ්‍යක්ෂණය, සහාය අධ්‍යක්ෂණය, පිටපත් රචනය, නිවේදනය, කලා අධ්‍යක්ෂණය, ගීත රචනය සහ විචාරය යන ක්ෂේත්‍රවල ඔහු දැක්වූ ප්‍රවීණත්වය ද විශිෂ්ට වූවක්.

සුගතපාල ද සිල්වාගේ 'හරිම බඩු හයක්', 'හිතහොඳ අම්මණ්ඩි', 'නිල්කටරොල් මල්', 'දුන්න දුනු ගමුවේ', 'මරාසාද්' යනාදී නාට්‍ය පෙළහරේ දැක්වූ නිෂ්පාදන දායකත්වය, අනුග්‍රහය සහ රංගන ප්‍රභාව ජයසිරිගේ රිදී තිර ආගමනයට දැඩි පිටිවහලක් වුණා. චිත්‍රපටයක ප්‍රධාන චරිතයකට පණ නොපොවා මේ තරම් ජනාදරයක් ඔහු ලබා ගත්තේ තමාට ලැබුණු ඕනෑ ම චරිතයක් සත්‍ය චරිතයේ යථා පිළිඹුවක් වන පරිදි රඟපෑමට දැක්වූ නිපුණත්වය නිසා. ධර්මසිරි බණ්ඩාරනායකගේ 'යක්ෂාගමනය'ට ද ප්‍රබල රසික ආකර්ෂණයක් ලැබෙන්නට ඔහුගේ රංගනයේ ආලෝකය බලපෑවා. ආචාර්ය ධර්මසේන පතිරාජගේ 'පොන්මනි', 'පාර දිගේ' සහ 'සොල්දාදු උන්නැහේ'




ජීවිතයේ අවසන් වරට සුදර්ශියේදී උපහාර සම්මානයට පාත්‍ර වෙමින්

සිනමා කෘතිවල සහාය අධ්‍යක්ෂවරයා වූ ඔහු 'සොල්දාදු උන්නැහේ'ට තිරනාටක රචනයෙන් සම දායකත්වය ද ලබා දුන්නා. ආචාර්ය පතිරාජගේ 'බඹරු ඇවිත්' චිත්‍රපටයේ එන 'හඳුනා ගත්තොත් ඔබ මා' ගීතයෙන් ඔහු චිත්‍රපට ගීත රචකයකු ලෙස ජනප්‍රියත්වය ලැබුවා. එච්. ඩී. ප්‍රේමරත්න සිනමාකරුගේ 'විසිදැලෙන්' අනු ප්‍රධාන චරිතයකට හිමිකම් ලැබෙන තුරු ම සිය නළු ජීවිතයේ ප්‍රධාන චරිතයක හෝ සහාය නළු චරිතයක හෝ රඟපා නොතිබීම ඔහුගේ රංගන ජීවිතයේ එක් සුවිශේෂ පරිච්ඡේදයක සාකච්ඡා විය යුතු කාරණයක්. චිත්‍රපට රැසක ප්‍රධාන චරිත රඟ පෑ ඇතැම් නළු නිළියන්ට වඩා ජයසිරි නළුවකු ලෙස ප්‍රචලිත වී රසික ප්‍රසාදය දිනා තිබුණේ සහෘද මතකයේ නිදන්ගත වන තරම් ප්‍රබල රූපණ කාර්යය හේතුවෙන්. එච්. ඩී. ප්‍රේමරත්නගේ 'සෙයිලම', වසන්ත ඔබේසේකරගේ 'දියමන්ති', සුමිත්‍රා පීරිස්ගේ 'දුවට මවක මිස', ධර්මසිරි බණ්ඩාරනායකගේ 'බවදුක' සහ 'බවකර්ම'. පරාක්‍රම නිරිඇල්ලගේ 'අයෝමා', සරත් ගුණරත්නගේ 'චිට්ටි', අශෝක හඳගමගේ 'මේ මගේ සඳයි' සහ 'තනි තටුවෙන් පියාඹන්න', සුදත් රෝහණගේ 'සුදු කළුවර', අයි. එන්. හේවාවසම්ගේ 'මී හරකා', ප්‍රියන්ත කොළඹගේගේ 'අරුමෝසම් වැහි', බුද්ධික කීර්තිසේනගේ 'මිල්ලෙ සොයා', විමුක්ති ජයසුන්දරගේ 'අහසින් වැටෙයි' ඇතුළු චිත්‍රපටවල ඔහු රඟපෑවේ එකිනෙකට වෙනස් සුළු චරිත වුවත් ඒවා නොමැකෙන චරිත.

ආචාර්ය ධර්මසේන පතිරාජගේ 'කඩුල්ල', ජයන්ත චන්ද්‍රසිරිගේ 'දඬුබස්නාමානය', තිළිණ බොරලැස්සගේ 'සිඳු' යනාදී දීර්ඝ ටෙලිනාට්‍යවලත් විවිධ නිර්මාණකරුවන් විසින් අධ්‍යක්ෂණය කළ ඒකාංගික ටෙලිනාට්‍ය රැසකත් ඔහු රඟපෑ එකිනෙකට වෙනස් චරිත අතර ආන්දෝලනාත්මක විකල්ප ධාරාවේ චරිත සහ පැවිදි චරිත වැඩිපුර හමුවනවා.

1980-85 දක්වා අවුරුදු 5ක් ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය සම්බන්ධ ජාත්‍යන්තර ආයතනයක නිර්මාණශීලී පිටපත් රචකයකු ලෙස මැදපෙරදිග රැකියාවක නිරතවීමෙන් ඉපැයූ මුදලින් වැඩිකොටසක් 'මරාසාද්' නාට්‍යයේ නිෂ්පාදනයට යෙදවීම ම ඔහුගේ කලාත්මක දෘෂ්ටිය හෙළිපෙහෙළි වන හොඳම අවස්ථාවක්. එම මුදලේ ඉතිරි කොටසින් මිලදී ගත් නිවස විකුණා සිනෙ වීඩියෝ ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනය



මරාසාද්හි සාද්



කඩුල්ලේ කරන්නාගොඩ අප්පුහාමි

පිහිටවූයේ කලාත්මක නිර්මාණ කිරීමට නිර්මාණකරුවන්ට අතහිත දීමට. එය ද පසුව බංකොලොත් වුණා. සත්‍ය වශයෙන් ම ජයසිරි යනු ජීවත් වීම සඳහා කලාව භාවිත නොකළ කලාව වෙනුවෙන් ජීවත් වූවෙක්. බොහෝ ඇසූපිරූ තැන් ඇත්තෙක්. සාමාන්‍ය ව්‍යවහාරයේදී වගේ ම නිර්මාණාත්මක ලේඛනයේදී ද උපහාසය, උත්ප්‍රාසය මුසු ගැඹුරකින් යුත් රසවත් භාෂා ශෛලියක් අනුගමනය කරන්නට පෙළඹුණු අයෙක්.

යොවුන් වියේ සිට ම දෙස් විදෙස් සම්භාව්‍ය සිනමා කෘති සහ විශිෂ්ට නාට්‍ය කෘති පරිශීලනය කිරීමේ පිපාසය සිය අධ්‍යයන කාර්යයක් සේ සැලකීම නිසා ඔහුගේ භාවිත දැනුම දිගුකාලීන ව යාවත්කාලීන වෙමින් සංවර්ධනය වුණා. තම සහජ හැකියාව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කොළඹ මණ්ඩපයෙන් ලද ශාස්ත්‍ර ඥානයෙන් පෝෂණය කර ගත් ජයසිරි සිය විශිෂ්ට නිර්මාණ පරිශීලනය, විෂයානුබද්ධ පත පොත කියවීම සහ ප්‍රවීන හා නවීන ශිල්පීන්ගේ නිරන්තර සමාගමය යන ශාස්ත්‍රාල තුනෙන් ද දැනුම ලබා ගත්තා. සිය වෘත්තීයේ අභිවෘද්ධිය සහ යාවත්කාලීන බව සඳහා එය උචිත පරිදි භාවිත කළා. කලාවේ සම්භාවනීය බවත් තමාගේ රූපණවේදී පෞරුෂයත් අතර සමබරතාව රැක ගන්නටත් ඔහු ඒ පරිචය ප්‍රයෝජනයට ගත්තා. යෞවන ජයසිරි තුළ ජීවත් වූ රැඩිකල් මිනිසා ම වයස්ගත ව ඔහු මිය යන නිමේෂය දක්වා ම තමා තුළ ජීවත් කරගන්නට ඔහු හපනෙක් වුණා.

සනත් නන්දසිරි ගැයූ 'නිදිකුම්බා මල්කැකුළී' ගීතය ඔහුගේ පළමු ගීත පද රචනාව වන අතර කුළුඳුල් ටෙලිනාට්‍ය අධ්‍යක්ෂණය 'මුරුගසං'. ඔහුට චිත්‍රපටයක කැපී පෙනෙන ප්‍රධාන චරිතයක් ලබා දීමට මේ රටේ සිනමාකරුවකු ඉදිරිපත් නොවීම නිසා අසාධාරණය සිදුවූයේ ඔහුට පමණක් නොවෙයි, සිංහල සිනමාවටත්.

වසර 40කට අධික කාලයක් සිංහල සංස්කෘතික ආයතනයේ සාමාජිකයකු ලෙසත් වසර ගණනාවක් එහි විධායක සභාවේ සභිකයකු ලෙස සහ ගරු සභාපති ලෙසත් ඔහු ක්‍රියා කළා. කලාකරුවන්ගේ සුභ සාධනය සහ කලා සංස්කෘතික ක්ෂේත්‍රවල ප්‍රගමනය උදෙසා එහිදී ඔහු දැක්වූයේ ප්‍රශංසනීය දායකත්වයක්. ඔහුගේ එම කැපවීම සහ දක්ෂතා ඇගයීම සඳහා 'හඳුනා ගත්තොත් ඔබ මා' මැයෙන් ඇගයුම් උලෙළක් සුදර්ශි ආයතනයේදී පැවැත්වුණේ සමුගැන්මට මසකට පමණ පෙර. එහිදී ඔහු ප්‍රණාම සම්මානයෙන් පිදුම් ලැබුවා.

කලා ක්ෂේත්‍රයේ සහ පෞද්ගලික ජීවිතයේ රසවත් අත්දැකීම් අළලා අල්ලාප සල්ලාපයේ යෙදීමට රුසි ඔහු එවැනි අවස්ථාවල කළ සෑම දෙඩුමක ම ගැඹුරු සමාජ කාරණාවක් සැඟවී තිබුණා. ඒ කාරණා රසවත් වගේ ම හරවත්. කලාව සහ අපේ කලාකරුවාගේ කලා භාවිතාව ද උපත, විවාහය, මරණය සහ ජීවිතය යනාදී සංකල්ප භාවිතාව ද ආගම, සංස්කෘතිය සහ පොදු සමාජය සම්බන්ධ භාවිතාව ද ඔහු දරන මතයටත් ඔහු කියන ප්‍රකාශයටත් බොහෝ විට ප්‍රතිපක්ෂ වුණේ නැහැ. සරල ගැඹුරු මනුෂ්‍යයකු වූ ඔහු කියූ දේ කළ සහ කළ දේ කියූ අයෙක්. ඇතැමුන්ගේ ගෞරවයට සහ පිළිගැනීමටත් ඇතැමුන්ගේ ප්‍රතික්ෂේප වීමට සහ නිර්මාණ සඳහා දායක කර නොගැනීමටත් එක සේ බල පෑවේ ඔහුගේ මේ දඩබ්බර ගති ලක්ෂණ. ඒ ප්‍රතිචාර සියල්ල ඔහු පිළිගත්තේ සම ව. ඩබ්ලියු. ජයසිරි එහෙමයි.

ඡායාරූප
**උදේනි අල්විස්**

# දෙවැයේ අභියෝගය



සමිත දුලාන් කොඩිතුවක්කු

නොබෝද ප්‍රංශයේ පැරිස්හිදී අවසන් වූ 2024 ඔලිම්පික් තරගාවලියෙන් අනතුරු ව සුපුරුදු ලෙස එහි ම පැරාලිම්පික් තරගාවලිය ද පැවැත්වුණා. ඒ, අගෝස්තු 28 සිට සැප්තැම්බර් 08 දක්වා. කායික අබාධ සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා වන එම තරගාවලියේ මෙවර ද පෙරමුණ ගැනීමට සහ තම ආධිපත්‍යය පතුරුවන්නට චීනය සමත් වුණේ 2004 වසරේ සිට අඛණ්ඩ ව ඔවුන් අත්කරගෙන සිටින තත්ත්වය තවත් ඉදිරියට ගෙන එමින්. මිට පෙර 2004, 2008, 2012, 2016, 2020 (කොවිඩ් 19 හේතුවෙන් 2021 වසරේ පැවැත්වුණු) පැරා ඔලිම්පික් තරගවල ද චීනය පෙරමුණ ගෙන සිටියා.

පැරාලිම්පික් උලෙළ නිල වශයෙන් ආරම්භ වූයේ 1960 වසරේ. වර්තමානයේ මෙය ගිම්හාන පැරාලිම්පික් උලෙළ ලෙස හැඳින්වෙන්නේ ශිත හා ගිම්හාන (ග්‍රීෂ්ම) වශයෙන් පැරාලිම්පික් උලෙළ දෙකක් පැවැත්වෙන නිසා. මෙවර පැවත්වුණේ ගිම්හාන පැරාලිම්පික් උලෙළ. ඔලිම්පික් උලෙළ මෙන් ම වසර හතරකට වරක් ඔලිම්පික් උළෙලට සමගාමී ව ගිම්හාන පැරාලිම්පික් උළෙල පැවැත්වෙන්නේ ද ඔලිම්පික් උළෙල පැවති නගරයේ ම වීම විශේෂත්වයක්.

1976 වසරේ ආරම්භ වූ ශිත ඍතු පැරාලිම්පික් උලෙළ මුල් කාලයේදී සිව් වසරකට වරක් ඔලිම්පික් උළෙල පැවති වසරේ ම පැවැත්වුවත් 1992 වසරෙන් පසු නැවත පැවැත්වුණේ 1994 වසරේ. එතැන් සිට ඔලිම්පික් උලෙළ පැවැත්වීමෙන් වසර දෙකකට පසු සිව් වසරකට වරක් මෙය පැවැත්වෙනවා. නිදසුනක් ලෙස 1994 වසරෙන් පසු ශීත පැරාලිම්පික් උලෙළ පැවැත්වූයේ 1998 වසරේ. ඒ, 1996 ඔලිම්පික් උලෙළ පැවැත්වීමෙන් වසර දෙකකට පසු.

පැරාලිම්පික් ඉතිහාසයේ දස්කම් දැක්වූවන් අතර එක්සත් ජනපදයේ පිහිනුම් ක්‍රීඩිකා ට්‍රිෂා ෂෝන් (Trischa Zorn) අමතක කරන්නට බැහැ. උපතින් ම අන්ධ වන ඇය 1980 සිට 2004 දක්වා පැරාලිම්පික් තරගාවලිය නියෝජනය කරමින් දිනා ඇති පදක්කම් ගණන 55ක්. එයට රන් පදක්කම් 41ක්, රිදී පදක්කම් 09ක් හා ලෝකඩ පදක්කම් 05ක් ඇතුළත්.

මෙවර තරගාවලියේ චීනය පෙරමුණ ගත්තේ රන් 94ක්, රිදී 76ක්, ලෝකඩ 50ක් ලෙස පදක්කම් 220ක් දිනා ගනිමින්. දෙවැනි ස්ථානයට පැමිණි මහා බ්‍රිතාන්‍යය රන් 49ක්, රිදී 44ක්, ලෝකඩ 31ක් ලෙස ලැබූ පදක්කම් සංඛ්‍යාව 124ක්. පදක්කම් සටහනෙහි අංක 01ට පැමිණි ඇමරිකා එක්සත් ජනපදයට පැරාලිම්පික් උලෙළේදී හිමිවූයේ තුන් වැනි ස්ථානය වීම ද අමතක කළ නොහැක්කක්. ඔවුන් අත්කර ගත් සමස්ත පදක්කම් ගණන 105ක්.

ක්‍රීඩා 22ක තරග ඉසව් 549කින් සමන්විත වූ මෙවර පැරාලිම්පික් උලෙළට ක්‍රීඩකයන් 4463ක් තරග

**අනිල් වීරසිංහ**



2024 පැරාලිම්පික් තරගාවලියට සහභාගි වූ කණ්ඩායම

ලෝකඩ පදක්කම්ලාභී සමිත දුලාන් කොඩිතුවක්කු මෙවර ශ්‍රී ලංකා පිල මෙහෙයවීම කැපී පෙනුණා. ඔහු නායකත්වයට නියම අරුතක් ලබා දුන්නේ 2024 පැරාලිම්පික් තරගාවලියේ පිරිමි එෆ් 64 කාණ්ඩයේ හෙල්ල විසි කිරීමේ ඉසව්වෙන් රිදී පදක්කම දිනා ගනිමින්. එහි රන් පදක්කම දිනාගැනීමට ඉන්දීය ක්‍රීඩක සුමිත් ඇන්ටිල් සමත් වුණා. විශේෂත්වය වන්නේ සමිත දුලාන් රිදී පදක්කම ජය ගත්තේ නව වාර්තාවක් ද සමගින් වීම. ඒ, මීට පෙර ඔහු විසින් ම තබා තිබූ ලෝක වාර්තාවක් අලුත් කරමින්. ඔහු මෙවර තරගාවලියේ ශ්‍රී ලංකාව වෙනුවෙන් පදක්කමක් දිනූ එක ම ක්‍රීඩකයා ද වනවා.

1990 වසරේ දෙනියායේ උපත ලබා ඇති දුලාන් දෙනියාය මධ්‍ය මහා විදුහලෙන් හා රාහුල විදුහලෙන් අධ්‍යාපනය ලැබූ අතර පාසල් වියේ සිට ම හෙල්ල විසිකිරීමේ ක්‍රීඩා ඉසව්වෙන් දස්කම් දැක්වූවා. පසුව ශ්‍රී ලංකා යුද හමුදා පොලිසියේ සේවයට බැඳුණා. සහභාගි වූ ජාතීන් 170ක් අතරින් පදක්කම් ගණනින් කෙන්යාව සමග සම ව 75 වැනි ස්ථානයට පත් ශ්‍රී ලංකාව 2024 පැරාලිම්පික් උළෙලේ තරග ඉසව් තුනකට සහභාගි වූයේ එක් ක්‍රීඩිකාවක් හා ක්‍රීඩකයන් 07 දෙනකු ලෙසින් තරගකරුවන් 08 දෙනකු සමග. ඉන්දික ගමගේ, අනිල් ප්‍රසන්න ජයලත්, ප්‍රදීප් පුවක්පිටිකන්ද, පාලිත හල්ගහවෙල, දුලාන් කොඩිතුවක්කු, ජනනි වික්‍රමසිංහ, නවීඩ් රෂින්, සුරේෂ් ධර්මසේන එම පිරිසට අයත්.

2020 පැරාලිම්පික් තරගාවලියේ එෆ් 64 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් දින ඔහු 2016 යුද හමුදා ආධුනික මලල ක්‍රීඩා තරගාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ රන් පදක්කම දිනා ගැනීම දේශීය ක්‍රීඩා පිටියේ ඔහු ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක්. පසු කලෙක රිය අනතුරක් හේතුවෙන් ඔහුගේ දකුණු පාදය අබාධිත වීම මත පැරා මලල ක්‍රීඩාව සඳහා යොමුවීමට ඔහුට සිදු වුණා. 2018 වසරේ පැරා යුද හමුදා මලල ක්‍රීඩා තරගාවලිය හෙල්ල විසිකිරීම රන් පදක්කම, 2018 ජාතික පැරා මලල ක්‍රීඩා තරගාවලිය රිදී පදක්කම ඔහු ජය ගත් දේශීය තරගමාලා අතර කැපී පෙනුණු අතර අන්තර්ජාතික ජයග්‍රහණ අතරින් කැපී පෙනුණේ 2019 ඩුබායිහි පැවති ලෝක පැරා ශූරතා තරගාවලියේදී තම ඉසව්වේ සිව් වැනි ස්ථානය ජයගැනීම. මේ හේතුවෙන් ම 2020 පැරා ඔලිම්පික් තරගාවලිය සඳහා ඔහුට අවස්ථාව හිමි වුණා. 2020 පැරා ඔලිම්පික් තරගාවලියේ ලෝකඩ පදක්කම දිනා ගැනීමෙන් අනතුරු ව 2023 පැරිස් පැරා ලෝක ශූරතා උළෙල ලෝකඩ පදක්කමත් 2024 ජපාන පැරා මලල ක්‍රීඩා ලෝක ශූරතාවලිය රිදී පදක්කමත් ඔහු අත්කරගත් සෙසු අන්තර්ජාතික ජයග්‍රහණ අතර විශේෂ වනවා.

ශ්‍රී ලංකාව මුලින් ම 1996 වසරේ තරගාවලිය නියෝජනය කිරීමෙන් අනතුරු ව වඩාත් සාර්ථක ප්‍රතිඵල අත්කරගත් තරගාවලිය වන්නේ 2020 තරගාවලිය. ශ්‍රී ලංකාව මුල්වරට රන් පදක්කමක් දිනාගැනීමට සමත් වූ පැරා ඔලිම්පික් උළෙල ලෙස එය ඉතිහාසයට එක්වීමත් විශේෂත්වයක්. පැරා ඔලිම්පික් පමණක් නොව සමස්ත ඔලිම්පික් උළෙල ශ්‍රී ලංකාව ජයගත් මුල් ම රන් පදක්කම ලෙස එවර දිනේෂ් ප්‍රියන්ත හේරත් දිනූ රන් පදක්කම සඳහන් කරන්නට පුළුවන්. 2020 වසරට පෙර ඔලිම්පික් උළෙලකදී 1948 වසරේ ඩන්කන් වයිට් හා 2000 වසරේ සුසන්තිකා ජයසිංහ රිදී පදක්කම් ජය ගත්තා. 2018 ගිම්හාන යොවුන් ඔලිම්පික් උළෙලේදී පාරමී වසන්ති මාරිස්ටෙලා ලෝකඩ පදක්කමක් ජය ගත්තා. පැරා ඔලිම්පික් උළෙලක ශ්‍රී ලංකාව පදක්කමක් දිනාගත් මුල් ම අවස්ථාව ලෙස 2012 වසරේ ලන්ඩන් උළෙලේදී ප්‍රදීප් සංජය මීටර් 400 ටී 46 ධාවන ඉසව්වෙන් ලෝකඩ පදක්කමක් ජයගත් අවස්ථාව විශේෂ වනවා. 2016 බ්‍රසීලයේ රියෝ ද ජෙනයිරෝහි පැවති තරගාවලියේදී දිනේෂ් ප්‍රියන්ත හේරත් එෆ් 46 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් ලෝකඩ පදක්කමක් දිනාගැනීමට සමත් වුණා. එම ලෝකඩ පදක්කමේ ජයග්‍රහණය තම ඉසව්වේ ලෝක වාර්තාවක් ද සමගින් රන් පදක්කමක් දක්වා ඉහළට එසවීමට 2020 වසරේදී ඔහුට හැකියාව ලැබුණා. එය මෙරට ක්‍රීඩා ඉතිහාසයේ අමරණීය අවස්ථාවක්. ඔහුට අමතර ව සමිත දුලාන් කොඩිතුවක්කු එෆ් 64 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් එවර ලබාගත් ලෝකඩ පදක්කම ද කැපී පෙනෙන්නක්.

**ශ්‍රී ලංකාව මුලින් ම 1996 වසරේ තරගාවලිය නියෝජනය කිරීමෙන් අනතුරු ව වඩාත් සාර්ථක ප්‍රතිඵල අත්කරගත් තරගාවලිය වන්නේ 2020 තරගාවලිය. ශ්‍රී ලංකාව මුල්වරට රන් පදක්කමක් දිනාගැනීමට සමත් වූ පැරා ඔලිම්පික් උළෙල ලෙස එය ඉතිහාසයට එක්වීමත් විශේෂත්වයක්.**

# තැපැලේ සැමරුම

බිනූ දිලාරා ගමගේ










ලෝක තැපැල් දිනය 2024 ඔක්තෝබර් 09 දිනට යෙදී තිබෙනවා. මෙවර එහි තේමාව වන්නේ 'වසර 150ක සන්නිවේදන හැකියාව හරහා ලෝකය පුරා ජනතාව සවිබල ගන්වමු' යන්න.

ශ්‍රී ලංකාවේ තැපැල් සේවය ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් 1798 වසරේදී ආරම්භ වී තිබෙනවා. මෙරට තැපැල් සේවය මුල්වරට තැපැල් රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමත් තැපැල් ගාස්තු නියම කිරීමත් සිදුකර ඇත්තේ 1799 වසරේදී. 1857 වසරේදී මෙරට පළමු තැපැල් මුද්දරය වශයෙන් පැන්ස 06ක තැපැල් මුද්දරය නිකුත් කර තිබෙන්නේ වික්ටෝරියා රැජිනගේ උඩුකය රුව සහිත ව.

විශ්ව තැපැල් සංගමයයේ (Universal Postal Union) 150 වැනි සාංවත්සරික සැමරුම සහ ලෝක තැපැල් දිනය නිමිත්තෙන් ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව රුපියල් 50.00ක වටිනාකමින් යුතු සමරු මුද්දර 02ක් නිකුත් කර තිබෙනවා. ඔක්තෝබර් 08 සිට ඔක්තෝබර් 12 දක්වා තැපැල් මූලස්ථානයේදී මුද්දර ප්‍රදර්ශනයක් ද පැවැත්වෙන්නේ ලෝක තැපැල් දිනය නිමිත්තෙන්.

දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත
Department of Government Information
news.lk
GFU Sri Lanka
Rs. 100/-